# මාසික මහ සභා රැස්වීම - 2022/11/15 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/11/15 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 56 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

ගරු මන්ත්‍රීවරුන් 08 දෙනෙක් සභා ගර්භය තුල අසුන් ගෙන සිටි අතර තවත් ගරු මන්ත්‍රීවරුන් පිරිසක් සභාගර්භය වෙත නොපැමිණ සිටි බැවින් නියමිත වේලාවට ප්‍රමාණවත් පරිදි ගණපූරණය මහා සභාවට සහභාගී නොවීම මත සභාව පැයක කාලයක් කල්තබා ආරම්භ කිරීමට ගරු සභාපතිතුමිය තීරණය කරන ලදි.අනතුරුව පෙ.ව.11.00 ට ප්‍රමාණවත් ගණපූරණය සභාවට සහභාගී වීම මත රැස්වීමේ කටයුතු ආරම්භ විය.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තෑව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රී.එම් නිහාල් ඒකනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රී.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 56 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත්, මාධ්‍යවේදී සහෝදරයිනුත්, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

මේ අවස්ථාවේදී ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා, ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාරද සිරිවර්ධන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා යන මන්ත්‍රීවරුන් සභාවේ න්‍යාය පත්‍රයට පටහැනිව අදහස් පල කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා අදහස් පලකිරීමට නැගී සිටීමත් සමඟ ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාරද සිරිවර්ධන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ගාමිණී සෙනරත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා යන මන්ත්‍රීවරුන් සභා ගර්භයෙන් ඉවත්ව යන ලදි. එහිදී ගරු සභාපතිතුමිය විසින් තත්වය පැහැදිලි කරමින් පෙ.ව. 11.30 ට නැවතත් පැයක කාලයක් සඳහා සභාව කල් තබන ලදි. කල් තබන ලද සභාවේ කටයුතු නැවත 12:30 ට ආරම්භ විය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා සියළු දෙනාගෙන් අවසරයි. සභාව කල් තැබීමෙන් අනතුරුව යලි සභාව ආරම්භ කරනවා. න්‍යාය පත්‍රය අනුව ඉදිරි කටයුතු ඉටුකිරීමට අවස්ථාව ලබාගන්නවා.

**01. <u>2022/10/11 දින මහ සභා රැස්වීම් වාර්තාව සහ 2022.11.03 දින විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරිම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.10.11දින මහ සභා රැස්වීම් වාර්තාව සහ 2022.11.03 දින විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තා ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.10.11 දින පැවති VI වන සැසිවාරයේ 55 වන මහ සභා රැස්වීම් වාර්තාව සහ 2022.11.03 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව පහත සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන

i. 2022.10.11 දින මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 07 වන පිටුවේ අංක 03.7 - විහාරස්ථානයේ අළුත්වැඩියාවන්ට අමානෝ සීට් හෝ ඇස්බැස්ටෝස් සීට් ලබා ගැනීම සඳහා යන ලිපිය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ “ගමේ දායකයන් සමඟ සහසම්බන්ධ වෙලා විහාරස්ථානය දියුණු කරන්න මෙන්ම අනෙකුත් පොදු වැඩවලට සහයෝගය ලබා දෙන්න පුළුවන් ගුණයක් උන්වහන්සේ ළඟ තිබුනා. ඒ වගේම ඉඹුල්ගොඩ - තුඹුල්ල යා කරන මාර්ගය 1 ½ km ක් පමණ පිටුපසට වෙන්නට පුළුල් කරලා හදනවා. උන්වහන්සේ සතියකට දෙවරක් ජනතාව විහාරස්ථානයට කැඳවලා මේ මාර්ගය පිළිබඳව තොරතුරු අසා දැනගන්නවා. ඒ උන්වහන්සේගේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක්.” යන කොටස “ගමේ විහාරස්ථාන දියුණු කරන ගමන්ම අනෙකුත් පොදු වැඩවලට සහයෝගය ලබා දුන්නා. උන්වහන්සේ තුඹුල්ල - ඉඹුල්ගොඩ ගම් යා කරන මාර්ගයත්, ඉඹුල්ගොඩ සුසාන භූමිය හරහා සුසාන භූමි ප්‍රවේශ මාර්ගයත් සම්බන්ධ වෙනකොට කිසිම විරෝධතාවයක් නොමැතිව ගොවීන් පන්සලට කැඳවලා ඒ විරෝධතා සමනය කරලා කිසිම ප්‍රශ්නයක් ඇති නොවෙන්න මැදිහත්වෙලා මට සහයෝගය දුන්නා. ” ලෙස සංශෝධනය විය යුතුය
.

ii. 2022.11.03 දින විශේෂ මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 26 වන පිටුවේ අංක 05.1 - යෝජනාව යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ “වලිතන්ත්‍රි මහත්තයා හිටියේ.” යන කොටස “වඩුතන්ත්‍රි මහත්තයා හිටියේ.” ලෙස සංශෝධනය විය යුතුය.

iii. 2022.11.03 දින විශේෂ මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 27 වන පිටුවේ අංක 05.1 - යෝජනාව යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ“ඊයෙ හත්වෙනි පැය බැලුවනම් උදේ හිටිය අපේ ප්‍රාදේශීය සභාවේ අපේ විපක්ෂ කණ්ඩායම තිබුනු වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා.” යන කොටස “ඊයෙ හත්වෙනි පැය බැලුවනම් උදේ හිටිය අපේ ප්‍රාදේශීය සභාවේ අපේ විවාද කණ්ඩායමේ හිටපු වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා.” ලෙස සංශෝධනය විය යුතුය.

iv. 2022.11.03 දින විශේෂ මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 07 වන පිටුවේ අංක 05.1 - යෝජනාව යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනියගේ ප්‍රකාශයේ “මම හිතනවා මේක අවස්ථාව කියල මොකද මට මතකයි මම අවසාන වශයෙන් මුල සිද්ධ වුණ හැමදේම අත ඇරල ඔබතුමියගෙ නිවසට ප්‍රහාර එල්ල වුන අවස්ථාවේ එම ස්ථානයට සහභාගී වුනා.” යන කොටස “මම හිතනවා මේක අවස්ථාව කියල, මොකද මට මතකයි මම අවසාන වශයෙන් මුල සිද්ධ වුණ හැමදේම අත ඇරලා ඔබතුමියගේ නිවසට ප්‍රහාර එල්ල වුනාට පසුව තිබුණු කම්ටුවට මම සහභාගී වුනා.” ලෙස සංශෝධනය විය යුතුය.

ඒ අනුව ඉහත සංශෝධන වලට යටත්ව 2022.10.11 දින පැවති VI වන සැසිවාරයේ 55 වන මහ සභා රැස්වීම් වාර්තාව සහ 2022.11.03 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.1 සමෘද්ධි බැංකුව ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම.

බෝයවලාන සමෘද්ධි කලාපය තුල වසම් 13 නියෝජනය වන අතර විශාල ප්‍රතිලාභීන් පිරිසක් ගණුදෙනු කටයුතු සඳහා බැංකු පරිශ්‍රයට පැමිණෙන බවත් දැනට කුලී පදනම මත තැනින් තැනට බැංකුව රැගෙන යන නිසා ප්‍රතිලාභීන් මෙන්ම නිලධාරීන්ද දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවත් එයට මූලික හේතුව වනුයේ ඔවුන් සතුව ස්ථිර ස්ථානයක් නොමැතිකම බවත් විටින් විට ඉල්ලීම් කලද එය මේ වන තෙක් අසාර්ථක වී ඇති බවත් එසේ හෙයින් ප්‍රතිලාභීන් සහ නිලධාරීන් දැඩි අපහසුතාවයකට පත්වී ඇති බැවින් බෝයවලාන කලාපයට ස්ථාවර සමෘද්ධි බැංකුවක් සාදා නිම කර ගැනීමට හැකි බෝයවලාන ප්‍රජාමූල ශාලාව පිහිටි භූමියෙන් පර්චස් 15 ක පමණ ඉඩමක් ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරමින් කළමණාකරු, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව, හුම්බුළුව, අලව්ව විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මීට කලින් සමෘද්ධි නිලධාරීතුමිය ඉල්ලීමක් කළා 6 කණුව ට්‍රයිස්ටාර් එක ඉස්සරහ ඉඩමේ ගොඩනැගිල්ලක් හදන්න. නමුත් ඒකට අවස්ථාවක් ලැබුනේ නැහැ. බෝයවලාන නගරයේ අක්කරයක භූමි ප්‍රමාණයක් ඉතුරු කරලා තිබුණා පොදු පහසුකම් යටතට. ප්‍රජා මූල ශාලාව පිහිටි ඉඩම යනු ප්‍රාදේශීය සභාවේ පුස්තකාලය පිහිටි ඉඩම. අපට ඒක දෙන්න බෑ. එහෙමනම් මේක පළාත් පාලන ඇමතිතුමාට යවලා ලොකු ක්‍රියාදාමයකින් එන්න වෙන්නේ. බැංකු ගත්තහම ලංකා බැංකුව, මහජන බැංකුව, සමෘද්ධි බැංකුව මේ හැම එකක්ම සල්ලි තිබෙන ආයතන. මම හිතන්නේ මේ වගේ ඒවට ගන්නවා නම් කැප්පිටිවලාන හන්දියේ තිබෙන හිස් ඉඩම ගත්තනම් හරි. මේ සභාව සතු පුස්තකාලයත් එක්ක තිබෙන භූමිය ඉදිරියේදී තව ටිකක් වැඩි දියුණු කරන්න, පුස්තකාලය ලොකු කරන්න, බෝයවලාන නගරය පුළුල් කිරීමේ ක්‍රියාදාමයට යන්න අවශ්‍යයි. සමෘද්ධිලාභීන් සම්බන්ධව ගොඩනැගිල්ලක් හදනවා නම් ඒකට අපේ විරෝධතාවයක් නෑ. නමුත් සභාව සතු දේපලක් අන්සතු කරනවා නම් බොහොම කල්පනාවෙන් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මේ ඉල්ලීම සාධාරණ ඉල්ලීමක් හැටියට පළමුවෙන්ම කිව යුතුයි. මොකද දැනට සමෘද්ධිලාභීන් පත්වෙලා තිබෙන ඉරණම. ඔවුන්ට පොඩි සහනයක් ගන්න විශාල වෙහෙසක් දරන්න වෙලා තිබෙනවා පමණක් නොවෙයි ඔවුන්ට ත්‍රීවිල් කුලිය ගෙවාගෙන ඇවිත් ආපහු ගෙදර ගියාම ඇති දෙයක් නැති තත්වයට ඔවුන් පත් වෙලා තිබෙනවා. ඒකයි යථාර්ථය. මීට පෙර එකසිය ගානක් අත්සන් කරලා ප්‍රාදේශීය ලේකම්තුමියට යවපු ලිපියේ පිටපතක් මටත් ලබා දුන්නා. නමුත් ඒ ගත්ත ක්‍රියාමාර්ගයක් පිළිබඳව නැහැ. මෙය මූලිකව කතා කළාම නගරයේ පිටුපස්සේ තිබුණා පොදු ඉඩමක්. ඔය ජනපදය බෙදනකොට යූ.බී. විජේකෝන්මැතිතුමා මැදිහත්වෙලා ඒ කාලයේ බලයට පදිංචි වෙච්ච ඉඩමක් නැවත ස්වර්ණභූමි ඔප්පු යටතේ කච්චේරියක් තියලා ඉඩම ලබා දුන්නා.ඒ ඉඩමෙන් වෙන් කෙරුවා අක්කර 1½ විතර පොදු කටයුතු සඳහා. ඒක LRD එක මැදිහත් වෙලා තමයි කලේ. පසු කාලීනව පොදු කටයුතු සඳහා වෙන් කරපු ඉඩම එතකොට ඔප්පු දීලා තිබුණෙ නෑ. දේශපාලන හිතවත්කම් මත කෙනෙකුට ලබා දුන්නා. ඇත්ත තත්ත්වය මේක. ඒකට ක්‍රම වෙනස් කරලා තිබුණා. ඔප්පු දීලා තිබුණෙ නැති නිසා ඉඩම් කොමිෂන් සභාවෙන් නැවත හැම ඉඩමක්ම කැඩුවා. කඩලා ගල් දැම්මා. දාලා සහන

මුදලට විකුනපු හැටියට මේ ඉඩම් කොටසත් අර හිතවතාට දුන්නා. ඉඩම් ගත්තු අයටත් සිද්ධ වුණා සල්ලි දීල ඔප්පුව ලබා ගන්න අර කොටස වෙනුවෙන්. ඔප්පු ලැබුනේ නැති තවත් පිරිසක් අදටත් ඉන්නවා. එහෙම තියෙද්දී තමයි සමෘද්ධි වැඩපිළිවෙළ තුල ඔය ස්ථානයේ ගොඩනැගිල්ලක් හදලා තිබුණා සමිති ශාලාවක් එක්ක. ඒකේ තමයි අවුරුදු ගාණක් සමෘද්ධිලාභීන්ගේ බැංකු කටයුතු සිද්ධ කළේ. හේතුව මොකක්ද දන්නේ නෑ. එතන අත්හැරලා කළුආරච්චි ව්‍යාපාරිකතුමාගේ ගොඩනැගිල්ලක් කුලියට ගත්තා ගිරිඋල්ල මාර්ගයට නගරයට සම්බන්ධ වෙන්න. ඒකෙ කුලිය වැඩියි කියන ප්‍රශ්නය මත තමයි තැනක් නිර්මාණය කරගන්න මේ සමෘද්ධිනිලධාරීන් උත්සාහය ගන්නේ. ඒ නිසා මේ ඉල්ලීම අසාධාරණයක් හැටියට දකින්නේ නෑ. නමුත් ප්‍රශ්නයක් තියෙනවා. වෙන්කරපු ඉඩමේ ඇයි හදන්න බැරි කියලා ඇහුවම ඒ නිලධාරීන් කීවා ඉඩම් කොමිෂන් එකෙන් අවසර දෙන්නේ නෑ කියලා. මම කීවා ඒක සභාව මැදිහත්වෙලා අපි ඒ අවසරය ලබා දෙන්නම් කියලා. ඔබතුමියගෙන් උපදෙස් අරගෙන ඒ යෝජනාව හැදුවා. නමුත් ඒක දැම්මෙ නෑ. ඒ නිලධාරීන්ගෙන්ම මට දැනගන්න ලැබුණා ඔබතුමියට මේ යෝජනාව යොමු කරලා තිබෙනවා. ඔබතුමිය මෙවර සභාවට දානවා. සභාවට දාපුවම ඒ පිළිබඳව කතා කරලා ලබා දෙන්න කියලා තමයි කීවේ. ඒ නිසා මම ඒ යෝජනාව දැම්මෙ නෑ. මේ කාරණය පිළිබඳව ගරු සභාව ගන්න තීරණය පිළිබඳ විමසලා අවබෝධයෙන් දැනගෙන ඒ යෝජනාව මතු සභාවකට දාන්න සැලසුම් කරලා ඒක තමයි අදහස් කරගෙන හිටියේ. ඒ ප්‍රදේශයේ ඉන්න රත්නායක සභාපතිතුමා, සභාපති වෙලා ඉන්නකොට වෙළෙඳ ව්‍යාපාරික අය සභාවෙන් ඉල්ලුවා ඔය සභා ඉඩමෙන් ශාලාවකට ගොඩනැගිල්ලක්. එතුමත් බොහොම මැදිහත් වෙලා අපි මේක සභා සම්මත කරලා යොමු කළා. නමුත් පිළිතුර වුණේ ලබා දෙන්න බැහැ කියන එක. පෙර යථාර්ථයක් මම මතක් කෙරුවේ. නමුත් දැන් පුළුවන්කමක් තිබෙනවා නම් අසරණභාවයට පත්වුන සමෘද්ධිලාභීන් පිළිබඳ මේ සභාව අවධානය යොමු කරලා ඉඩම් කොටසක් ලබා දෙන්න ඒ පිළිබඳ මම සතුටු වෙනවා. පනතේ එහෙම පුළුවන්කමක් තිබෙනවා නම් මම ඒ ප්‍රදේශයේ නියෝජිතයා හැටියට අසරණ ජනතාව පත්වෙලා තිබෙන අපහසුතාවය පිළිබදව ඒක මගහරවාගන්න මගෙ සහයෝගය ලබා දෙනවා. ඒ පිළිබඳ තීරණයක් ලබා දෙන්න කියලා මම ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, උරුලැමුල්ලෙන් පටන්ගත්තාම බෝයවලාන නගරය කියන්නේ අපේ බල ප්‍රදේශයේ සීමාව. මගේ යෝජනාව හා අදහස වෙන්නේ ජනතාවට සහනයක් වෙන්න නම් ප්‍රදේශයේ මධ්‍යස්ථ ස්ථානයක මේ බැංකුව ඉදිකළොත් ජනතාවට ලොකු සහනයක් වෙනවා. අපේ කැප්පිටිවලාන උප කාර්යාලය ආසන්නයේ මේ වෙනකොට තියෙනවා කම්බි ගහල මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩමක්. ඒක කාලයක් තිස්සේ පාලනය කළේ අපේ සභාව. RDA එකේ කාපට් දාන කොන්ක්‍රීට් ගල් එහෙම ගෙනත් දාලා තිබුණා. ඒකත් දැන් නෑ. අවුරුදු ගානකට පස්සේ තමයි මේක අලව්ව ප්‍රාදේශීය සභාව අත්පත් කරගනී කියලා RDA එකෙන් කම්බි ගහලා තියෙන්නේ.ඒ වගේම හුම්බුළුව ප්‍රදේශයේ පාසල ඉදිරිපිට ග්‍රාම සංවර්ධන සමිති ශාලාව පිහිටි ස්ථානයේ ඒ භූමියේ ඉඩ තිබෙනවා. නව ගොඩනැගිල්ලක් පිටුපස්සෙන් ඉදිකළා. ඒ ඉදිරිපස තිබෙන පැරණි ගොඩනැගිල්ල කොටසක් ග්‍රාම සංවර්ධන සමිතියේ ඉල්ලීම මත සභාපතිතුමියගෙන් මම ඉල්ලීමක් කරලා ඒකට JCB යන්ත්‍රය දීලා ඒ කොටස කඩා ඉවත් කළා. ඒ භූමියේ දැන් ඉඩ තිබෙනවා. තව කොටසක් කඩා ඉවත් කරන්න තිබෙනවා. ඒකත් ප්‍රාදේශීය ලේකම්තුමියගේ අවසරය අරගෙන කඩා ඉවත් කළොත් එතැන බැංකුවක් හදන්න පුළුවන්. එවිට මැද ස්ථානයකට එනවා බැංකුව. එනකොට සියලුම ප්‍රදේශවල ජනතාවට මැද ස්ථානයක් තමයි ඔය ස්ථානය. ඒ නිසා මා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරලා එහෙම නැතිනම් අපි සමුපකාරය සතු හුම්බුළුව සමුපකාරය තිබෙන ඉඩම අක්කර 2ක 3ක විතර විශාල ඉඩමක්. ඒ ඉඩම පිටිපස්සේ සම්පූර්ණයෙන්ම කැලේ වැහිලා ඒක වසරෙන් වසර බදුදීලා තිබුණේ. මේ භූමි තිබෙනවා. ඒ සම්බන්ධව අවධානය යොමු කරලා අපි අසරණ ජනතාවට ඒ සහනය ලබා ගන්න ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට විෂයභාර ඇමතිතුමාට හා

ජනාධිපතිතුමාට, අගමැතිතුමාට හා අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරලා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමිය ඇතුළු සියළු පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමාලාගේ සහයෝගය ලබා දීලා මේ කටයුත්ත කරලා දෙමු. සභාව සතු ඉඩම තුළින් දෙන්න නීති අනපනත්වල හැකියාවක් නැතිනම් අපට මුඩු ඉඩම් තිබෙනවා. ඒ ඉඩම් වලින් යම් කොටසක් ලබා දීලා මේ ජනතාවට අවශ්‍ය සේවය සපයා ගන්න අපි සැවොම එකතුවෙලා කටයුතු කරමු.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි ප්‍රාදේශීය සභාවක් හැටියට වර්තමානයේ අපි කවුරුත් කතා කරන්නේ ආදායම් උපයන්නේ අපි ආදායම් උපයන්නා මාර්ගයක් තමයි ඉඩම්. බෝයවලාන මේ කොටසේ අපි දැනටමත් ආදායම් උපයන ක්‍රම අඩුයි එතකොට පහුගිය රත්නායක සභාපතිතුමා ඉන්න කාලයේ ප්‍රජා ශාලාව ඇතුළු වෙළෙඳසැල් කීපයක් හදලා යම් ස්ථාවරයක් කරල තියෙනවා. ඒවගෙත් අද ආදායම් අහිමි වෙලා තිබෙන්නේ. එතකොට මේ ස්ථානයේ සමෘද්ධි ගොඩනැගිල්ලක් ලබා දීම තුළ අපට තිබෙන ගැටලුව තමයි මේ ඉල්ලීමක් කරලා තිබෙන්නේ කළමනාකාරතුමියක්. එතකොට මේකේ ප්‍රධාන වගකිවයුත්තා ප්‍රාදේශීය ලේකම්තුමිය. එතුමිය හරහා තමයි ඔය සියලුම සංවර්ධන නිලධාරී සමෘද්ධි නිලධාරී සැවොම පාලන වෙන්නෙ එතුමියට තිබුණා මේ ඉල්ලීම් කරන්න. එතුමිය දැන් ඉල්ලන්නෙ නෑ. මොකද බෝයවලාන පොලිසිය හදපු හැටි දන්නවනේ. ඉහළ මට්ටමෙන් එන්න තිබෙන ඉල්ලීම තමයි මේ පහල මට්ටමෙන් එන්නේ. දෙන්න එපා කියලා කවුරුවත් මන්ත්‍රීවරු කියන්නේ නෑ. ඒ වුණත් අපට දැන් තිබෙන ආදායම් මාර්ග අඩුයි. අඩුම තරමේ බෝයවලාන ඔය පර්චස් 15 කඩ කාමර කීපයක් ගහලා බදු දීලා හරි ආදායමක් උපයන්න පුළුවන්. එහෙම නැත්නම් අලුත් ක්‍රමයක් හැටියට අපිට පුළුවන් ඔතන හොඳ හොටෙල් එකක් දාලා සභාවෙන් ම පුළුවන් ඕන්නම් යන්න හොඳ වැඩපිළිවෙළක් තිබෙනවා නම්. එතකොට සම්පූර්ණ ආදායම අපිට. සේවකයොත් දාන්න පුළුවන් සභාවෙන්ම අලුතෙන් පත් කරගෙන. එහෙම කළොත් සේවක පිරිසත් නඩත්තු වෙනවා. ඒ වගේම ඒ ව්‍යාපාරික ස්ථානයෙන් ලැබෙන සම්පූර්ණ ආදායම සභාවට එනවා. ඒ ලැබෙන ලාභය අපට ජනතාවට බෙදලා දෙන්න පුළුවන්. මේකෙන් අපට කිසිම ආදායමක් එන්නේ නෑ. මේක සුහද හිතවත් කම් වලට අපට දෙන්න පුළුවන්. එහෙම නැත්නම් අපේ සුහදත්වයට දෙන්න පුළුවන්. එහෙම දුන්නයි කියලා අපට සංවර්ධනයට ලොකු දායකත්වයක් ඇති වෙන්නේ නෑ. ඒ නිසා මම හිතනවා එතුමියලා දැනුවත් කරන්න වෙනත් ස්ථානයක් රංජිත් මන්ත්‍රීතුමා කීවා වගේ බෝයවලාන කියන්නේ අලච්ච කෙළවර. මධ්‍යස්ථ ප්‍රදේශයක් තමා එතුමා කිව්වේ කැප්පිටිවලාන. ඒ වගේ තැනක් වෙන්න ඕනෑ. ඒක තෝරා ගැනීමේ හැකියාවක් තියෙන්න ඕනෑ සමෘද්ධි නිලධාරීන්ට, කළමනාකාරිනියන්ට. අහිංසක මිනිස්සුන්ට පයින් යන්න වෙනවා බස් වල යන්න වෙනවා. එහෙම නොවෙයි කේන්ද්‍රස්ථානයක් වෙන තැනක් තමා තෝරාගන්න ඕනෑ. මම හිතන්නේ මේක ආපසු බලලා වෙනත් ස්ථානයක ඉඩම් කැබැල්ලක් සොයා ගන්න පුළුවන්ද බලලා ප්‍රාදේශීය ලේකම්තුමියටත් මේ ගැන අවධානය යොමු කරලා නැවත සාකච්ඡා කරලා දෙනවද නැද්ද කියලා තීරණයකට යනව මිසක් එක පාරටම හා කියලා අපට දෙන්න බැහැයි කියන එකයි මගේ පුද්ගලික මතය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

රංජිත් මන්ත්‍රීතුමා යෝජනා කළේ RDA එකේ ඉඩමක් පිළිබඳව, අපි ඒ ගැන සලකලා බලමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, RDA එකේ ඉඩම අපට ගන්න බැරි වෙයි. නගරයේ පිටුපස තිබෙන ඉඩම අපට ගැටළුවක් නැති වෙයි. විශේෂයෙන්ම ඵලදායි අදහසක් ඉදිරිපත් කෙරුව අපේ උප සභාපතිතුමා. අපට පුළුවන්කම තිබෙනවා නම් අපේ ඉඩමේ ගොඩනැගිල්ලක් හදලා අපට ආදායමක් එන විදිහට ගොඩනැගිල්ලේ භාරය අපට තියාගෙන දෙන්න පුළුවන් ක්‍රමවේදයක් තියෙනවා නම් වඩාත් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ යෝජනාව සම්බන්ධව වටිනා අදහස් ටිකක් අපේ මන්ත්‍රීවරු ඉදිරිපත් කලා. ඔය කියන යෝජනා ක්‍රියාත්මක කරන්න මම හිතන්නේ අපහසුවක් නෑ. අපේ ප්‍රාදේශීය සභාවේ ඉඩම් අපිට අත්පත් කර දීමේ හැකියාවක් තියෙනවා බදු පදනම යටතේ. ඒ බදු පදනම යටතේ යනවනම් උප සභාපතිතුමා කිව්ව කාරණාව අපිට ක්‍රියාත්මක කරන්න පුළුවන්. එක්කො ජයතිලක මන්ත්‍රිතුමා කිව්ව වගේ ඉඩම බදු දෙන්න පුළුවන්. එහෙම නැත්නම් අපි ගොඩනැගිල්ල හදලා බදු දීමේ ක්‍රමයකට යන්න පුළුවන්. අපි තව කාරණාවක් මතක් කරන්න ඕන. සමෘද්ධි බැංකුව කියලා කියන්නේ ආදායම් උත්පාදනය කරන තැනක්. සහනදායිම තැනක් නොවෙයි. සමෘද්ධි බැංකුව අපේ ප්‍රතිලාභීන්ගේ සල්ලි අරගෙන පොලියට දීල, ණය දීල විශාල විදිහට ආදායම් හොයන තැනක්. අද විශාල වත්කමක් තියෙනවා මේ සමෘද්ධි බැංකු සතුව. ලාභ උපයන ආයතනයක් හින්දා අපි සමෘද්ධි බැංකුව කියන කෝණයේ ම බලන් නැතිව මේ උප සභාපති තුමා ජයතිලක මැතිතුමා ගෙනාපු යෝජනා ඇතුලේ අපිට නිත්‍යානුකූලව ඉඩම පවරා දෙන්න ප්‍රතිපාදන නැත්නම් බදු ලබා දෙන ක්‍රියාවලියට නම් යන්නත් තිබෙන්නේ මේ ක්‍රියා ක්‍රියාත්මක කරන්න අපහසුතාවයක් නැති වෙයි කියලා මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ලංකාව මේ වෙනකොට විශාල වශයෙන් ගැටලු රාශියකට මුහුණ පාලා තිබෙනවා. මීට ඉස්සරලා සමෘද්ධි දීමනාව ලබාගන්න බෝයවලාන නගර ප්‍රදේශයට ආපු ජනතාව එතනින් ඒ මුදල අරගෙන ඒ මුදලින් තමන්ට තිබෙන ලයිට් බිල, වතුර බිල, දුරකථන බිල්පත බැංකුව ගෙවලා ඒ ස්ථානයෙන් ම ඒ කටයුතු කරන්න හැකියාව තිබුණා. මේ වෙනකොට හුම්බුලුව ප්‍රදේශයට ඒ බැංකුව රැගෙන ගිය නිසා විශාල වශයෙන් ගැටලු රාශියකට මුහුණ පාලා තිබෙනවා. කලින් සඳහන් කළ දේ පහසුකම් සියල්ල ඇහිරිලා මුදල් ලබා ගත්තට පස්සේ නැවතත් ඒ මුදල් අරගෙන බැංකුවට දාන්න ඕනෑ. බිල් ගෙවන්න ඕන නම් නැවත ත්‍රීවිලරයකට මුදල් වියදම් කරගෙන යා යුතු තත්ත්වයක් තමයි උද්ගත වෙලා තිබෙන්නේ. අපට සභාව සතු වත්කම් වලින් හෝ වෙනත් ආකාරයකින් ගොඩනැගිල්ල හදලා බෝයවලාන ප්‍රදේශයට බැංකු පද්ධතිය රැගෙන යාමට හැකියාවක් තිබෙනවා නම් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් අත්වෙනවා කියන එක මම ප්‍රකාශ කරනවා .

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඇත්ත වශයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි මේ ගැන වැඩි අවධානයක් යොමු කල යුත්තේ. බැංකු ගොඩනැගිල්ලක් හදන්න මුදල ලැබෙන පිළිවෙලක් ගැන නිශ්චිතව දැනුවත් වී ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් ලබා දීමේ ක්‍රමවේදය අනුගමනය කල යුතුයි. කෙසේ නමුත් අපේ බල ප්‍රදේශයේ ජනතාවට පහසුවක් වන විදියේ කටයුත්තක් සිද්ධ වෙනවා නම් අපි කමිටුවක් පත් කරලා ගැඹුරින් කරුණු කාරණා පිළිබඳ සොයා සාකච්ඡා කර මෙම ඉදිරිපත් කල ඉඩම් පිළිබද තීරණයක් ගනිමු.

ඒ අනුව මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කර තීරණයකට එළඹීම සුදුසු බවට තීරණය විය.

**03.2 <u>බෝයවලාන පොලිස් ස්ථානයේ පිහිටි ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දීම සම්බන්ධවයි.</u>**

බෝයවලාන පොලිස් ස්ථානය සඳහා වෙන් කර ඇති භූමිය හැර ඉතිරි භූමියෙන් ප්‍රවේශ මාර්ග සහිතව සේවා පියසක් ඉදි කිරීම සඳහා ඉඩ ලබාදිය හැකි බවත් නිල සෙවන සඳහා යෝජනා කර යවා ඇතත් 3/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව සියළු ව්‍යාපෘති නැවත දැනුම් දෙන තෙක් නතර වී ඇති බැවින් මේ වනතුරු එය ඉදිකිරීම පිළිබඳව වෙනත් නිශ්චිත පිළිතුරක් ලබා

දීමට නොහැකි බවත් පොලිස්පතිතුමන් විසින් ඉල්ලීම් කර ඇති බැවින් බෝයවලාන පොලිස් ස්ථානය පිහිටි ඉඩම් කොටස පොලිස් ස්ථානය වෙත පැවරීමට මහ සභා එකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් ප්‍රාදේශීය ලේකම්තුමිය, අලව්ව විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම මේක ගමේ ජනතාවට වෙන්වූ පොදු ඉඩමක් නැත්නම් පරාම්පරා ගාණකට තැනක් නැනේ. එතකොට අපි ග්‍රාම සංවර්ධන සමිති, ස්වෙච්ඡා සමිති 12 ක් අපි මේ සම්බන්ධව ලිපි යොමු කලා. මෙම ඉඩමෙන් කොටසක් පොදු කටයුතු සඳහා ලබාදෙන්න කියල. කිසිම පිළිතුරක් නෑ. ඊට පස්සෙ දෙවෙනි පාර මේ සභාවෙ මාත් කොට්ඨාශයේ ඉන්න සහෝදර මන්ත්‍රීතුමාත් අපි දෙන්න ඒකාබද්ධව යෝජනාවක් සභාවට ඉදිරිපත් කරල සියළු ගරු මන්ත්‍රීවරු ඒකමතිකව සභා සම්මත කරල ප්‍රාදේශීය ලේකම්තුමියට යොමුකළා. මේ සඳහා කොටසක් මැනුම් කරල වෙන්කරල දෙන්න කියල ඒ තුලින් අවධානය යොමු කෙරෙව්වා. අමාත්‍යාංශවලින් අවධානය යොමු කරන්න මෙතුමියගේ ඇහැ ඇරිලා නැහැ. ඇත්තෙන්ම පොලිසිය තියෙන්න ඕනෑ. පොලිසියට පහසුකම් දෙන්න විදිහක් නෑ ඉදිකිරීමකට අපේ අවසරය ලැබෙනකම්. පොලිස්පතිතුමත්, දෙපාර්තමේන්තුවත් අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. අපේ සේවා පියසට මුදල් වෙන් කරනවා කීවට තාම වෙන් කරල නැති වුනාට පොලිසියේ ගොඩනැගිල්ලට සමහර විට දෙපාර්තමේන්තුව හරහා මුදල් ඇවිල්ල ඇති. නමුත් ඒක විදයම් කරන්න නිත්‍යානුකූල අයිතියක් අද නැහැ. හේතුව ප්‍රධාන වශයෙන්ම මේ නිලධාරි තනතුර දරණ ප්‍රාදේශීය ලේකම්තුමිය මේ සභාව පළමුවෙන්ම දැනුවත් කරපු නැති එකේ ආනිසංශ. ඒක පැහැදිලිවම අපි සියලු දෙනාම දන්නවා. දැන් මේකට කරන්න දෙයක් නැහැ. දෙවෙනි වතාවට කියනවා මේ සියලු දෙනාම අපහසුතාවයට පත් වෙලා. පොලීසියට අපි අනිවාර්යෙන් උදව් කළ යුතුයි. අපිට පේනවා වැහි වෙලාවට එහෙම ඒ අය බොහොම අපහසුතාවයට පත් වෙලා ඉන්නවා. ඒ අය බොහොම සුහදව ගමේ ජනතාවත් එක්ක ඉන්නවා. බොහොම රැකවරණයක් ගමට නිතැතින්ම තියෙනවා. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. ඒ වගේම ඒ අඩුපාඩු සපුරාගන්න පුළුවන් උදවුවක් අපි ලබා දිය යුතුයි. මේකේ තියෙන්නේ පොඩි දෙයයි. දැන් දෙපාරක්ම මේ සභාවට යොමු කලා. මම හිතනවා ප්‍රාදේශීය ලේකම්තුමියට කියල මේ සමිති වලට ගම්වල ජනතාවට දැනගන්න අපිට ලිඛිතව එවන්න කියන්න මේ පර්චස් ප්‍රමාණය ඉදිරි කටුයතු සඳහා ගමේ පොදු කටයුතු වලට වෙන් කරල තියෙනවා කියල. ඒක කවදා හරි අපිට හදාගන්න බලාපොරොත්තුවක් තියෙනවා. ගමේ ජනතාව මේ නියෝජිතයේ ගැන වැරදි අවබෝධයක් දකින්නෑ. අපි දෙන්නෙක් ගමේ නියෝජිතයො හැටියට මේ පුංචි ආයතනය නියෝජනය කරනවා. දීර්ඝ කාලයක් ගමේ මිනිසුන්ට තියෙන ප්‍රශ්නයක් පරිම්පරා ගානකට පොදු ස්ථානයක් නැහැ. ඒ අහිමි කරන්න අපිට පුළුවන් කමක් නැහැ. අපිට බලාපොරොත්තුවක් හරි තියාගන්න මේ පර්චස් 20 අපිට වෙන් කරල තියෙනවා. ගමේ පොදු කටයුතු සඳහා සේවා පියස සඳහා කියල ලිඛිත දැනුම් දීමක් අපිට කරන්න කියල ඉල්ලා සිටිනවා. ඒ ලිපිය ලබාගත්තට පසු කවුරුවත් අකමැතිවෙන්නෙ නැහැ. අපි කැමතිත් නැහැ පොලිසිය තවත් අපහසුතාවයට පත් කරන්න.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම් තුමිය පසු කාලයේ කීවා ස්ථාන මාරු කරල යවන්න කියල. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්න නිලධාරින් පවා අපට පුද්ගලිකව කියලා තියනවා මෙයා යවන්න කියලා. එතුමිය හිතාගෙන ඇති එතුමිය හොදයි කියලා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම අය එතුමියට කැමති නෑ එතුමියගේ දුර්වල ක්‍රියාකාරකම් නිසා ඒවගේම මේ සභාව හැල්ලුවට ලක් කලා. පැහැදිලිවම එතුමිය ඉන්න මේ කාල පරිච්ඡේදයේ අපි ඒක පුන පුනා කිව්ව ඔය කමිටුවලදී. කෙසේ වෙතත් එතුමිය ඒ භාවිතාකල ක්‍රමවේදවල ප්‍රතිඵල තමයි දැන් බුක්ති විදින්නෙ. බෝයවලාන බල ප්‍රදේශයේ පොලිස් කොට්ඨාශයට අයත් ඉඩම පැවරීමට මහ සභාවෙ එකඟතාවය ලබා දෙන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සුසාන භූමිවල යම් යම්

අයිතිවාසිකම් අපිට භුක්ති විදින්න අවසරයක් දෙන්නැති ප්‍රමාදයක් තිබෙනවා. ඒ වගේම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලක් හදා ගන්න එහා පැත්තෙ තිබෙන ඉඩම ඒකෙන් එතුමියට යම් ගැටළුවක් තිබෙනවා. මේ සියල්ලටම අනුමැතිය දෙනවනම් අපි සභාව ඒකමතිකව එම ස්ථානය ලබාදීමට එකඟතාවය ලබා දෙනවා. එහෙම නැත්නම් අපිට මෙතෙක් එකඟතාවය දෙනව අපිට එයාගෙන් ලැබෙන දේවල්. පරමාඋල්ල ගහ සම්බන්ධව එකක් එතුමිය එදා තහංචි දාල කැලෑ දෙපාර්තමේන්තුව එක්ක සාකච්ඡා කරපු විපාකනෙ. නැත්නම් එදා මන්ත්‍රීවරු අපි ඔක්කොම එකතුවෙලා ඒකමතිකව කිව්වෙ මම වැඩ බලන වෙලේදි අපි ඔක්කොම එවෙලෙ යං කියල. ඒ ගහ අරන් පන්සලට දෙමු කියල. හැබැයි කැලෑ දෙපාර්තමේන්තුවෙ හොරු ටිකක් එකතු වෙලා ඒක නවත්තගෙන දැන් ගහ දිරනවා. එතකොට ඒකත් ප්‍රාදේශීය ලේකම්තුමිය තමයි නතර කලේ. ඒ ඉඩම ප්‍රාදේශීය සභාවේ. අද ඒ ගහත් නෑ. පන්සලටත් නෑ. ඒ වගේ තමයි මේවත්. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්නෙ අපිට අපේ තියන අයිතිවාසිකම් ටික මෙහාට භුක්ති විඳින්න ලිඛිතව අවසරයක් දෙනව නම් අපි මේ සභාවෙදි අනිවාර්යෙන්ම අපි අත උස්සලා ඒ බෝයවලානේ පොලිසියට එකඟතාවය පල කරනව කියල ලිපියක් යොමු කරන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

නිල පියස, සමෘද්ධි බැංකුව වැනි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පැවැත්වෙන විෂය කටයුතු සඳහා අවශ්‍ය භූමි ගැන වැඩි අවධානයක් යොමු විය යුත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින්. නමුත් ගරු මන්ත්‍රීතුමන්ලා කිසිදු භේදයක්න් තොරව එක් වී ජනතාවට පහසුවෙන් කටයුතු ඉටුකර ගැනීමට අවස්ථාව සලසා දීමටයි ඒ අය මේ ඉඩම පිළිබඳව ඉල්ලීමක් ඉදිරිපත් කලේ.

මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම පිළිබඳ ආරක්ෂක අමාත්‍යාංශයට, පොලීසියට, මුදල් අමාත්‍යාංශයට හා සමෘද්ධි අමාත්‍යාංශයට ලිපි ඉදිරිපත් කලාම ඉදිරි කටයුතු ගැන අපට පිළිතුරු ලැබුනා. ඒ ආකාරයට එම අය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසූ ලිපියට, මෙම ඉඩමේ කොටසක් පොලීසියට සහ පර්චස් 20 ප්‍රමාණයක් පිවිසුම් මාර්ගය සමඟ පොදු කටයුතු වලට වෙන් කරන ලෙස මිනුම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති බවටත් මිනුම් කටයුතු අවසන් වූ වහාම අදාල ක්‍රියාමාර්ග ගන්නා බවත් සඳහන් 2022.07.22 දිනැතිව ලිපියක් ලැබුනා. DIVAL/LAND/1/4 අංක දරණ 2022.10.19 දිනැති ලිපියෙන් ඉල්ලා සිටින්නේ 3/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව ව්‍යාපෘති නවතා ඇති බැවින් පොලීසියට අයත් භූමියට එකඟතාවය ලබා දෙන ලෙසයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කඩිනමින් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. සභාවේ සියළු දෙනාගේ ඒකමතික තීරණය වුනේ පොදු කටයුතු සඳහා ගොඩනැගිල්ල පසුවට හැදුවත් භූමිය මැනුම් කර වෙන් කල යුතු බවයි. එම තීරණය දැනුම් දීමට කටයුතු කරමු.

ඒ අනුව බෝයවලාන පොලීසිය ස්ථානගත කරන තෙක් ගම්වාසීන් විසින් පොදු කටයුතු සඳහා භාවිතා කළ එහෙත් දැනට බෝයවලාන පොලිසිය ස්ථානගත කර ඇති ඉඩමෙන් ගම්වාසීන්ට පොදු කටයුතු සඳහා භූමි ප්‍රමාණයක් මැනුම් කර වෙන්කරන තෙක් ඉහත කාර්ය සඳහා එකඟතාවය පල කළ නොහැකි බවට සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.3<u>මිරිහෙළිය පොදු සුසාන භූමියේ කපා දමා ඇති තේක්ක දැව කඳන් මිලදී ගැනීම සඳහා අවසර ලබා ගැනීම.</u>**

අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, 1002 මිරිහෙළිය ග්‍රාම නිලධාරී වසමේ,මිරිහෙළිය පොදු සුසාන භූමියේ කපා දමා ඇති දිරාපත් වෙමින් පවතින තේක්ක ගසක දැව කඳන් අලව්ව ප්‍රාදේශීය ලේකම්තුමියගේ හා රාජ්‍ය දැව සංස්ථාවේ අවසර

ලබාගෙන මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබන බවත් මෙම පොදු සුසාන භූමිය අලව්ව ප්‍රාදේශීය සභාව අයත් සුසාන භූමියක් බැවින් ඒ සඳහා අවශ්‍ය අවසරය ප්‍රාදේශීය සභාව මගින් ලබා දීමට කටයුතු කරදෙන ලෙසට ඉල්ලීමක් කරමින් ගල්වාරම, අලව්ව ලිපිනයේ ජේ.ඒ. කිශිල මධුමාල් ජයතුංග යන අය විසින් ඉදිරිපත්කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මේ ලිපියේ කියලා තිබෙන දේ හා ඉල්ලීම අනුව පැහැදිලි වෙනවා මේක මේ පුද්ගලයෙක්ගේ අදහසක් නොවෙයි කියලා. ඒත් එක්කම තේක්ක ගහ පන්සලට ලබාදෙන්න මහ සභාවම එකඟ වෙලා ඒක ඉල්ලුම් කරලා ජනාධිපතිතුමා දක්වා ලිපි ගිහිල්ලා ජනාධිපති ලේකම්, දිස්ත්‍රික් ලේකම්, වන සංරක්ෂණයටත් අවවාදාත්මක ලිපියක් යොමු කරලා තිබුණා මේ වගේ විහාරස්ථානයකට ඉල්ලන ඉල්ලීමක් නිසා මේක වහාම ලබාදීමට කටයුතු කරන්න කියලා. වන සංරක්ෂණ එකෙනුත් ලිපි කුරුණෑගලට ලැබී එතනින් දිස්ත්‍රික් ලේකම් ලඟටත් ගිහිල්ලා තිබෙන අතරෙදි තමයි මේ වැඩකටයුතු රටේ පහුගිය වාතාවරණය යටතේ නතර වුනේ. මේ ලිපිය රැගෙන, ලිපිය ඉදිරිපත් කල පුද්ගලයා මාව මුනගැහෙන්න සභාවට ආවම, මම කීවා මුළු සභාවම ඒකමතික තීරණයක් ගෙන තිබෙනවා ගහ පන්සලට දීමට. ඒ වගේම හිටපු සභාපතිතුමන්ලා දෙදෙනාමත් ගොඩක් මහන්සි වෙලා තිබුනා විහාරස්ථානයට ගහ ලබා දීමට. මම ආවට පස්සේ ජනාධිපතිතුමාගෙන් පටන්ගෙන දිස්ත්‍රික් ලේකම්තුමා දක්වා මේ ගහ විහාරස්ථානයට දෙන තැනට කටයුතු කෙරිලා තිබෙනවා. ගරුතර ස්වාමීන් වහන්සේ දුරකතනයෙන් කතා කලා, මෙලෙස ගහ ඉල්ලුම්කරුට ලබා දීමට. ගරුතර ස්වාමීන් වහන්සේගේත්, දායක සභාවේත් ඉල්ලීම මත අප ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රීතුමන්ලා ඒකමතිකව විහාරස්ථානයට ගහ ලබාදීමට ගත් තීරණය මෙතරම් මහන්සි වෙලා මේ දුරට ආවට පස්සේ හිතුමතේට පුද්ගලයෙකුට දිය නොහැකි බවත්, සභාවේ ගත් තීරණයේ බලවත් භාවයත් පැහැදිලි කර දුන්නා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ තේක්ක ගහ වට අඩි 15 කින් එහා ගහක්. සාමාන්‍යයෙන් දළ වටිනාකම ලක්ෂ 10න් උඩ. අපිට ආරංචි වුනු විදියට දැව සංස්ථාවේ නිලධාරියා ඒ වගේ උස ගස් වලට හරි ආසයිලු. මේ සභාවේ අපට තියෙන අයිතිවාසිකම් උල්ලංඝනය කරලා ප්‍රාදේශීය ලේකම්තුමිය තීන්දු තීරණ අරගෙන ගහ කපලා තියෙන්නෙ. මේ ඉල්ලීම කලේ පන්සලේ හතර පේරුවේ දායකයෝ. දායකයො තමයි කිව්වේ මේ ගහ පටවන්න දැන් වාහනයක් එනවා මේක සභාවෙන් නවත්වන්න කියලා. දැන් ඔය පුද්ගලයා එන්නේ ගහ ගන්න නෙවෙයි. ගහ කපපු පුද්ගලයට කතා කරල ඇහුවම කැපුම් කුලිය 99,000.00 ක් කියනවා. කීයද ඔයාගේ ගාන කියලා මගේ ගාන නම් 49,000.00 යි කීවා. ඒ ගහ කපලා කුට්ටි කරලා ට්‍රැක්ටරෙන් ගෙනත් දාන්නත් එයාගේ ගාන. 50,000.00 ක් නිලධාරීන්ට කොමිෂන් එක. එතනයි ප්‍රශ්නය තියෙන්නෙ. විශේෂයෙන්ම හාමුදුරුවන්ට එපා නම් මේ සභාවේ මෙතුමා වැඩ බලන සභාපතිවරයා විදිහට කටයුතු කරද්දී ඒකච්ඡන්දයෙන් අපි දීපු යෝජනාවක් තිබෙනවා ගහ පන්සලට බැරිනම් සභාවට කියලා සභාවට ගහ ගේන්න. ඉඩම අයිති අපිට නම් අපේ ඉඩමෙ ගහක්කපපුවාම අපි කාගෙන්වත් අහන්න ඕනද ගහ ගැන. ගහ ලක්ෂ 10 ක් විතර වටිනවා. එක ලෑල්ලක් ඉරන්න පුළුවන් අඩි 3 ක් 4 ක් පළල හිටින්න. ගල්වාරම රජ මහා විහාරය කියන්නේ අනාදිමත් කාලයක ඉඳලා තිබෙන පන්සලක් නිසා තමයි අපි පන්සලට මේක දෙන්න එකඟ වුණේ. මේ ගහ පන්සලේ හාමුදුරුවෝ එපා කියනවනම් මට එක දවසක් හාමුදුරුවෝ කතා කරලා කිව්වා, ඔයාලා හරියට මහන්සි වුනා හිටපු සභාපතිතුමත් මහන්සි වුනා, අනේ මහන්සි වුනාට වැඩක් නැහැනෙ, මේ ගහ දෙන්නෙ නෑ නේද කියලා. මම හාමුදුරුවන්ට කිව්වා අපේ 28 දෙනාම ඒකච්ඡන්දයෙන් සම්මත කරලා තිබෙන්නේකියලා. කොහෙවත් ඉන්න නිලධාරීන් හින්දා සභාව හෑල්ලු වෙන දෙන්න බෑ. එක වතාවක් සුසාන භූමිවලට අත ගැහුවා. ඔක්කොම කරලා ඉවර පොලිසිය හැදුවා. ප්‍රාදේශීය ලේකම්වරු ඉස්සර ඔහොම හැසිරුනේ නැහැ. මේකට අපි මහජන නියෝජිතයෝ හැටියට ගත්ත තීන්දුවක් තිබෙනවා.ඒ තීන්දුවට පිටින් මේක කිසිදු පුද්ගලයෙකුට

විකිණීමට කවුරුවත් එකඟ වෙන්නේ නැහැ. හාමුදුරුවන්ට අවශ්‍ය නැත්නම් ඒක මේ සභාවට ගෙනල්ලා තීරණයක් ගැනීම සම්බන්ධව අපේ විරෝධතාවයක් නෑ. හාමුදුරුවෝ ලිඛිතව දෙන්න ඕන දායක සභාවේ ලිපියක් එක්ක. හාමුදුරුවන්ට තනියම තීරණ ගන්න බෑ.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එදා මේ සම්බන්ධව මන්ත්‍රීවරු 28 දෙනාම බලවත් කැප කිරීමක් කලා.ප්‍රාදේශීය සභාව මේ ගහ ගේන්න. මොකද කැලෑ දෙපාර්තමේන්තුවෙන් මේක හිරකරනවා. අරුණ මන්ත්‍රීතුමා කිව්වා කැලෑ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හොරෙක් කියලා. ඒ ගහ දැන් දිරලා කියනවා. එවෙලේ පන්සලට දුන්නා නම් ඉවරයි. අපේ ගිවිසුම තිබෙන්නේ පන්සලේ හාමුදුරුවොත් එක්ක. හාමුදුරුවන්ට දෙනවද නැද්ද. දෙන්නැත්නම් විපක්ෂ නායකතුමා කිව්වා වගේ සභාවට කියන එකයි අපි කළ යුත්තේ. කාගෙන්වත් අවසර ගන්න ඕනේ නෑ. දැනට අපිට අමාත්‍යාංශ වලින් කියපු විදියට මේක අවසරය ඇවිත් තිබෙන්නේ සභාවට ඕන තීරණයකට යන්න. හාමුදුරුවොනේ ඉල්ලීම කළේ. එතකොට අපි එක ලබා දීමෙන් අපටත් පිනක් ලැබෙනවා. ඒකෙන් දහම් පාසලේ බංකු හදන්න පුළුවන්. විහාර මන්දිරයේ දොරවල්, ජනෙල් දාන්න පුළුවන්. ඒ මොනවා කළත් ඒක පුණ්‍ය කර්මයක්. ඒකට වෙන පුද්ගලයෝ මැදිහත් වීමෙනුයි මේක ප්‍රමාද වුණේ.දැන් එක එක පුද්ගලයෝ ඉල්ලීම් කළාට ඒක දෙන්න බෑ. මේක පුද්ගලික ඉල්ලීමක්. ඊට වඩා වැදගත් පන්සලේ හාමුදුරුවන්ගේ ඉල්ලීම. හාමුදුරුවන්ටත්, දායක සභාවටත් එපා නම් අපි මේ ගහ ගෙනල්ලා, විකුණලා මන්දපෝෂණයෙන් ඉන්න දරුවන්ට, ගැබිනි මාතාවන්ට පෝෂණ මළු ටිකක් ලබාදෙමු. එක කාටත් හොඳ කාරණයක්. එහෙම නැත්නම් අපේ ගොඩනැගිල්ලක් හදාගමු. අපි දිනයක් දාගෙන හාමුදුරුවන්ට ගහ එපා නම් මෙහෙට අරන් එමු. අපි ඔක්කොම යමු.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

දායක සභාවත් සමග කතා කරලා අපි මේ ගැන තීරණයක් ගනිමු.

ඒ අනුව ඉහත ඉල්ලීම සඳහා එකඟ විය නොහැකි බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**03.4 <u>මහජන ආධාර මත සංවර්ධනය කරනු ලබන පඹදෙනිය - කලල්පිටිය මාර්ගය.</u>**

පඹදෙණිය - කලල්පිටිය මාර්ගයේ පඹදෙණියේ සිට මීටර් 500 ක් පමණ දුර ප්‍රමාණයේ ඇතැම් කොටස් ඉතා අබලන්ව ඇති බැවින් ප්‍රදේශවාසීන්ගේ මූල්‍යමය දායකත්වයෙන් පිළිසකර කිරීමට තීරණය කර ඇති බවත්2022.12.03 හා 04 දිනවල මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී ගාමිණී බණ්ඩාර මහතාගේ අධීක්ෂණය යටතේ කොන්ක්‍රීට් දැමීමට යෝජිත බවත් එහි දළ ඇස්තමේන්තුව රු. 650,000.00 ක් බවත් දන්වමින් එම කාලය තුල දින 20 ක් පඹදෙණියේ සිට කෙහෙල්කොටුව කඩේ දක්වා කොටස මාර්ගය සම්පූර්ණයෙන් වසා දැමීම සඳහා අවසරය ඉල්ලා සිටින අතර මෙම මාර්ගයේ විශාල ප්‍රමාණයේ දැව කඳන් පටවා ගත් ලොරි රථ ගමන් කිරීම නිසා පාර ඉක්මනින් අබලන් වන බැවින් එය නතර කරවීමට පියවර ගන්නා මෙන් ද ඉල්ලීමක් කරමින් හෙට්ටිවත්ත, නුගවෙල, අලව්ව ලිපිනයේ ජී.වී.පී.යූ. මහානාම පතිරණ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මේ කටයුත්ත මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි මහතෙකු පමණක් නොවේ අපේ තාක්ෂණ නිලධාරි මහතාගේත් අධීක්ෂණය යටතේ කරන්න වෙනවා අපේ ප්‍රාදේශීය සභා මාර්ගයක් නිසා. රටේ තිබෙන ආර්ථික අසීරුතාවය තේරුම්ගත් මෙම ජනතාව එකතුවෙලා ඉතාම වටිනා වැඩක් කරන්න සූදානම් කරලා තිබෙන්නේ. එය ඉතාමත් වටිනවා. ඒ පිළිබඳ අපිට දිය හැකි සහයෝගය දිය යුතු බව යෝජනා කරමින් ඒ අයට මගේ ගෞරවය පුද කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ඉල්ලා සිටින දේ ලබා දෙන්න කියලා මම පළමුවෙන්ම යෝජනා කරනවා. මේ යෝජනාව මේකේ තිබෙනවා දැක්කම ඇත්තටම මට මේ මිනිස්සු ගැන දුක හිතුනා. ඒ වගේම තමයි මේ සභාවේ න්‍යාය පත්‍රයට මේක වැටීම පිළිබඳව පොදු ජන පෙරමුණට බලය හිමි අලව්ව ප්‍රාදේශීය සභාව ලැජ්ජා වෙන්න ඕනෑ. මේ ඉල්ලීම ඉදිරිපත් කරලා තිබෙන මහානාම මහත්මා සහ ගමේ පිරිස මම දන්නා කාලයේ ඉඳලා පොදුජන පෙරමුණෙන් වේවා එක්සත් ජනතා නිදහස් සන්ධානය වේවා බලයට ගේන්න කැපකිරීමෙන් කටයුතු කරපු පිරිසක්. අපේ ප්‍රදේශයේ ඉන්න වැදගත් පුද්ගලයෙක්. මම දේශපාලනයට ආපු 2018 ඉඳන් කතා කළොත් ඒ මැතිවරණයේදී නුගවෙල කොට්ඨාශයේ අපි පරාජයට පත්වුණේ ඡන්ද 105 කින් වගේ ප්‍රමාණයකින්. එතකොට එක ගෙදර ඡන්ද තුනක් විතර ගත්තම ගෙවල් 18 කින් වගේ තමයි නුගවෙල කොට්ඨාසයේ මම පරාජයට පත් වුණේ. ඒ වගේම පොදුජන පෙරමුණ ජයග්‍රහණය කළේ. මේ කොට්ඨාශයේ පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරන්න මේ අය තමයි මහන්සි උනේ. ඉන්පසු ජනාධිපතිවරයා පත් කරන්නත් මේ අය කැපවීමෙන් කටයුතු කළා. මේ පුද්ගලයෝ සමාජයේ වැදගත් අය. මේ අය කාගෙන්වත් වචනයක් අහන්න ඕනෑ නැති නිසා තමයි මම මේ කතා කරන්නේ. ඒ වගේම ඔවුන් තුනෙන් දෙකේ බලයක් සහිතව මේ ආණ්ඩුව පත් කරන්නත්, එහි ප්‍රතිඵලයක් විදියට මේ ප්‍රාදේශීය සභාවෙ පොදුජන පෙරමුණේ ප්‍රාදේශීය සභාවක් බිහිවුණා. ජනාධිපතිවරයෙක් බිහිවුණා. තුනෙන් දෙකක බලයක් සහිත අගමැතිවරයෙක් පත්වුණා.මහාමාර්ග ඇමති වරයෙක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් බිහි වුණා. මේ මහත්මයා හා ස්වාමීන් වහන්සේ ඇතුළු පිරිස මේ හැම කැප කිරීමකින්ම මොවුන් බලාපොරොත්තු වුණේ,ඔවුන් හීන දැක්කේ මේ මාර්ගය හදාගන්න. ඔවුන්ගේ මේ හීනය නැත්තටම නැති කරලා දාලා අද ඔවුන්ට ඔවුන්ගේ සල්ලි වලින් මාර්ගය හදා ගන්න තැනට ඇවිල්ලා තිබෙනවා. ගෙවල් ගානේ ගිහිල්ලා ආධාර එකතු කරලා, ගරු සභාපතිතුමිය මම යෝජනා කරනවා මේ පාර සභා අරමුදල් දාලා හදලා දෙන්න. මේ මිනිස්සු මෙහෙම අසරණ කරන්න එපා.අපි ඉගෙන ගත්තු ගුරුවරු. අද බැනර් එකක් ගහලා තිබෙනවා මේ මාර්ගය හදන්න මුදල් දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉසුරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මුලින්ම මම ස්ථිර කරනවා. මහානාම පතිරණ සර්ලා කියන්නේ මේ ප්‍රදේශයේ හිටපු වැදගත් මිනිස්සු. ඒ අය බැනර් එකක් ගහලා සල්ලි එකතු කරනවනම් අපිට ලැජ්ජයි.ඒ නිසා ඉසුරු මන්ත්‍රීතුමා කිව්වා වගේ සභාවෙ කවුරුත් එකතුවෙලා සභාවෙන් දෙන්න පුළුවන් මුදලක් දෙන්න මාත් යෝජනා කරනවා. ඒ අයට යම් කිසි මුදලක් සභාවෙන් දුන්නොත් ඒක වැදගත් විදිහට පාවිච්චි කරනවා. හොරකම් කරන්නෙ නෑ. මම මේ සභාවට යෝජනා කරනවා මහානාම සර්ල, ඒ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් එහෙම කරන්න පුළුවන් නම් හොඳයි. නුගවෙල විහාරස්ථානය ගත්තහම ප්‍රදේශයට විශාල සේවයක් සපයන විහාරස්ථානයක්. දේශපාලනය වශයෙන් මොන මත දැරුවත් ඉසුරු මන්ත්‍රීතුමාල ඒ විහාරස්ථානයත් එක්ක සුහදව කටයුතු කරනවා. අපි කියන්නේ හරි දේ කරන්න. මේ සභාවේ කැබ් රථය විනාශ කලා වගේ නැතුව මේ කටයුතු වල උදව් කරන්න කියලා මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ලිපියේ තිබෙනවා මෙම මාර්ගයේ විශාල වශයෙන් දැව කඳන් පටවා ගත් ලොරි රථ ගමන් කිරීම නිසා පාර ඉක්මනින් අබලන් වන බැවින් එය නතර කරවීමට පියවර ගන්න කියල ඉල්ලා තිබෙනවා. මම සභා වාර කිහිපයකදීම කීවා ලේකම්තුමිය දන්නවා ඇති අලව්ව ප්‍රාදේශීය සභාවට අයිති පාරවල් සංවර්ධනය කරලා තිබෙනවා. මේ වගේ අලි කොට අදිනවා, ගල් පටවා ගෙන යනවා, කොට ලොරි ගෙනියනවා. මම කිව මේකට අවශ්‍ය ප්‍රමාණයට ටොන් ප්‍රමාණය සඳහන් කරලා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරන්න කියලා කිහිප අවස්ථාවකදීම යෝජනාවක් විදියට ඉදිරිපත් කළා. අද ඒ පැත්තෙ කාපට් පාරවල් පුපුරලා තිබෙන්නෙ. එක පැත්තකින් රජයේ මුදල් නාස්ති වෙනවා. මේ හදපු පාරක්නෙ කැඩිල තිබෙන්නෙ. සභාවට

අයිතිය තිබෙනවා සභාව සතු පාරවල් වල මෙච්චර ප්‍රමාණයක් මෙච්චර දැව අදින්න එපා කියලා දැන්වීම් ගහන්න. මම ඉදිරිපත් කළ යෝජනාවට මොකක් වුනාද දන්නේ නැහැ. මේක මාර්ග සංවර්ධන අධිකාරියට හරි කියලා මේකයි අපි නවත්වන්න ඕනෑ. මේ මාර්ගය ප්‍රාදේශීය සභා අරමුදලින් සකස් කර දීම සුදුසුයි කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මමත් මේ ප්‍රදේශයේම ඉපදුන කෙනෙක් බව ගරු මන්ත්‍රීතුමාලට අමතක වෙලා ඇති. ඒ වගේම ඔබ සියළු දෙනාටම වඩා මම වයසින් වැඩියි. මේ මහානාම මැතිතුමාගේ පියාත් ඉතාම ක්‍රියාකාරීව ඒ කාලයේ සමාජ සේවා කටයුතු කල ආකාරය මම දැකලා තිබෙනවා. මේක දේශපාලන එහා මෙහා කිරිල්ලක් නෙවෙයි. අපේ හිටපු ගරු සභාපතිතුමාත් මහානාම මැතිතුමාලගෙ පැත්තේ පාරක් කොන්ක්‍රීට් කරන්න මුදල් වෙන් කරලා තිබුණා අපි දැක්කා. එතුමගේ කොට්ඨාශය එතුමා ඒ අයට සහයෝගය දුන්නා. මම ගුරුවරියක් හැටියට වැඩ කරන කොට මහානාම මහතා දක්ෂ ශිෂ්‍යයෙක්. මෙතුමාට ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්න කියලා මමත් ආරාධනා කළා. නමුත් ඒ වෙලාවේ ඒක පිළිගත්තෙ නැහැ. මහානාම මහතා සහ ප්‍රදේශවාසීන් එකතුවෙලා තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. එතුමාගේ දැන උගත්කමත් එක්ක එතුමා ක්‍රමානුකූලව මේක සකස් කරලා අද රටේ තිබෙන ආර්ථික තත්වය ගැනත් තම පියාගේ කාලයේ සමාජ කටයුතු කල ආකාරයත් අනුව දැනුවත්කමින් වෙන්න ඇති මෙහෙම සහයෝගයක් අරගෙන පාර හදනවා කියලා මට දැනුවත් කළේ. මේක සභාවට ඉදිරිපත් කළේ මේ වැදගත් වැඩක් කෙරෙන නිසා අපිත් ඒකට යම් සහයෝගයක් ලබා දෙමු කියලා, ගරුත්වයක් ලබා දෙමු කියලයි. ගරුතර ස්වාමීන් වහන්සේත් ඇවිල්ලා කතා කළා මේකට මොනවා හරි පුළුවන් උදව්වක් දෙන්න කියලා. මේක සභාවට ඉදිරිපත් කළේ සභාවේ සහයෝගය ඇතිව වැඩ කරන්නත්, ඔවුන්ට ගෞරවයක් ලබා දෙන්නත් ඕන නිසා තමයි සභාව දැනුවත් කලේ. අද සභාවේ තියෙන ආර්ථිකයත් එක්ක ඔබ තමුන්නාන්සේලා දන්නවා අපට දැරිය හැකි වියදම් ප්‍රමාණය. මෙතන ලියුම් මිටියක් තිබෙනවා ආපදාවට ලක් වුණ පාරවල් ගැලවිලා ගිහිල්ලා දැන් ආඩියාදෙණිය පැත්තෙන් වාහනයක් යන්න බෑ. අද එතැනට පස් දාලා කාණු කැට දාලා හදන්න පටන් අරන් තියෙන්නෙ. ඒ වගේ දේවල් මේ තිබෙන සල්ලි ටිකෙන් කරලා දෙන්න සිද්ධ වෙනවා. මේ වර්ෂයේ අවසාන කාලේ. ඒ වගේම මේ කාලයේ තිබුණ ආර්ථික අහේනියත් තමුන්නාන්සේලා දන්නවා. මේක හිඟා කෑමක් නෙවෙයි. ඉස්සර ගමේ ශ්‍රමදාන කරනකොට ගම් සභා හෝ ප්‍රාදේශීය සභා සහයෝගය ලබා දී මේ වගේ වැඩ කෙරුන කාලයක් තිබුනා. අද රටේ පවතින ආර්ථිකයත් එක්ක අපිට නැවතත් ඒ තැනට එන්න වෙනවා. අද ආපදාවට ලක්වූ බොහෝ තැන්වල ශ්‍රමදානයෙන් තමයි බොහෝ වැඩ කෙරෙන්නේ. අපිත් සභාවෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබාදෙමු. පස් ටික, වාහන, කාණු කැට දෙන්න පුළුවන් බොහෝ දේවල් ලබා දෙනවා. ඒ වගේම හොඳ වැඩක් කෙරෙනකොට ඒක ඇගයීමක් මිසක් කාවවත් අවතක්සේරු කරන්න, කාවවත් පල්ලෙහාට දාන්න නෙවෙයි මේ ලිපිය ඉදිරිපත් කළේ. ඒක නිසා ඔබතමුන්නාන්සේලාගේ කාරුණික අවධානය යොමු කරන්න. මමත් මේක අගය කරන නිසා තමයි සභාවට ඉදිරිපත් කලේ. අද රටේ බොහෝ දේවල් තව ටික කාලයක් යනතුරු ඔය විදියට සිදුකරන්න වෙයි. මේ පාරේ එක කොටසක් කාපට් කල නිසා ඉතිරි කොටසත් යෝජනා වෙලා, RDA එකෙන් ස්ථිර වෙලා මිනුම් කටයුතුත් කරලා තිබුණේ. රටේ යම් කිසි සිදුවීමක් එක්ක ඒවා නැවතුනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම මුලින්ම කියන්න ඕනේ අපි පාර කාපට් කරන්න මුලින්ම මුල්ගල තිබ්බෙ පඹදෙණියෙන්. මුල්ගල තියලා මාස ගානක් යනකම් පාර ඇස්තමේන්තු කරන්න කවුරුත් ආවේ නෑ. ඊට පස්සේ අපි නොදන්න ක්‍රමවේදයකින් මාස ගානකින් ඇවිල්ලා ෂෙල්ටන් මන්ත්‍රීතුමාලගෙ පැත්තෙන් ඇවිල්ලා මල්ලැහැව කොස්සින්න ඉඳලා ඇස්තමේන්තු කරගෙන ගිහිල්ලා තිබුණා.ඊට මාස ගානකට පස්සෙ වැඩ පටන් ගන්නකොට අපිට කෝල් එකක් දීලා කියනවා මල්ලැහැව පාරේ වැඩ පටන් ගන්නවා කියලා. අපේ සුමිත් මන්ත්‍රීතුමත් හිටපු

සභාපතිතුමත් ඇමතිතුමාට කෝල් කරලා කිව්වා මුල්ගල තිබ්බෙ මේ පැත්තෙන්. ඒ නිසා කරුණාකරලා මේක නවත්වන්න කියලා. ඇමැතිතුමා කිව්වා එක නවත්වන්න එපා, කිලෝමීටර් දෙකක් සුමිත් රාජපක්ෂ මැතිතුමාටත් දෙනවා ඉතිරි වැඩකටයුතු වලට. ඒ හින්දා මේක කරන්න කියලා තමයි මල්ලැහැව හන්දියේ ඉඳලා පාර කරගෙන ගියේ. ඇත්තටම ඒ වෙලාවේ අපි කතාකලා. කොස්සින්නේ ඉඳලා කලල්පිටිය දක්වා ඒ මාර්ගය හැදුවා. පසුකාලීනව ආපු අර්බුදයත් එක්ක ඒක නැවතුනා. ඇත්තටම දැන් ඒ පාරේ යන්න බෑ. මමත් පිළිගන්නවා. දේශපාලන වශයෙන් නුගවෙල කොට්ඨාශයට කරන්න පුළුවන් දේවල් අපි කළා. නුගවෙල පන්සල පාරත් මේ වෙනකොට හදනවා. පොහොට්ටුවේ මන්ත්‍රීවරයෙක් විදියට මට පුළුවන් උපරිම දේ මම කොට්ඨාශයට කරනවා. මම කියනවා පුලුවන්නම් සිමෙන්ති කොට්ට 15 ක් 20 ක් ලබා දෙන්න කියලා. ඒ වගේම ඉල්ලීමක් කරා JCB එක දාලා කාණු ටික කපලා දෙන්න කියලා. ඒ වගේ ඉල්ලීමක් කළාම එය කර දීමක් මිසක් මෙතන හිඟාකෑමක් නොවෙයි කරන්නේ. ඒකට ප්‍රාදේශීය සභාවක් හැටියට කරන්න පුළුවන් දෙයක් කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම කිව්වේ මේ සභාවේ මේකට අවශ්‍ය සහයෝගය ලබා දීලා සම්මත කරලා දෙන්න කියලා. ඒකට අවශ්‍ය යෝජනාවයි මම කළේ. නැතුව විවාදයකට යන්නවත් ඊට එහා කාරණයකට යන්නවත් නොවෙයි මම අදහස් කළේ. මේ මාර්ගය හදලා දෙන්න සභාවේ යෝජනාවක් අවශ්‍ය නම් සභාවේ අරමුදල් දාලා කරන්න යෝජනා ස්ථිර කරන්නයි මම කිව්වේ. නැතිව ගැටුමකටවත් විවාදයකට යන්නවත් නොවෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ඉල්ලීමේ හැටියට සභාවේ එකඟතාවය නැති වුණත් ඔබතුමියට කරන්න පුළුවන් දේ තමයි මේ ලිපියෙන් ඉල්ලලා තියෙන්නේ. අපි තේරුම් ගන්න ඕනෑ මේ ලිපිය සභාවට ඉදිරිපත් කරපු එකේ තේරුම මොකක්ද කියන එක.මෙතුමිය මේ කරලා තිබෙන්නේ සභාවට දාපු යෝජනාව ඉදිරිපත් කරලා, තමන්ගේ ශ්‍රමය වැය කරලා ඒ ශක්තිය යොදවලා ඒ සේවාව කරන මහත්වරුන්ට ගෞරවනීය භාවයක් ලබාදීම. පුද්ගලික මතිමතාන්තර, ගැටළු අපි මේ තුළින් උළුප්පාගන්නේ නැතිව තමන්ගේ කාර්යය මොකක්ද කියන එක තේරුම් අරගෙන යම් දෙයක් කරන පුද්ගලයාට ගෞරවයක් ඇති වෙන විදිහට කතා කරනවා නම් හොඳයි. මෙම මාර්ගය පිළිසකර කිරීමේදී ඔවුන්ට ලබා දෙන සහයෝගයක් ලබා දෙමු කියන යෝජනාව කරමින් එතුමන්ලා ඉල්ලන සහයෝගයටත් වැඩි යමක් ලබා දෙන්න පුළුවන් නම් ඒ දේවල් ලබාදීම සුදුසුයි කියලා යෝජනා කරනවා. ඒ වගේම මේ සත්ක්‍රියාව කරන පුද්ගලයන්ට ගෞරවනීය ස්තුතිය මේ සභාවේ පුද කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම නැගී සිටියේ මහානාම මහත්මයාගේ නම කියවුණ නිසා. මොකද මේ කාරණා වලට සභාවෙන් උදව් කරනවා කියන කාරණාව දැන් කියවිලා අවසානයි. අපිට උදව් 02 ක් කරන්න තිබෙනවා. එකක් ඒ දිනවල කොන්ක්‍රීට් කරනකොට පාර වහලා දෙන්න කියලා කියනවා. ඊළඟට කොට අදිනවා නම් අවශ්‍ය ඒ බෝඩ් දාලා දීලා ඊටත් පස්සේ කොට අදිනවා නම් අපේ නිලධාරියෙක් මාර්ගයෙන් ඔවුන් අත්අඩංගුවට අරගෙන නීතිමය පියවර ගන්න ඕනේ.එහෙම නැතිව කවදාවත් ඔය කොට ඇදිල්ල නවතින්නේ නෑ. අපි ආදර්ශයක් හැටියට මෙතැනින් පටන් ගමු. මේ පාර හැදුවට පස්සේ නැවත කොට අදිනවා නම් ඒ ප්‍රදේශයේ ජනතාවට පුළුවන් අපේ සභාව දැනුවත් කරලා ඒ මාර්ගයෙන් ජනතාව කවුරුහරි පැමිණිල්ලක් දාලා සභාවේ නිලධාරීන් එක ගිහින් අවශ්‍ය පියවර අරගෙන ඔවුන් අත්අඩංගුවට අරන් නීතිමය පියවර ගන්න. එතකොට කොට අදින හැම කෙනාටම ඕක ආරංචි වෙනවා. අලව්වේ ප්‍රාදේශීය සභා පාරවල් වල නියමිත ප්‍රමාණයට වඩා කොට අදින වාහන ප්‍රාදේශීය සභාව මැදිහත්වෙලා නතර කරනවා කියලා. මම දන්නවා ලෙව්දෙණියේ කොට ඇද්දා ලොරිවලින්. ඒවා නවත්තන්න

බැරිවුනා. බෝඩ් ගලවලා. ඉස්සර බෝඩ් ගහලා තිබුණා, ටොන් 20 යි. ඉස්සර ගම් සභා කාලයේ හැමතැනම බෝඩ් තිබුණා. දැන් නෑ. ඒ නිසා තමයි මේ පාරවල් ගොඩක් පලුදු වෙලා තිබෙන්නේ. ප්‍රාදේශීය සභා පාරවල් කියන්නේ පොඩි පාරවල් .ඒවට සරිලන විදිහට තමයි කොන්ක්‍රීට් එක දාන්නේ. කාපට් බොරළු දාන්නේ. ඒ පාරවල් විනාශ වෙලා තියෙන්නෙ ඒවට දඬුවම් නොකිරීම නිසා. ඒ නිසා මේකේ ආරම්භයක් හැටියට මේ මහනාම මහත්තයලා කරලා තියෙන ඉල්ලීමට අපි එකඟතාව පළ කරන බව සභාපතිතුමියත් කියනවා. සභාවේත් අනුමැතිය තියනවා. මේක කළ යුතුයි. ඒ වගේම එතුමා ආදර්ශයකුත් දීලා තිබෙනවා සල්ලි එකතු කරලා ජනතාව එක්ක. මේ රටේ පවතින තත්වේ කියලා හිතමුකෝ අපි. ඒ නිසා එතුමා ලක්ෂ ගානක් හොයලා ඒ මීටර් 500 හදන්න යනවා. ඒකටත් අපි සහයෝගය දෙමු. ඊළඟට ඕනම කොන්ක්‍රීට් එකක් දාපුවම දවස් 21 ක් විතර ඒක තියාගන්න ඕනේ. ඔය අතර ගම්වල ඉන්නවා වන්ඩි. ඒ අය තමයි ඕවා කඩාගෙන බිඳගෙන යන්නේ.ඒ නිසා සභාවේ අණ පරිදි කියලා බෝඩ් එකක් දාමු. ඊළඟට මේ මහානාම මහත්තයා ඕක කොන්ක්‍රීට් කරන්න ඕන නෑ. හේතුව ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් මුලින්ම දඹදෙණිය ආසනයේ පටන්ගත් කාපට් එක තමයි ඕක. නමුත් ඒක වෙනත් බලපෑමකින් පාරේ අනිත් පැත්තෙන් පටන් ගත්තා. නමුත් මුල්ගල තිබ්බේ මේ පැත්තෙන්. ඒ පාරේ එදා මුල්ගල තිබ්බ තැනින් පටන් ගත්තා නම් අද මේ පිරිසට මෙහෙම දෙයක් කරන්න වෙන්නේ නෑ. අපි හැම කෙනෙක්ම මේකට දායකත්වය දෙන්න ඕනෑ. ඒ මිනිස්සු දේශපාලනය කළේ කාටද කියන එක අපට වැඩක් නෑ.

ඒ අනුව පඹදෙණිය - කලල්පිටිය මාර්ගයේ පඹදෙණියේ සිට මීටර් 500 ක් පමණ දුර ප්‍රමාණයේ ඉතා අබලන්ව ඇති කොටස් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ඉහත ඉල්ලීම සඳහා අවශ්‍ය සියළු සහයෝගයන් ලබාදීම සුදුසු බවත් පිළිසකර කිරීම සඳහා සිමෙන්ති කොට්ට 20 ක් හා JCB යන්ත්‍රය ලබා දීම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත විය.

**03.5** **<u>භෝග වගාවලට වනජීවීන්ගෙන් සිදුවන හානි අවම කරගැනීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අප සභාව විසින් 2022.10.11 දිනැතිව ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ලද ලිපිය මගින් කල ඉල්ලීම සම්බන්ධයෙන් අවධානය යොමු කර සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එම ක්‍රියාමාර්ග පිළිබඳව අග්‍රාමාත්‍ය කාර්යාලයට ද පිටපතක් සහිතව අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිනිය දැනුවත් කරන ලෙසත් ඉල්ලමින් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් වනජීවී හා වන සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපියේ පිටපත ගරු සභාවේ දැනගැනිම සඳහා ගරු සභාපතිතුමිය ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මගේ යෝජනාව මේ සභාවේ සම්මත කරලා අග්‍රාමාත්‍ය කාර්යාලය දැනුවත් කිරීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. අපිට මේකට මීට වඩා යමක් කරන්න පුළුවන් කමක් නෑ. මේ යෝජනාව ගෙනාවේ සියලු ගම් වලට මේ ගැටලුව තියෙන නිසා. තව අවුරුදු තුනක් හතරක් යනකොට ලංකාවේ බාගයකටම මේ ගැටලුව එනවා. මේ පිළිබඳව අවධානය යොමුවෙලා තිබෙනවා එක් එක් අමාත්‍යාංශ වල. මේකත් ඒකට රුකුලක් වෙයි කියලා මම හිතනවා. ඒ වගේම ඔය ලිපියේ පිටපතක් මටත් ලබා දෙන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා. මම නැවත අවධානය යොමුකරනවා ගම් වල ස්වේච්ඡා සංවිධාන සමඟ සාකච්ඡා කරලා ඔවුන්ගේ අවධානයට ද මේ සම්බන්ධව යොමුකර ගැනීමට.

**03.6** **<u>වෛද්‍ය ආධාරයක් ඉල්ලුම් කිරීම.</u>**

හෙණ්ඩුවාවත්ත, කැප්පිටිවලාන ලිපිනයේ සීතා අල්විස් අය අයගේ දරුවා වන 36 හැවිරිදි ඊ.ඒ. සුමිත් කුමාර මේ වන විට දරුණු පිළිකා රෝගයක් සැදී මහරගම පිළිකා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන බවත් ඔහු හට අවශ්‍ය දියර ආහාර ලබාගැනීමට සතියකට රු. 20,000.00 ක් හා ඖෂධ සහ අනෙකුත් දේ ලබා ගැනීම සඳහා සතියකට රු. 20,000.00 ක පමණ මුදලක් වැය වන

බවත් තවද ඔහු වෙත TPGS Docetaxel නම් ඖෂධය දින 21 ක් අවස්ථා 2ක ලබාදීමට වෛද්‍යවරු නිර්දේශ කර ඇති බවත් එම ඖෂධ වර්ගය 01 ක් සඳහා රු. ලක්ෂයක මුදල බැගින් රු. ලක්ෂ 42 ක මුදලක් වැයවන බව වෛද්‍යවරුන් පවසා ඇති බවත් සඳහන් කරමින් එම වියදම් පියවා ගැනීමට හැකි පමණින් ආධාරයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් හෙණ්ඩුවාවත්ත, කැප්පිටිවලාන ලිපිනයේ සීතා අල්විස් මහත්මිය විසින් ඉදිරිපත්කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, දරුවෙකුට පිළිකා රෝගයක් තිබෙන්නේ. ඒ නිසා අපි සානුකම්පිතව බලලා ලබාදීමට හැකි උපරිම මුදල ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා කිව්වා ලබාදීමට හැකි උපරිම මුදලක් ලබාදීම සුදුසුයි කියලා. මේ අය අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ. අවුරුදු 36 ක් වන සුමිත් කුමාර යන අය නමින් දන්නේ නැති උනාට ගොඩක් දෙනා දන්න තරුණයෙක්. මෙතුමා පොදු කටයුතු වලට සම්බන්ධ වෙලා වැඩ කටයුතු කරනවා. මොහුගේ බෙහෙත් සඳහා ඉතා විශාල මුදලක් වැයවන නිසා එම මුදල සොයා ගැනීමට නොහැකි නිසයි මේ ඉල්ලීම කරන්නේ.

ඒ අනුව හෙණ්ඩුවාවත්ත, කැප්පිටිවලාන ලිපිනයේ ඊ.ඒ. සුමිත් කුමාර යන අය වෙත පිළිකා රෝගය සඳහා ලබාදිය හැකි උපරිම මුදල වන රු. 25,000.00 ක වෛද්‍ය ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.7 වෛද්‍ය ආධාරයක් ඉල්ලුම් කිරීම.**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස කටයුතු කරන ජේ.එම්. නිමල් ජයසිංහ මහතා හදිසි හෘදයාබාධයකට ලක්ව ප්‍රතිකාර ලබමින් සිටින බවත් ඔහුට මේ දක්වා සිදුකල පරීක්ෂණ අනුව හෘද සැත්කමක් සිදුකරන ලෙස වෛද්‍යවරුන් පවසා ඇති බවත් ඒ සඳහා රු. 2,500,000.00 ක මුදලක් අවශ්‍ය බවට වෛද්‍යවරුන් විසින් තහවුරු කර ඇති බවත් දන්වමින් මේ සඳහා යම්කිසි ආධාර මුදලක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීමක් කරමින් පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාටත් උදවු අවශ්‍ය මොහොතක්.අපට ලබාදිය හැකි උපරිම මුදලක් ලබා දීම සුදුසුයි කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා බොහොම කාලයක සිට මම දන්නවා. පොල්ගහවෙල සභාවේ සභාපතිතුමාට විශාල ශක්තියක් ලබාදෙන සභාවේ දියුණුවට ලොකු කැපවීමක් කළ කෙනෙක්. එතුමා අපි කවුරුවත් නොහිතපු වෙලාවක රෝගී තත්ත්වයට පත්වෙලා තිබෙනවා.මම හිතනවා හැම කෙනෙකුටම ආදර්ශයක් දෙන්න පුළුවන් උපරිම මුදලක් ලබාදීම සුදුසුයි කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අවංක රාජ්‍ය නිලධාරියෙක් විදියට මෙන්ම පොල්ගහවෙල ප්‍රදේශයේ දියුණුවට විශාල කැපකිරීමක් කළ පුද්ගලයෙක්. අපේ ප්‍රාදේශීය සභාවෙනුත් එතුමාගේ මේ අසනීප තත්ත්වයට යම් කැපකිරීමක් කරන්න පුළුවන් නම් ඇත්තටම වටිනවා. ඒ නිසා අපට දිය හැකි උපරිමයකට අපි සහයෝගය දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා

ඒ අනුව පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස කටයුතු කරන ජේ.එම්. නිමල් ජයසිංහ මහතා හට රෝගාබාධ සඳහා ලබා දිය හැකි උපරිම මුදල වන රු. 25,000.00 ක වෛද්‍ය ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**03.8** <u>අධික වර්ෂාවෙන් හානි වූ මාර්ග ප්‍රතිසංස්කරණයට අවශ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.</u>

පවතින වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක්ව ඇති මාර්ග යථා තත්වයට පත්කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර කුලියට ගැනීමට සිදුවී ඇති බවත් ඒ සඳහා පහත යන්ත්‍ර සූත්‍ර අවශ්‍යව ඇති බවත් දන්වමින් පහත යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීමක් කරමින් අප සභාවේ තාක්ෂණ නිලධාරී නාමල් ශෂිකාන්ත මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

- පස්කපන යන්ත්‍රය
- පස් තලන යන්ත්‍රය
- කියුබ් 01 ටිපර් රථයක්
- Vacker යන්ත්‍රයේ කුලිය සහ අවශ්‍ය ඉන්ධන

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, හදිසි ආපදා තත්ත්වය මත ආපදා වූ ස්ථාන නැවත පිළිසකර කිරීමට ඉල්ලීම් කරන ඒ සහන ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. ඒ වගේම පොඩි අදහසකුත් ඉදිරිපත් කරනවා. ආපදාවට ලක් වූපාරවල් ප්‍රතිසංස්කරණ කිරීමේදී ඒ මන්ත්‍රීවරුන්ට සම ආකාරයෙන් බෙදිලා යන විදිහට ඒ පාරවල් වලට බෙදලා දෙන්න. එහෙම කරලා අපේ සමඟිය, සහයෝගය, එකමුතුකම ආරක්ෂා කරන්න පුළුවන් විදියට තියන මුදල යොදවන්න කියලා මම සඳහන් කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ආපදාවට ලක් වූ මාර්ග පිළිබඳ යෝජනා දීලා තිබෙනවා. ඒවා අතරින් වැඩිම හානිදායක තැනින් තමයි අපි පිළිසකර කරන්න පටන් ගත්තේ. ගලතරය කන්දේ ගල් ගැලවිලා, ලයිට් කණු පවා ගැලවිලා, ආධාරක කම්බිය නිසා එල්ලිලා වගේ තිබුනේ.අපි කරන දේත් අවුරුදු දෙකක් තුනකට මිසක් පූර්ණකාලීනව යා දෙන්නෙ නෑ. ඒ වගේම තමයි ඉදිකිරීම් කරනකොටත් අවසර ගැනීම් ඇතිවද නැතිවද දන්නෑ සමහර ඉදිකිරීම් කරලා තියන හැටි දැක්කම පාරකට ඉඩක් නෑ. මැදගම්පල පන්සල පහු කරලා ගලතරය කන්ද නගින්න පටන් ගන්න තැන ඉදලම තියෙන්නේ විශාල හානියක්.ඒ කුඹුරු යායම වැලිවලින් යටවෙලා. ඒ වතුර හිත්තරපොල පන්සලට යන පාරටම ඇවිල්ලා.කාපට් පාරෙත් දෙපැත්තම ගැලවිලා ගිහිල්ලා.පයින් යන කෙනෙකුට යන්න තරම්වත් ඉඩක් නෑ. මේවට ගොවිජන සේවා එකත් එකතු කරගෙන ඒ අයගේ වගකීම් සමග තමයි සමහර තැන්වල අපට ආපදා වලට යම් ප්‍රතිකර්මයක් කරන්න වෙන්නේ.

ඒ අනුව හදිසි ආපදා තත්ත්වය මත ආපදා වූ මාර්ග නැවත පිළිසකර කිරීම සඳහා ඉහත සඳහන් යන්ත්‍ර අවශ්‍ය අවස්ථාවලදි අනුමත මිල ගණන් යටතේ කුලී පදනම මත ලබාගැනීමටත් ඉල්ලීම් කර ඇති ඉන්ධන ලබාදීම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත විය.

**04. <u>යථාපරිදිකල්දීඇතිප්‍රශ්න - නැත</u>**

**05. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**(05-1)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/56 - 01 දරණ යෝජනාව</u>**

2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර ගැනීමට හා මෙම සමීක්ෂණ නිලධාරීන් සේවා ස්ථානයට ආසන්නව සමීක්ෂණ කටයුතුවල නිරතවන අවස්ථාවලදී, එම නිලධාරීන් සඳහා පැය 8ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සංයුක්ත දීමනාවට සමාන දීමනාවක් චක්‍රලේඛයට අනුව ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ සමීක්ෂණය පවත්වන ස්ථානය | භාණ්ඩ සමීක්ෂණය පවත්වන දිනය | භාණ්ඩ සමීක්ෂණය සිදු කරන මන්ත්‍රීවරු සහ නිලධාරීන් |
|---|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලය /ප්‍රජා ශාලාව | (දින 02) 2023 ජනවාරි 10,11 | 01)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු උප සභාපති<br>:- එච්.එම්. ධර්මරත්න හේරත් මැතිතුමා<br>02)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- ආර්.පී.එස්.උදයලතා මිය (කළ.සේ.නි. -පොල්.ප්‍රාස)<br>04)සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එස්.එම්.ර්.ආර්.සුභසිංහ මිය(කළ.සේ.නි.-පොල්.ප්‍රාස)<br>05)සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- කේ.එම්.වසන්ත කුමාර මයා (සං.නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එස්.ඩී.ජී. සමරක්කොඩි මිය (කළ.සේ.නි.) |
| 02 | පොදු වෙළඳ සංකීර්ණය /සතිපොල/සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය | (දින 02) 2023 ජනවාරි 12,13 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:-කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ<br>:- එච්.ඒ.පී.පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං.නි.)<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- බී.ආර්.ඒ.කේ. ගුණසේන මිය (කළ.සේ.නි.)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- කේ.පී.එස්.එම්.ගුණරත්න මිය (කළ.සේ.නි..)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ඩබ්.කේ.එම්.එම්.කේ.ඥාණරත්න මිය (සං.නිල)<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:-එන්.එන්.ජී.එන්.එස්.ධර්මසේන මිය (සං.නි) |
| 03 | නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය/අ ලව්ව මහජන ක්‍රීඩාංගනය | ( දින 02) 2023 ජනවාරි 18,19 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඒ.ඒ.යසිත් නිරංජන් මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- එස්.එම්. ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණය<br>:- එච්.ඒ.පී.පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං.නිලධාරී) |

| | | | |
|---|---|---|---|
| | | | 04) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- පී.කේ.පී. පතිරාජ මිය (කළ.සේ.නි.)<br>05)සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ඩබ්.එස්.පී.පී. වර්ණසූරිය මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එච්.එම්.එච්. හේරත් මිය (සං.නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එම්.ඩී.එන්. ඒකනායක මිය (සං.නිල.) |
| 04 | මහරච්චිමුල්ල උප කාර්යාලය | (දින 02)<br>2023 ජනවාරි<br>12,13 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඒ.සී. ප්‍රියන්ත අතුකෝරාළ මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- ආර්.එම්.එස්.බී. රත්නායක මයා (කළ.සේ.නි.)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ඒ.පී.එන්.එන්. අක්මීමන මිය (කළ.සේ.නි.)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- පී.ආර්.එස්. ආරියසිංහ මිය (සං.නි)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ඊ.එම්.සාගර කුමාර ඒකනායක මයා (කළ.සේ.නි.) |
| 05 | කැප්පිටිවලාන උප කාර්යාලය / බෝයවලාන ප්‍රජා ශාලාව බෝයවලාන සතිපොල හා බෝයවලාන වෙළඳ සංකීර්ණය | (දින 02)<br>2023 ජනවාරි<br>17,18 | 01)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- එස්.එම්. ජයතිලක මැතිතුමා<br>02)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ආර්.ආර්. ප්‍රියන්ත කුමාර සෝමසිරි මැතිතුමා<br>03)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා<br>04)සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- ආර්.එස්. රංජනී මිය (සං.නි)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ආර්.ඒ.එම්.එන්.පී. රාජකරුණා මිය(සං.නි.)<br>07)සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එම්.බී.එම්. ප්‍රසංගිකා මිය (සං.නිල)<br>08)සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:-සී.පී.පියසුමන මිය (සං.නි) |
| 06 | අලව්ව මහජන පුස්තකාලය | (දින 05)<br>2022 දෙසැම්බර්<br>15,16,23,27,28 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඒ.ඒ. කරුණාරත්න මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රිනී<br>:- ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිණිය<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- එච්.ඒ.පී.පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිලධාරී)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එච්.ඩී.පී.හේවාරත්න මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ජේ.එම්.ඩී.ඩී. ජයකඩු මිය (සං.නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ඩී.එම්.එන්.ඩී.දිසානායක මිය (සං.නිල)<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- පී.ජී.කේ.තිලකරත්න මිය (සං.නිල)<br>09)සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ඩබ්.ඒ.සී.ජේ. වික්‍රමආරච්චි මිය (සං.නි.) |

| | | | |
|---|---|---|---|
| 07 | මහරච්චිමුල්ල මහජන පුස්තකාලය | (දින 03) 2022 දෙසැම්බර් 20,21,22 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ආර්.පී. නලීන් ඩයස් රාජපක්ෂ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රීනි<br>:- ආර්.ඒ.ශ්‍රියාණි වසන්තා මැතිණිය<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඩබ්ලිව්.පී. ධනුක්ෂ වීරසිංහ මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- එච්.ඒ.පී.පී. හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිලධාරී)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ආර්.එම්.පී. ඒකනායක මිය (සං.නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එච්.එම්. සාගරිකා හේරත් මිය (සං.නිල)<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එම්.පී.එම්.අයි.ඩී. ප්‍රියශාන්ති මිය (සං.නිල.)<br>08) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ආර්.එම්.කේ.රත්නායක මිය (සං.නිල) |
| 08 | බෝයවලාන මහජන පුස්තකාලය | (දින 03) 2022 දෙසැම්බර් 28,29,30 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:-එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රීනි<br>:- ඒ.ඒ.කරුණානායක මැතිණිය<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- එච්.ඒ.පී.ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- එච්.ඒ.පී.පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිලධාරී)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ආර්.එම්.ඒ. රණසිංහ මිය (සං.නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ජේ.එම්. ඩී.ජී.කේ. ජයකොඩි මයා (සං.නිල)<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- ජේ.ඒ. අජන්තා ජයරත්න මිය (සං.නිල)<br>08) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එච්.ටී.රම්‍යා කුමාරි බාලසූරිය මිය (සං.නිල)<br>09) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එම්.එස්.සුදුසිංහ මිය (සං.නිල.) |
| 09 | මල්ගොමුව පෙර පාසල | (දින 01) 2023 ජනවාරි 20 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ආර්.එම්.නිහාල් ඒකනායක මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රීනි<br>:- සී.පී. ශ්‍රියානි ජයලත් මැතිණිය<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- එච්.ඒ.පී.පී. හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිලධාරී)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එස්.එම්.ආර්.එල්. ගුණතිලක මිය (සං.නිල.)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:-කේ.පී.ඩී. එස්. එන්. විජේරත්න මිය (සං.නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- පී. දීපාංජලී කුමාරසිරි මෙනෙවිය (සං.නිල) |
| 10 | සුධම්ම පෙර පාසල | (දින 01) 2023 ජනවාරි 24 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රීනි<br>:- ආර්.එම්.එස්. කාන්ති මැතිණිය<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- එච්.ඒ.පී.පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිලධාරී)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එච්.ආර්.එස්. ගුණසේකර මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික |

| | | | |
|---|---|---|---|
| | | | :- කේ.පී.එම්.එච්. ධර්මසේන මිය (සං නිල) |
| 11 | මද්දුම බණ්ඩාර පෙර පාසල | (දින 01) 2023 ජනවාරි 26 | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණ ගමගේ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු මන්ත්‍රී<br>:- ඩබ්ලිව්.පී. නන්දසිරි මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති<br>:- එච්.ඒ.පී.පී. හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං.නිල)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:- එම්.එස්.මාරසිංහ මිය(සං. නි)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික<br>:-එම්.අයි.දසනායක මිය (සං. නි) |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර ගැනීමට හා මෙම සමීක්ෂණ නිලධාරීන් සේවා ස්ථානයට ආසන්නව සමීක්ෂණ කටයුතුවල නිරතවන අවස්ථාවලදී, එම නිලධාරීන් සඳහා පැය 8ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සංයුක්ත දීමනාවට සමාන දීමනාවක් චක්‍රලේඛයට අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/56 - 02 දරණ යෝජනාව</u>**

පහත නම් සඳහන් අය දෛනික පදනම මත අප සභාවේ සේවය කරන අතර ඔවුන්ගේ ගිවිසුම් කාලය 2023 ජනවාරි මස අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නම | තනතුර | අවසන් දිනය |
|---|---|---|
| 1. කේ.ඩී.සුරේන්ද්‍ර රූපසිංහ | මාර්ග කම්කරු | 2023.01.04 |
| 2. එච් ජානක සමන් කුමාර | මාර්ග කම්කරු | 2023.01.04 |
| 3. ආර්.ඒ. කසුන් කුමාර රත්නායක | සෞඛ්‍ය කම්කරු | 2023.01.11 |
| 4. සෙල්වර් කුමාර රොෂාන් | සෞඛ්‍ය කම්කරු | 2023.01.04 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත නම් සඳහන් අයගේ සේවා කාලය ගිවිසුම් කාලය අවසන් වන දින සිට තවත් මාස 06 කින් දීර්ඝ කර කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/56 - 03 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් යාංගල්මෝදර හන්දිය සිට යත්තල්ගොඩ දක්වා මා ඔය තුල විශාල මැදිරි නිර්මාණය වී ඇත. මෙම මැදිරි හේතුවෙන් මා ඔයෙහි ජලය බැස යාමට බාධා එල්ල වී ඇති බැවින් අලව්ව නගරය, ගොරොක්ගස්දෙණිය, පහල වලකුඹුර, කොහොලාන යන ගම්මාන සුළු වර්ෂාවකදී පවා ගංවතුර තත්වයන්ට මුහුණ දී සිටී. 1978 දී ද මහ ගංවතුර ආ පසුව එවකට හිටපු අමාත්‍ය ගරු යූ.බී. විජේකෝන් මැතිතුමා ස්ථානීය පරික්ෂණයක් සිදුකර මා ඔය මැදිරි ඉවත් කිරීමෙන් පසු මෑත කාලය වනතුරුම ගංවතුර තර්ජනය සිදු වී නොමැත. එබැවින් එම ආදර්ශයට අනුව රජයේ නීති රීතිවලට යටත්ව යාංගල්මෝදර සිට යත්තල්ගොඩ දක්වා මා ඔයේ වූ මැදිරි කපා ඉවත් කර ප්‍රදේශයේ ජනතාව ගංවතුර තර්ජනයෙන් මුදවා ගැනීමසුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා අපේ බල ප්‍රදේශයේ කොතෙක් ප්‍රදේශ ගංවතුරෙන් හානියට පත් වෙනවද, සාමාන්‍ය ජන ජීවිතය කොතරම් අපහසුතාවයට පත්වෙනවද. ඒ නිසා මේ සභාවේ කාරුණික අවධානය යොමුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා විෂය භාර අමාත්‍යතුමාට, ගරු ජනාධිපතිතුමාට ලිපි යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඉහත යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා විෂය භාර අමාත්‍යතුමාට, ගරු ජනාධිපතිතුමාට ලිපි යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-4)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/56 - 04 දරණ යෝජනාව</u>**
අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඇති ගනේකන්ද, කැබැල්ලවිට, කිරිබත්කොහේ, මාපිටිකන්ද පරමාඋල්ල, වැරැල්ගම, වැරැල්ලගම වැව ආශ්‍රිතව ඇති සියළුම ඇල මාර්ග වලින් පෝෂණය වෙමින් අලව්ව ගිරිඋල්ල මාර්ගය හරහා ගලා යමින් මිදෙල්ලගොල්ල කුඩා ඔය අලව්ව දුම්රියපොල අසලින් මා ඔයට සම්බන්ධ වේ. වර්ෂා කාල වලදී ඉහත ප්‍රදේශවල ජල ධාරාව මෙම මිදෙල්ගොල්ල කුඩා ඔයට ඔරොත්තු නොදීම හේතුවෙන් වර්ෂා කාලවලදී මිදෙල්ලගොල්ල කුඩා ඔය ආශ්‍රිතව ව්‍යාපාර කරන නගරයේ ව්‍යාපාරික ස්ථාන, හෝටල් හා ඒ ආශ්‍රිතව ජීවත්වන ජනතාව ගංවතුර තර්ජනයකට මුහුණ දෙමින් සිටී. ඕවිටවත්ත සුගත් මහතාගේ නිවස, ලලිත් මහතාගේ නිවස, නිමල් මහතාගේ නිවස,ටී රත්තිනා, කමල් චන්ද්‍රසිරි, සුනිල් විජේසිරි, සුනිල් රත්න, උදය බණ්ඩාර යන අයගේ නිවාස සඳකිරණ උත්සව ශාලාව, නිපොන් අධ්‍යාපන ආයතනය, ජාත්‍යන්තර බෞද්ධ පාසල,ජනහිත නිවස, ඩිලන්ති ෆාමසි නිවස, කිංස්වුඩ් ලී බඩු හා ස්ටුඩියෝ, වැවල ටෙක්ස්ටයිල්, වැවල ෆැන්සි හවුස්, කාගිල්ස් ෆුඩ්සිටි යට තට්ටුව, සෝමරත්න මල් ශාලාව, අලව්ව ගිරිඋල්ල මාර්ගය ආදිය ගංවතුර තර්ජනයට ලක්වේ.එබැවින් අලව්ව දුම්රියපොල අසලසිට අලව්ව ගිරිඋල්ල මාර්ගය දක්වා දෙහෙල්ලගොල්ල කුඩා ඔය පැතිබැම්මක් ඉදි කරන ලෙස යෝජනා කරන අතර මේ සඳහා විදේශීයව ලැබෙන ගංගා ඔයවල් කුඩා වැව් ආශ්‍රිත සංරක්ෂණ කටයුතු සඳහා ලැබෙන විදේශ ආධාර මුදලින් ප්‍රතිපාදන වෙන්කර දෙන ලෙසට ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා සහ විෂය භාර අමාත්‍යතුමා වෙත යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, කැබැල්ලවිට, කිරිබත්කොහේ, මාපිටිකන්ද, පරමාඋල්ල, වැරැල්ලගම ප්‍රදේශවලට ගනේකන්දෙන් එන ජල පහර නිසා අලව්ව නගරය මිදෙල්ලගොල්ල කුඩා ඔය හරහා මා ඔයට සම්බන්ධ වෙනවා. මේකට වැරැල්ලගම මහවැවේ වතුර එකතු වුණාම ඒ වතුරත් එක්ක අහුවෙලා එනකොට විශාල ජල කඳක් වෙනවා. මාඔයෙන් දෙගොඩතලා එන ජල කඳත් එකට එකතු වුණාම තමයි අනුව නගරයේ කොටසක් යටවෙන්නේ.එහෙම යට වුනාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කළාම ඒ අය ඇවිත් බලනවා.මොකද මේ විෂය පථය අයිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට.ඒ අය මේක හරවලා අපිට එවනවා. ඊට පස්සේ කිරිඇල්ල මහත්මයා හිටපු ඉංජිනේරුතුමා ජල සම්පත් මණ්ඩලයේ. එතුමා තමයි මේ අංශ භාර ප්‍රධානියා හැටියට කටයුතු කරන්නේ. එතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සාකච්ඡාවට ඇවිල්ලා යන වෙලාවේ ඔබතුමිය හමුවුණාම ඔබතුමිය කියලා තිබුණා මේකට සුදුස්සා විපක්ෂ නායකතුමා නගරයේ ඉන්න, එතුමට උදව් කරන්න කියලා. එතුමා මට කතා කරලා මේ විෂය සම්බන්ධව ඉන්න ප්‍රධාන අධ්‍යක්ෂ ජෙනරාල්තුමා සම්බන්ධ කරල දුන්නා. ඒ දුන්නට පස්සෙ මම ඇහුවා මේවට ආධාර තියෙනවද කියලා. එතුමා මට කිව්වා මේවට ආධාර එනවා, ආධාර එන්නේ

ඇලවල් වලට කියලා නෙවෙයි. මේවට එන්නේ කුඩා ඔයක්, අතු ගංගාවක්,ගඟක්. ඔය තුන තමයි එයාලා දාල එවන්නේ. ඒ වෙද්දී අර හානි වුන ප්‍රදේශ වලට පැති බැම්මක් ඉදි කිරීමට රජයේ මුදල් ගන්න පුළුවන් කියලා.ඒවා රජයේ මුදල් නෙවෙයි. විදේශ ආධාර යටතේ අපට ලැබෙන දේවල්.ඒක ගනිද්දි සභාවක් හැටියට සභාව තුළ මේක බෞතිස්ම කරලා කරගන්න කියලා. ඒ අනුව තමයි මිදෙල්ලගොල්ල කුඩා ඔය හරහා මේ වෙන හානිය අවම කරගැනීම සුදුසුයි කියලා මම යෝජනාව ගෙනාවේ.අවුරුද්දකට දෙපාරක් විතර නොවැම්බර් දෙසැම්බර් මාස වල අනිවාර්යෙන් යට වෙනවා.මේක යම්කිසි ප්‍රමාණයකට අවම කරගන්න පුළුවන් නම්, මේ අලව්ව නගරයේ දුම්රිය ස්ථානයේ ඉඳලා මේ ඇල අයින දිගට පැති බැම්මක් ඉදි කරලා දෙන්න පුළුවන් නම්, අර ඇල අයිනේ ඉන්න පුද්ගලයන්ට පවුල් 12ක් තියෙනවා. මේ ගෙවල් 12 තියෙන පවුල්වල කට්ටියට සහනයක් සැලසෙන විදිහට මෙය සකස් කර ගැනීමට අවශ්‍ය ආධාරයක් ලබා ගැනීමට අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත් මෙහි පිටපත් සමග ලිපි යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා ගෙනා යෝජනාවේ අපි මන්ත්‍රීවරු හැටියට යමක් ඉගෙනගන්න පුළුවන් කාරණා තිබුණා. අපි මහජන නියෝජිතයෝ උනාම අපි උපායශීලීව භාවිතා කරන්න ඕනා කාරණාත් එතුමාගේ දෙවැනි යෝජනාවේ තිබුනා. අපට ඒ මුදල් ප්‍රතිපාදන ලබා ගන්න කොට එතුමා කියනවා අපි ඔයවල් සම්බන්ධ මාතෘකාව මේකට දාලා ප්‍රාදේශීය සභාවෙන් ඒක ගලපාගන්න කියලා. අපි ඔය යෝජනාවට කුඩා ඔයෙන් එන වතුර වලින් වන හානිය වළක්වා ගැනීම සඳහා පැති බැම්ම ඉදිකිරීම තියෙන යෝජනාව ඕකේ ඇතුල් වෙන්න ඕන. ඇතුල් වුනාම ඒ මුදල් ප්‍රතිපාදන අපිට ගන්න පුළුවන් වෙනවා. ගියපාර මුදල් ප්‍රතිපාදන වෙන් වෙනකොට ගිය ආණ්ඩුවේ දුන්නනේ නාය යන ඉවුරු වලට පැති බැම් ඉදි කරන්න කියලා. අපි නාය යන ඉවුරු හොය හොයා ඉන්නවා ඒ මුදල් ප්‍රතිපාදනයට යෝජනාවක් දාගන්න බැරිව.ඒ වෙලාවේ අපිට තිබ්බා ඇලක ඉවුරක් නාය යන මෙම ඉවුර දාගන්න කියන යෝජනාව දැම්මනම් ගලපගන්න තිබුණා. තිබෙන නීත්‍යානුකූලභාවයටඕක ගලපාගන්න අපි උපායශීලී වෙන්න ඕනේ. උපායශීලී වීමේ පාඩමත් විපක්ෂනායකතුමාගේ කතාවේ තිබුණා අපට ඉගෙන ගන්න. ඒ මුදල් ප්‍රතිපාදන විදේශ ආධාර වලින් එනවනම් සමහරවිට ඔය සඳහා යෝජනා ගොඩක් එන්නේ නැති එකක් ඔය විෂය. ඒ මූල්‍ය පැත්තට යෝජනා එන්නේ නෑ. ඔය අර්බුදය නිසාම යෝජනා යොමු වෙන්නේ නෑ. ඒ නිසා අපට ඔය ප්‍රශ්නය විසඳගන්න මුදල් ප්‍රතිපාදනයක් ලබාගන්න පුළුවන් මහඟු අවස්ථාවක් වෙයි ඕක. අලව්ව නගරය පුළුල් කර ගන්න විදියක් අපට නෑ. භූගෝලීය පිහිටීම මේ නගරයේ දියුණුවට විශාල බාධාවක්. මම එදා ඉඳන් කියන්නෙ ඉදිගහමුල වෙල්යායෙන් වැරැල්ලගම දක්වා ලොකු මාර්ගයක් දාලා ඔය කුඹුරුයාය ගොඩ කරන්න ඕනෑ කියලා. හොඳ ඇල පද්ධතියකුයි හොඳ මාර්ග පද්ධතියකුයි දාලා ඔය කුඹුරු යාය ගොඩ කරන්න අවසර දෙන්න ඕන. එහෙම දුන්නොත් මේ නගරය අලව්වේ අර එදා තිබුණ අභිමානවත් ගතිය අපිට රැක ගන්න පුළුවන් වෙයි. එහෙම නැත්නම්අපි කවුරුත් කතා කර කර හිටියත් පාලමෙන් එහා පැත්තේ තියෙන භූගෝලීය ලක්ෂණත් එක්ක, ඒවට තියෙන සහයෝගයත්, කැප වීමත් එක්ක ඒ ප්‍රාදේශීය සභාව සහයෝගය දුන්නත් නොදුන්නත් ඒක සංවර්ධනය වෙන එක නවත්වන්න බැරි වෙනවා.අලව්ව නගරය හීන වෙච්ච නගරයක් බවට පත්වෙනවා. නගරයක් දියුණු වෙනවා නම් අපි තේරුම් ගත යුතු තවත් කාරණාවක් තමයි නගරයේ මාර්ග පද්ධතියත් වැඩිවෙන්න ඕනෑ.වීථි වැඩි වුණනගර තමයි ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙන්නේ.ඒ නිසා අපි ඔය ලංකා බැංකුව ඇතුළෙන් එන මාර්ගය ප්‍රාදේශීය සභාවක් හැටියට ලොකු මෙහෙවරක් වෙයි බස් නැවතුමට සම්බන්ධ කරගන්න පුලුවන්නම්. අඹගස්වීදියෙන් එන මාර්ගය පුළුල් කරන්න පුළුවන් නම් තමයි මේ අලව්ව නගරය හැදෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ නිවස පිටිපස්සෙන් යන පාර රාහුල පිරිවෙන ගාවටම හදන්න ඕන. එවැනි සංවර්ධන ක්‍රියාවලියකට ගියොත් තමයි අලව්ව නගරය දියුණු කරන්න පුළුවන්. අලව්ව කිව්වම ලංකාවේ ඕනෑම පුද්ගලයෙක් දන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපි දන්නවා සඳකිරණ ගොඩනැගිල්ලේ ඒ අය ඒ පැත්තට වතුර දාපුවම උඩ තට්ටුවට වෙලා ඉන්නවා වතුර බහිනකල්. ඒ පැත්තේ ජනතාවට ඒකට පිළිතුරක් ලැබෙනවා මේ යෝජනාව ක්‍රියාත්මක කරගන්න හැකිවුනොත්. මේ යෝජනාව ඉතාම වැදගත්. මට මතකයි මේ සභාව මුල් භාගයේ අපි ඔය පිළිබඳව යෝජනාවක් යොමු කළා. දුම්රිය මාර්ගයත් ප්‍රධාන මාර්ගයත් දෙකම කවදාහරි ඔයට ජේදිලා යනවා. මේ තත්ත්වය අපි විදේශ ආධාර ලබාගෙන හෝ ඉෂ්ට සිද්ධ කරන්න කියලා. එයට අවධානය යොමු වීම පිළිබඳව උත්තර එවලා තිබුණා. දැනගන්න ලැබුණා අපේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමත් සම්බන්ධ වෙලා සාකච්ඡාවක් තිබුණා කියලා. එහෙම අවධානය යොමු වෙලා ඒ පිළිබඳව කටයුතු කරන්න අදාල අමාත්‍යාංශ වලට රුකුලක් වෙනවා. මේ වගේ යෝජනා අපේ සභාවට කරන්න බැරි උනාට ඉෂ්ට සිද්ධ කර ගන්න අවස්ථාව ලැබෙනවා. වලකුඹුර ප්‍රධාන බැම්ම ඒ වගේ ඒවා අපිට සභා බල ප්‍රදේශයේ තිබෙන ප්‍රශ්න අපිට කරන්න බැරි ඒවා අපේ ජනතාවට බලපාන ප්‍රශ්න අමාත්‍යාංශ වලට යොමු කිරීම අපේ මේ පුංචි ආයතන වලට කරන්න පුළුවන්. විපක්ෂ නායකතුමත් පිළිතුරක් දීලා තිබෙනවා මේ අමාත්‍යාංශ මුදල්වලින් නොවෙයි, විදේශ ආයෝජන එනවා. එවන් අවස්ථාවකට මේක යොමු කරන්න පුළුවන් මේ යෝජනාව පැහැදිලිව සඳහන් කරලා යොමු කෙරුවොත්. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඒ අනුව ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා විෂය භාර අමාත්‍යතුමාට, ගරු ජනාධිපතිතුමාට ලිපි යොමු කිරීම සුදුස බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/56 - 05 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගම් මට්ටමේ මේ වන විට පිහිටා ඇති පොදු සුසාන භූමි දෙස බලන විට සමහර භූමිවල ඝන කැලෑ වැවී මහ ගස් වැවී ඇති අතර අක්කරය දෙක වෙන්කර ඇති භූමි ගම්වැසියන් විසින් මේ වන විට පුංචි ප්‍රමාණයන් සුද්ධ කර භූමදාන කටයුතු කරගනී. එය අපට පෙනෙන කරුණකි. සමහර ස්ථාන වල මිනිය තබා ගැනීමට තාවකාලික සාදා ඇති ගෙයක් ද නොමැත. විශේෂයෙන්ම මෙම භූමි පෙර ගම් සභා ක්‍රමය යටතේ වෙන් කර ඇති භූමි නිසා වත්මන් ප්‍රාදේශීය සභාවට සුසාන භූමියක අයිතිය ඇති නිසා මෙම ස්ථාන වල වල් කැලය ඉවත් කර වැවී ඇති ගස් (වටිනා, නොවටිනා) කපා ඉවත් කර ටෙන්ඩර් කර එම ආදායම සභාවට ගැනීමත්, ග්‍රාමීය ජනතාවට පහසුවන සේ සුසාන භූමි සභාව සතු JCB යන්ත්‍රය හා කම්කරුවන් යොදවා සුද්ධ කිරීම, සීමා මායිම් දමා කොටු කර ක්‍රමවත්ව සැකසීම සුදුසු බවට යෝජනාකරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ කොට්ඨාශවල තියෙන සුසාන භූමිවල අති විශාල ගස් වැවිලා තිබෙනවා. මරණයක් වුනාම ගමේ අය එකතුවෙලා පොඩි ස්ථානයක් සුද්ද කරගෙන මිනී වළලනවා. මේ සුසාන භූමිවලට ඉඩම් වෙන් කරගත්තේ ගම් සභා යුගයේ හිටපු විදානෙ මහත්තයා විසින්.සෑම ගමකම සුසාන භූමි වෙන්කරලා තිබෙනවා. අද ප්‍රාදේශීය සභාව යටතේ සුසාන භූමි නඩත්තු වෙනවා. නමුත් අද සුසාන භූමියක ගස් කපන්න බෑ. මිනියක් තැන්පත් කරන්න බෑ අවසර නොමැතිව. මේ වගේ නීතිරීති ගොඩක් හරස් වෙනවා. මම වදාවේ අපේ ගම ගැන කතා කරන්නම්. රජයේ ඉඩමෙන් තමයි අක්කරයක් විතර අරන් තිබෙන්නේ එදා හිටපු විදානෙ මහත්තයා. මේ විදානේ මහත්තයාගේ දුව මේ ලඟදි හම්බෙලා කියනවා මේ සුසාන භූමි සුද්ධ කරලා, නිදහස් කරලා දෙන්න කියලා. ඒ වගේම දිවුල්ගහකොටුව සුසාන භූමියේ තනිකර

තිබෙන්නේ කහට ගස්. ඒ අයත් කියනවා මේක සුද්ද කරලා දෙන්න, දර ටික සභාවට ගන්න කියලා. කතෝලික ජනතාවගේ සුසානභූමි හරි ලස්සනට තියෙනවා. අපේ සුසාන භූමි ලස්සනට තිබෙන්නේ ප්‍රධාන නගර වල විතරයි. ගම්වල තිබෙන මේ සුසාන භූමි, ප්‍රාදේශීය සභාවෙන් අනුග්‍රහයක් කරලා යම් වැඩපිළිවෙළකට පිළිසකර කරලා දෙන්න කියලා මම යෝජනාව කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉතාම වටිනා යෝජනාවක් එතුමා ගෙන ආවේ. අපේ ප්‍රදේශවල තිබෙන සෑම සුසාන භූමියක්ම වල් බිහිවෙලා වටේට ඉන්න අය ඒවගේ කොටස් අත්පත් කරගෙන තිබෙනවා.ඒ වගේම තිබෙන ගස් කපා ගන්නවා. ඔය වගේ සිදුවීමක් ලඟදි මඩවල සුසාන භූමියෙත් සිදු වුණා. ඒ වගේම දෙයක් තමයි මීරිහෙලියේ සුසාන භූමියෙත් සිදුවුණේ. භූමිය අපේ කියනවා. ගස් ටික වන රක්ෂණ දෙපාර්තමේන්තුවේ, දැව සංස්ථාවේ අයිතිය කියනවා. අපට තිබෙන්නේ භූමිය විතරයි. අපේ ජනතාවට ඉතුරු කරල තිබෙන්නේ හතර රියන විතරයි. ඒ තියෙන ගහ කොළ එලදාව අපට අයිති නෑ. අප බල ප්‍රදේශයේ සභාව සතුව තිබෙන්නා වූ සියලුම සුසානභූමි සියල්ල ලේඛන ගත කරලා, එහි ප්‍රමාණයන් මැනුම් කටයුතු කරලා,ඒවා එළි පෙහෙලි කරලා, සීමා ලකුණු කරලා, ඒ ප්‍රදේශයේ තිබෙන මරණාධාර සමිතියට හෝ ස්වේච්ඡා සංවිධානයකට නීත්‍යානුකූලව ඒ තියෙන ප්‍රමාණයන් දැනුවත් කරලා, එහි භාරකාරීත්වය සහ නඩත්තු කටයුතු කිරීම සමිතියකට භාර දුන්නා නම් ක්‍රමවත්ව කෙරීගෙන යනවා. අද සුසාන භූමිවල වැටවල් ඇවිදගෙන යනවා.ඒ නිසා එම යෝජනාව ක්‍රියාත්මක කරමු කියමින් මම නිහඬ වෙනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගම් මට්ටමේ මේ වන විට පිහිටා ඇති පොදු සුසාන භූමිවල වල් කැලය ඉවත් කර වැවී ඇති ගස් (වටිනා, නොවටිනා) කපා ඉවත් කර ටෙන්ඩර් කර එම ආදායම සභාවට ගැනීමත්, ග්‍රාමීය ජනතාවට පහසුවන සේ සුසාන භූමි සභාව සතු JCB යන්ත්‍රය හා කම්කරුවන් යොදවා සුද්ධ කිරීම, සීමා මායිම් දමා කොටු කර ක්‍රමවත්ව සැකසීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**(05-6)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/56 - 06 දරණ යෝජනාව</u>**
අප සභාවට අයත් සුසාන භූමිවල හා අනෙකුත් ඉඩම්වල සියළු වටිනා ගස් ලේඛනගත කල යුතු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, සභාව සතු සභාව සතුව සුසාන භූමි වල හා සභාව සතු ඉඩම් වල සියලු වටිනා ගස් ලේඛනගත කිරීම සුදුසුයි. ඒත් එක්කම රත්නායක සභාපතිතුමා ගේ කාලයේ අලව්වේ පොළට සම්පූර්ණ ලී ලී දඬු ලබා දුන්නේ මේ ඉඩම්වලින්. ඒ විතරක් නොවෙයි බෝයවලාන පොළත් හැදුවා. දඹදෙණිය පොළත් හැදුවා ඒ ලී දඬු උපයෝගී කරගෙන. අපි අද බොහෝ සුසානභූමිවල දකිනවා විශාල වටිනා ගස් තිබෙනවා. සමහර අවස්ථාවල අපි ස්වේච්ඡා සංවිධානවලට, මරණාධාර සමිති වලට ඒ ගස් පරිත්‍යාග කරපු අවස්ථා එමටයි. මේව සභාවෙ වත්කම් හැටියට ලබාගැනීම වැදගත් කියලා හිතලා තමයි යෝජනාව දැම්මේ. වියදමක් යන එකක් නෙවෙයි. ඒ නිසා මම හිතනවා මේ පිළිබඳව අවධානය යොමු කරල කටයුතු කරනවා නම් හොඳයි කියලා

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ යෝජනා දෙකම එක හා සමානයි. ගාමිණී මන්ත්‍රීතුමාත් මේ සුසාන භූමිවල නිරවුල්භාවය ඒවා ආරක්ෂා කර ගැනීම, නඩත්තු කර ගැනීම සම්බන්ධව සඳහන් කරලා තිබෙනවා. මේ යෝජනාව මේ සභාව පටන් අරන් 2018 සන්ධ්‍යා සභාපතිතුමාටත් අපි ඉදිරිපත් කරලා තිබුණා. ඒවා නිරවුල් කරලා, මාර්ග නිරවුල් කරලා,සුසානභූමි කම්බි ගහගන්න කියලා කිව්වා. ඒ වෙලාවෙත් මුදල් ප්‍රශ්නයක් හින්දා ඒ කනු හිටවන්නත් බෑ කිව්වා. නිරවුල් කරන්නත්අපහසුයි කිව්වා. ඒවට වියදමක් දන්නැතුව ඔබතුමාලා කියපු යෝජනා දෙකම අධ්‍යයනය කරන්න පුළුවන්.එහෙම කරල අපිට අයිති සුසාන භූමි ටික ලේඛනගත කරන්න පුළුවන්. ඒ ලේඛනගත කරහම අපිටත් අභිමානයක්. මොකද හැම කොට්ටාශයේම ඉන්න මන්ත්‍රීවරුන්ගේ යුතුමක් තමයි මේ ටික ආරක්ෂා කරන එක. අපිට පුලුවන්නම් අපේ නිලධාරීන් යොමු කරලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමත් සම්බන්ධ කරලා මේ සුසාන භූමිවල තොරතුරු ගන්න, අරගෙන අපි ප්ලෑන් එකක් හදමු. එය ක්‍රියාත්මක කිරීම කවදා කරන්න පුළුවන් වුණත් ප්ලෑන් එක අපි අරන් තිබෙනවා.දැන් අපි ළඟ එහෙම ප්ලෑන් එකක් නැහැ. කුරගමුවෙ තිබෙන ඉඩම අක්කරයකට වැඩියි. අපි ඒක බදුදෙනවා. නමුත් ලොකු ආදායමක් අපිට එන්නෙ නෑ. අපි මේ සුසාන භූමි මැන්නොත් වටේ ඉඩම්වලින් සුසාන භූමියට තව එන්න ඕනැ. මොකද ඒ අය ඉඩම් අල්ලගෙන ඉන්නේ. අපි නිලධාරී මාර්ගයෙන් මේකට හොඳ වැඩපිළිවෙළක් සකස් කරමු. මරණාධාර සමිති එක්ක ඒකාබද්ධවයනවනම් අපිට මේක පහසු වෙනවා. ඒ වගේම අපි සමග සම්බන්ධතා දක්වන්න පුළුවන්. මේ යෝජනා දෙකම ක්‍රියාත්මක කරමු කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා.

ඒ අනුව අප සභාවට අයත් සුසාන භූමිවල හා අනෙකුත් ඉඩම්වල සියළු වටිනා ගස් ලේඛනගත කල යුතු බවට ගෙන ආ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-7)**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/56 - 07 දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමියට යාබදව ඇති රක්ෂිතයෙන් ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා රක්ෂිතයේ අක්කරයක භූමි ප්‍රමාණයක් ලබා ගැනීමට යෝජනා කරන අතර මෙය අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමුකිරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේක කාලයක් තිස්සේ අපේ මහජන නියෝජිතයින් ගණනාවක් ඉල්ලපු කාරණයක්. අපි පහල මට්ටමින් කතා කරලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යද්දි මොකක් හෝ බලපෑමක් එල්ල වෙනවා නිලධාරී පැත්තෙන්. මහජන නියෝජිතයෝ කැපවීම් කළත් නිලධාරී පැත්තෙන් මේක නවතිනවා. දැව සංස්ථාවේ ඉඳලා විශ්‍රාම ගිය මහත්මයෙක් ඉන්නවා අර බෝවල ඉඩම් ප්‍රශ්නයේ දී එය නිවැරදි කරන්න උදවු කළ නායකයෙක්. මම එතුමාගෙන් ඇහුවා අපට දැන් ප්‍රශ්නයක් තිබෙනවා අපේ පොහොර නිෂ්පාදනාගාරය වැඩිදියුණු කරන්න ඕන. අලව්ව නගරයට තිබෙන සුසාන භූමිය කලින් තිබුනේ රෝහල තිබෙන හරියේ. එතනින් පස්සේ ඒක එහාට ගෙනගියා. සුසාන භූමියේ භාගයකට වැඩි ප්‍රමාණයක් අපි මේ වෙනකොට පොහොර නිෂ්පාදනාගාරය සඳහා භාවිතා කරනවා. අපි කොහොමද මේකට ඉඩමක් ලබා ගන්න යන්නේ. එතුමා කිව්වා බිම් මට්ටමෙන් මේක ගිහිල්ලා අපේ පැත්තේදි මේක නතර කරන එක නේද වෙන්නේ හැමදාම. ඒ නිසා කිව්වා ගරු සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරලා සභාවේ මහජන නියෝජිතයෝ හැටියට හැමදෙනාගේම කැමැත්තෙන් මේ යෝජනාව ජනාධිපතිතුමා ළඟට

අරගෙන යන්න, ගිහිල්ලා කියන්න සභාවේ ඉල්ලීමක් තියෙනවා විෂයභාර ඇමතිතුමාට කතා කරලා මේක නිදහස් කරලා දෙන්න කියලා. අක්කර භාගයක් ඉල්ලන්න එපා. අක්කරයක් හරි ඉල්ලුවොත් තමයි අපිට භාගයක් හරි ගන්න පුළුවන් වෙන්නේ. ඒ අනුව ගරු සභාපතිතුමියනි අපිට සුසානභූමි තිබෙනවා 70 ක්. මේ සුසාන භූමි70 න් පෞද්ගලික මිනිස්සුන්ගේ කොල්ලකෑමට ලක් නොවුණු එකම සුසාන භූමිය ඕක. අපට කවදාහරි පත්වෙලා එන සභාපතිවරයෙකුට, මන්ත්‍රී මණ්ඩලයට ආදාහනාගාරයක් ඉදිකරන්න නම් අපි භූමියක් ලබලා දීලා ගියොත් ඊළඟට කෙනාට පුළුවන් වෙනවා ඉදිරි කටයුතු නිසි ආකාරයට කරන්න. ඒ නිසයි ගරු සභාවට මේ ඉල්ලීම කලේ. අපිට අද ආදාහනාගාරයක අවශ්‍යතාවය තිබෙනවා. ඒ වගේම පහුගිය කොරෝනා කාලයේ අපි දැක්කා ආදාහනාගාරයක අවශ්‍යතාවය. ඒ වගේම ගමේ මිනී පිට්ටනියේ වටිනාකම. හදිසි අනතුරක් වෙලා පුද්ගලයකු මිය ගියහම ඔහුගේ දේහයට අවසර දෙන්නේ පුච්චන්න කියලා නොවෙයි, වළලන්න කියලා. අපට දේහයන් තැන්පත් කරන්න තියන උඩ කොටසේ බෑ ආදාහනාගාරයක් ඉදි කරන්න.මේ ඉල්ලීම කළේ විශේෂයෙන්ම අපේ සුසානභූමි70 ක අයිතිවාසිකම් පිළිබඳ අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් විවිධ යෝජනා ගෙනාවා. ශ්‍රියානි මන්ත්‍රීතුමියත් ඒ කාලේ ඔය යෝජනාව ගෙනාවා. 2005 අපි සභාවට ගියාමත් සුසාන භූමි රැක ගන්න කතා කලා. අපිට ආදාහනාගාරයක් ඉදි කරන්න භූමිය වෙන් කරලා දෙන්න පුළුවන් නම් අක්කරයක් අපිට පොහොර නිෂ්පාදන ආකාරයේ වැඩිදියුණු කරන්න ඉඩ අවශ්‍ය නිසා ඒ එක්කම තියෙන කොස් කැලෙන් අක්කරයක භූමි ප්‍රමාණය ලබා ගැනීම සඳහා ගරු ජනාධිපතිතුමාට ලිපි යොමු කරලා අවශ්‍ය කටයුතු ටික මේ සභාවේ කරලා දෙන්න කියලා ඉල්ලීම් කරනවා. ඒ සඳහා ඔබ සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරුසභාපතිතුමියනි, ආදාහනාගාරයක් හදන්න කියලා නාරම්මල ප්‍රාදේශීය සභාවේ ගාමිණී ගුණදාස සභාපතිතුමාගේ කාලේ මම කරපු යෝජනාව පත්තරෙත් තිබුණා අලව්වට ආදාහනාගාරයක් කියලා මට මතකයි. අලව්වට කියපුවාම නාරම්මල නෙමේ හදන්න තිබුණේ මෙහේ. ඒක අදත් බැරි වුණා. ආදාහනාගාරයට මුදල් පාස් වුණත් ස්ථානයක් නෑ. ස්ථානයක් ගැන කතා කරාම මෙතුමා කියන තැන සුදුසුයි. මොකද අලව්ව සභාවේ පොදු කේන්ද්‍රස්ථානය මේ කිට්ටුව ඉඩම් කෑබැල්ලක්. එතකොට ඔය කියන තැන හොඳයි. සුසාන භූමිය ළඟ රජයට අයිති ඉඩමෙන් අක්කර දෙකක් විතර ඉල්ලමු. එතකොට අක්කරයක්වත් ලැබෙයි. පළමුව අපි මේ ස්ථානය ගමු. මෙය ඉතාම වැදගත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතාම හොඳ යෝජනාවක්. අපි මේක සාකච්ඡා කරලා තමයි මේ යෝජනාව දැම්මේ උත්සාහයක් ගන්න. ඒ නිසා මෙතුමාට ඒක සාර්ථක කරගන්න පුළුවන් කියන විශ්වාසය මට තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමියනි, අපි අක්කර දෙකක් ඉල්ලන්නේ ආදාහනාගාරයට විතරක් නෙවෙයි පොහොර නිෂ්පාදනාගාරයටත් එක්ක. ඒකත් සඳහන් කරනවා නම් හොඳයි.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමියට යාබදව ඇති රක්ෂිතයෙන් ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා රක්ෂිතයේ අක්කරයක භූමි ප්‍රමාණයක් ලබා ගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මතක විය.

**(05-8)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/56 - 08 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සේවකයින් 2021 සහ 2022 වර්ෂය පුරා පැවති කොරෝනා වසංගත තත්වය හා ඉන්ධන අර්බුදය හමුවේ, අඛණ්ඩව සේවාව ලබා දෙමින් නගර පවිත්‍රතාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සිදු කළ සේවාව ඇගයීමට කටයුතු සංවිධානය කර ඇත. එම වැඩසටහන 2022.12.30 යන දින තුළ පැවැත්වීමටත් මෙම වැඩසටහන සඳහා රු.149,000.00ක්

වැය දැරීමට සිදු වන අතර එම මුදල් සෞඛ්‍ය විෂය (අපද්‍රව්‍ය කළමනාකරණ) යටතේ පහත සඳහන් වැය ශීර්ෂවලින් ප්‍රතිපාදන සලසා ගැනීමත් සුදුසු බවට යෝජනා කරමි.

| | | | |
|---|---|---|---|
| 2.5 | - | 202-1 වැය ශීර්ෂයෙන් | රු. 25000.00 |
| 6.6 | - | 607-28 වැය ශීර්ෂයෙන් | රු. 25000.00 |
| 6.6 | - | 607-13 වැය ශීර්ෂයෙන් | රු. 39000.00 |
| 6.6 | - | 607-22 වැය ශීර්ෂයෙන් | රු. 60000.00 |
| එකතුව | | | රු.149,000.00 |

**2022.12.30 දින සෞඛ්‍ය සේවක ඇගයීම සඳහා වියදම් ඇස්තමේනතුව**

| අනු අංකය | වැඩසටහන් විස්තරය | ඒකකයක වටිනාකම | ඇස්තමේන්තු මුදල රු. ශත. |
|---|---|---|---|
| 01 | වැඩසටහනට සහභාගීවන 45 දෙනෙක් සඳහා උදේ තේ සංග්‍රහය<br>කේක් 4 kg<br>කිරි පැකට් 45 | 1 × 4 × 1,200.00<br>1 × 120.00 × 45 | 4,800.00<br>5,400.00 |
| 02 | වැඩසටහනටසහභාගී වන 45 දෙනා ඇතුළුව විෂය නිලධාරීන්, සහභාගීවන අමුත්තන්, සහායකයින් ඇතුළුව දිවා ආහාර 45 ක් ලබා ගැනීම, අතුරු පස සමඟ | 1 × 1,000.00 × 45 | 45,000.00 |
| 03 | දේශනය සඳහා සහභාගී වන වෛද්‍ය නිළධාරීතුමා සඳහා අය කිරීම | 1 × 12,000.00 × 01 | 12,000.00 |
| 04 | වතුර බෝතල් ලීටර් 500 ml | 1 × 100.00 ×45 | 4,500.00 |
| 05 | සංගීත සාදයසඳහා සංගීත කණ්ඩායම අය කිරීම | 1 × 16,000.00 × 01 | 16,000.00 |
| 06 | සෞඛ්‍ය සේවකයින් සඳහාරු.2000.00 ක වියළි ආහාර මල්ලක් ලබා දීම. | 1 × 2000.00 ×28 | 56,000.00 |
| 07 | වෙනත් වියදම් | 1 × 5300.00 ×01 | 5300.00 |
| **එකතුව** | | | **149,000.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. අපේ සේවක මහත්මයෙක් රාජකාරි කරන වෙලාව අතරතුර මිය යනවා. ඇත්තෙන්ම දුක්බර අවස්ථාවක්. මේ සභාවේ සේවකයෝ ඉන්නවා 160 ක් විතර. මන්ත්‍රී මණ්ඩලය ගත්තොත් 28 ක්. අපි කිසිම කෙනෙක් කිසි වේලාවක අපේ ශරීරය ගැන හිතන්නෑ. ප්‍රශ්නත් එක්ක තමා ජීවිතය ගෙන යන්නේ. ඔය සිදුවීම වෙලා ගරු සභාපතිතුමිය මට දුරකථන ඇමතුමක් දීලා කිව්වා. සභාපතිවරියක් හැටියට ඔබතුමිය වගකීමෙන් කතා කලා. ඊට පස්සේ කතා කරලා අලව්ව දිසා රෝහලෙහි සේවයේ නියතු සරත් මහත්තයාට. මම කිව්වා අපේ සේවක මහත්මයාගේ කටයුතු වෙනුවෙන් ඔබලා ලොකු කැපවීමක් කළා, අපට දැන් උදව්වක් ඕන කියලා. අපේ සභාවේ ඉන්න සියලු දෙනාගේම මාස හයකට වතාවක් සම්පූර්ණ ශරීර පරීක්ෂණයක් කර ගන්න අපට පෞද්ගලික රෝහලකට ගියත් රුපියල් 30,000.00 ක් විතර යනවා මේ කටයුතු කරලා දෙන්න හැකියාවක් තියෙනවද කියලා. එතුමා කිව්වා පැහැදිලිවම පුළුවන්. සභාවෙන් අපිට උදව් තියෙනවා වගේම සභාවේ සේවකයෝ ඔක්කොටම වඩා අපට වටිනවා. ඒ නිසා ගරු සභාවේ අවධානය යොමු කරලා අපේ ප්‍රධාන

වෛද්‍යතුමාට මේ සභාවේ ලිපියක් එවන්න මහා සභාවේ යෝජනාවක් හැටියට. ඒ ලිපිය අනුව සභාවේ නගර ශාලාව තුළට අපි ඇවිල්ලා අපේ ඉන්න 190 දෙකට බෙදලා දවස් දෙකකට අරගෙන එයාලා කාර්යමණ්ඩලය 10 ක් එන්නම් කිව්වා. එහෙම කරලා සම්පූර්ණ ලේ වාර්තාවක් අරගෙන අපේ අක්මාව, වකුගඩු, කාන්තාවන්ගේ පියයුරු පිළිකා, ගර්භාෂ පිළිකා මේ සියල්ල පිළිබඳව වාර්තාවක් හදලා හැමෝටම වාර්තාවක් දෙන්න කිව්වා. අවශ්‍ය කරන බෙහෙත් ගන්න එකත් අලව්ව දිසා රෝහලෙන් කරලා දෙන්නම් කිව්වා. ඒ නිසා විශේෂයෙන් මේ අවස්ථාවේ මම ඉල්ලීමක් කරනවා ඔබතුමියට. ඔබතුමිය සේවක මහතුන්ගේ සුභ සාධනයන් පිළිබඳව ගෙනා යෝජනාවත් එක්ක මේ කටයුත්තත් එකතු කරන්න. එකතු කරලා මේ යෝජනාව යවන්න. මේ මාසය ඇතුළතම දිනයක් දෙන්නම් කිව්වා. මොකද අපේ සේවක මහතෙකු මිය ගියා. නැවත එවන් දෙයක් නොවෙන්න නම් අපි දීර්ඝ කාලීන වැඩපිළිවෙලකට යන්න අවශ්‍යයි. ඒ වගේම එතුමත් මගෙන් ඉල්ලීමක් කළා. අලව්ව දිසා රෝහල ඉතාම ගෞරවාන්විතව තිබුන රෝහලක්. වැත්තැව යුගය, විජේකෝන් යුගය, මේ යුග දෙකේම මේ රෝහල බැබළුනා. අපිත් මේ රෝහලේ ඉපදුන දරුවෝ. හැබැයි අද වෙනකොට අලව්ව රෝහල හුවමාරු මධ්‍යස්ථානයක්. රෝහල, මූලික රෝහලක් කිරීමට අවශ්‍ය තැනට ඇවිල්ලා තිබෙනවා. ඒ ටික කෙරෙන්නේ නැතුව තිබෙන්නේ. මූලික රෝහලක් කර ගත්තොත් අපට විශේෂඥ වෛද්‍යවරුන්ගේ පහසුකම් ලැබෙනවා. ඒ සම්බන්ධවත් ඇතුල් කරලා ගරු ජනාධිපතිතුමාට ඉල්ලීමක් කරලා යවන්න විෂයභාර ඇමතිතුමාට නියෝගයක් දෙන්න කියලා මේක මූලික රෝහල කිරීමේ කටයුතු අවසන් කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභාවට ලොකු දායකත්වයක්, ලොකු ශක්තියක් ලබාදෙන සභා බල ප්‍රදේශය සහ ප්‍රධාන නගරය පිරිසිදුව තබා ගනිමින් එය සියල්ල නොපිරිහෙලා ඉටුකරන අපේ සෞඛ්‍ය කම්කරු මහතුන්හට කරන ඒ සුබසාධන වැඩපිළිවෙළ ඇත්තටම ඉතාම වටිනවා. මොකද ඒ අය නිසා තමයි අපි නහය තියාගෙන නගරයේ යන්නේ. කොරෝනා කාලයේදී අපි සියලු දෙනා නිවෙස් වල ඉද්දි මේ අය තමයි නගරය හා මේ මාර්ග පිරිසිදු කරලා දුන්නේ. ඒ අයට මේ සුභසාධන වැඩපිළිවෙලක් කිරීම ඇත්තටම ඉතාම වටිනවා. මේකට මීට වැඩිය වියදම් වුනත් ප්‍රශ්නයක් නෑ. මේකෙ තියෙන සියලුම ජරාව අතගාන්නේ මේ ගොල්ලො. විපක්ෂ නායකතුමා කිව්වා වගේ මාස 06 කට වරක්වත් ඒ සියලු දෙනාගේ ශරීර සුවතාවය, ඒ සෞඛ්‍ය තත්ත්වය පරික්ෂා කරලා, අවශ්‍ය කරන උපදෙස් දීලා, ඒ අවශ්‍ය කරන සනීපාරක්ෂක වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කරලා, අවශ්‍ය කරන ආරක්ෂිත ඇඳුම්, සපත්තු අරන් දීලා මේ අයව සතුටින් තියන්න ඕනෑ. මොකද ගොඩක් ඉන්නේ දෛනික වැටුප් ලබන අය නිසා. මොකද ඒ අයට සේවා කාලයේ ඉවර උනාට පස්සේ එයාලා වයසට ගියාම විශ්‍රාම වැටුපක්වත් නෑ. ඔය සේවකයන්ගේ හිසට වහලක්වත් හරියට නෑ. එවන් පසුබිමක ඉඳගෙන මෙවැනි කැප කිරීමක් කරන මේ සේවක මහතුන්ට මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගෞරවය පුද කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කොරෝනා කාලයේ මේ අය ඉතා කැපවීමෙන් කටයුතු කළා. නමුත් මේ ඇස්තමේන්තුව දිහා බැලුවම සෞඛ්‍ය සේවකයන් ඇගයීමට වියළි ආහාර ද්‍රව්‍ය මල්ලක් දීමට රුපියල් 56,000.00 ක් වියදම් කරනවා. සම්පූර්ණ ඇස්තමේන්තුව 149,000.00 යි. තේ පැන් සංග්‍රහයට යන වියදම්, වැඩසටහනට සහභාගී වෙන අයට කෑමට බීමට යන වියදම් ටික බලපුවාම තව ලක්ෂයක් විතර තියෙනවා. ඇත්තටම අපි අගයන්න ඕන සෞඛ්‍ය සේවක මහතුන්. මේ 149,000.00 ම ඒ අයට යන විදිහට මේ සභාවට ඒ අය ගෙනල්ලා ඇගයීම කලත් එයාලට සාධාරණයක් වෙනවා. මම දකින්නේ නෑ එයාලට මේකෙ සාධාරණයක් වෙනවා. මේක මීට වඩා ඵලදායි ආකාරයකට ඒ අයට ගෞරවයක් පුද කරලා මේක දෙන්න පුළුවන් නම් හොඳයි. ඇත්තටම මේකේ අනවශ්‍ය වියදම් අඩු කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මටත් හිතුනේ ඒ මන්ත්‍රීතුමා කියපු අදහසමයි. මේ සියළු මුදල් සෞඛ්‍ය සේවකයන්ට ලබා දෙනවා නම් ඒක මමත් අගය කරනවා. ඒ වගේ කැප කිරීමක් කරපු අයට රුපියල් 2000 ක බඩුමල්ලක් දීම ප්‍රමාණවත් නෑ කියලා තමයි මමත් හිතන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙවැනි වැඩසටහනක් යෝජනා කරලා ක්‍රියාත්මක කිරීම පිළිබඳව මගේ ගෞරවය පුද කරනවා. ඔහුගේ කෝරෝනා කාලයේ තමුන්ගේ ජීවිත අවදානමවත් නොතකා සේවය කළ සේවක මහතුන් ඇගයීම ඇත්තටම අපි අගය කරන්න ඕනෑ. මන්ත්‍රීතුමා අදහස් දැක්වූ වාගේ මේ රුපියල් 2000 ක බඩු මල්ල ප්‍රමාණවත් නෑ කියන අපි පිළිගන්නවා. වසරකට එක දවසක් හරි තමන්ගෙ ක්ෂේත්‍රයේ ඉන්න සියලු දෙනා එකතු වෙලා, සතුටු සාමීචියේ යෙදිලා, තමන්ගේ ගැටළු සුහදතාවයෙන් විසඳාගන්න එක පිළිබඳව සියලු දෙනාගේ කැමැත්තක් තිබෙනවා. ඔවුන්ගේ සුහදශීලී කම ඒ ලැබෙන බඩු මල්ලට වඩා ප්‍රමාණවත් වෙන්න පුළුවන්. ඔවුන්ට ඒක වටිනවා වෙන්න පුළුවන්. ඒත් එක්කම සංගීත සාදය හා සංගීත කණ්ඩායමට රුපියල් 16,000.00 ක් දාලා තිබෙනවා. මේ කාලයේ මෙවැනි මුදලකට සංගීත කණ්ඩායමක් ලබාගැනීමට හැකියාවක් තියෙනවද කියන එක පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා මතක් කරනවා. ඒ වගේම විපක්ෂ නායකතුමා කිව්වා සෞඛ්‍ය පරීක්ෂණයකට මේ අය යොමු කරන්න අවශ්‍යයි කියලා. ඇත්තටම ඒක හොඳ අදහසක් වගේම අලව්ව රෝහල මූලික රෝහල බවට පත් කිරීමේ කටයුතු පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සේවක ඇගයීම ඉතාම හොඳ දෙයක්. ඒ සේවකයින්ගෙනුත් ඉතාම පල්ලෙහා මට්ටමේ ඉන්න කසල කම්කරුවෝ තමයි අපි අගයන්න ඕන. මොකද අපේ සභාවේ මේ කුණු කසළ ඉවත් කිරීම ඉතා ක්‍රමවත්ව කළා. මම අහල තියනවා අලව්ව නගරය කුණු ටික ඇදලා එළිවෙනකොට ලස්සනට තියෙනවා කියලා. ඒගෞරවය අපට තියෙනවා. එය කරල තියෙන්නෙ කම්කරු මහත්වරු. ඔවුන් ඇගයීමේදී අපේ මන්ත්‍රීවරු කිව්වා වගේ යන සම්පූර්ණ මුදලින් 95% ක්ම ඒ අය වෙනුවෙන් යොදවමු. ඒ අයට අඩුම රු. 5000 ක් වත් එන විදියට ඇස්තමේන්තුවක් හදලා මුළු මුදල ලක්ෂ 2 කට ගියත් කමක් නෑ. ඒ අයට ඒක දීලා, සේවක මහතුන්ටත් සිංදු කියන්න පුළුවන් විදිහට, අපි සියලු දෙනා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ගොඩනැගෙන ආකාරයට මේක කරන්න. ඕන නම් තව වතාවක් සාකච්ඡා කරලා මේ කොහොමද කරන්න ඕනෑ කියලා තීරණය කරලා ක්‍රියාත්මක කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේක මගේ පුද්ගලික යෝජනාවක්. මම එක සේවකයෙකුට රුපියල් 5000 ක මුදලක් ලබා දෙන්න පුළුවන් නම් සුදුසුයි කියලා යෝජනා කරන ගමන්ම ඒ සඳහා වියදම් දැරීමට අපට වැය ශීර්ෂ මාරු කරගන්න පුලුවන් ස්ථානයකින් ඒ මුදල මාරු කරගෙන ඒ සඳහා ගෙවීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සේවක මහතුන් බොහොම කැපවීමෙන් නගරය පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරනවා.මේ අයට රු. 5000 ක බඩු මල්ලක් දෙනවා නම් ඇත්තටම හොඳයි. ඇස්තමේන්තුවේ රුපියල් 45,000 ක් දාල තියනව දිවා ආහාරය හා අතුරුපසට. ඒකෙනුත් මං හිතන්නේ 20,000 ක් 25,000 ක් ගන්න පුළුවන්. ඒ වගේම වෛද්‍යවරයාට රුපියල් 12,000 ක් දාලා තිබෙනවා. ඒකත් අපිට නොමිලේ දේශනයක් දෙන්න වෛද්‍යවරයෙක් කතා කරගන්න පුලුවන්. මම දන්න විශේෂඥ වෛද්‍යවරුත් ඉන්නවා. ඒ වියදමත් අයින් කරලා බඩුමල්ලක් දෙන්න රුපියල් 5000 ක මුදලක් හදාගන්න කියල මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභාවේ ගෞරවනීයභාවය ආරක්ෂා කරන සේවක මණ්ඩලය මේ. මේ අය එක දවසක් කුණු ගත්තේ නැත්නම් මේ සභාවේ අපිට ඉන්න ලැබෙන්නෙ නෑ. ඒ නිසා අපි හැමෝගේම ගෞරවනීයභාවය රකින සේවක මණ්ඩලය වෙනුවෙන් ඇගයීමක් කිරීම පිළිබඳව අපි සියලු මන්ත්‍රීවරු හදවතින්ම සතුටු වෙනවා. අපේ යසිත් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව තමයි කාලෝචිතම යෝජනාව. රු. 5000 ක් දෙමුයි කියන එකයි මේ හැමෝම කියන්නේ. මේකෙදි මම තව චූටි කාරණාවක් මතක් කරනවා. අනවශ්‍ය මුදල් ටික අරගෙන අපි බඩුමල්ලක් හරි රු. 5000 ක් හරි දෙනවා නම් අපි ඒක විතරක් දීලා මේ සේවකයා ගෙදර පිටත් කරලා වැඩකුත් නෑ. පොඩි ඇගයීමකුත් කරන්න ඕනෑ ඔවුන් කරන සේවය පිළිබඳව. මුදල් වියදමක් නැතුව අපි අතර ඒ අයටම සින්දු කියන්න අවස්ථාව ලබා දුන්නම ඒ අය තවත් සතුටු වෙනවා. අන්න ඒ වගේ වැඩපිළිවෙලකට ගිහිල්ලා ඒ අය ඇගයීම හා සතුටු කිරීම කියන කොටසත් මේකේ ඇතුලත් කරගන්න ඕන. එහෙම ගලපලා, අනවශ්‍ය වියදම් ටික අයින් කරලා, ඒ තුල මේක සංවිධානය කරන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගර සභාපතිතුමියනි, ඊළඟ මහ සභාව දවස. එදාට අපි හැමෝම රැස්වෙනවා. එදාට ඔය සේවක මහත්වරුන්ටත් එන්න කිව්වම මේ සභාවේ අපට දෙන තේ එකෙන්ම ඒ ප්‍රශ්නය ඉවරයි. එතකොට බඩු මල්ල දෙන්න කරේ තියාගෙන යන්න පුළුවන් එකක්. මේක ගෙදරට අරන් ගියාම තමයි නෝනා මහත්තුරු සතුටු වෙන්නේ. ගෙදරකට උපරිම බඩු මල්ලක් අරන් යන්න පුළුවන් නම් ඒ ගෙදර දරුමල්ලො උපරිම සතුටු වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මේ මන්ත්‍රීවරු ඒ අය වෙනුවෙන්ම කල්පනා කරලයි අදහස ඉදිරිපත්. කළේ මට අත්දැකීමක් ලැබුණා 2021 අවුරුද්දේ. මේ අය රජත හවන උත්සවශාලාව තමයි ඒ අවුරුද්දේ තෝරගෙන තිබුනෙ මෙම වැඩසටහන සංවිධානය කර ගන්න. මේ නිලධාරීන් කිහිපදෙනා ඒ අයත් එක්ක සාකච්ඡා කරලා ඒ අය කැමති වෙනස් ඇඳුමක් ඇඳගෙන, කණ්ඩායමක් එක්ක එකතුවෙලා, සින්දු කියලා, නටලා, සතුටු වෙන්න.අපි ගිය සැරේ ඒ අයට දුන්නේ වවුචර්එකක්. ඒ අය බලාපොරොත්තු වෙන්නේ ඒ අයට පොඩි නිදහසක්. ගිය සැරේ සමුපකාරයෙන් වවුචරයක් දුන්නේ එතකොට ඒ අයට ගෙදරට බඩු ගෙනියන්න පුළුවන්. ගිය දෙසැම්බර් 31 තිබ්බේ. මේ සැරේ දෙසැම්බර් 30 තියෙන්නේ. ඒකෙන් අපි බලාපොරොත්තු වුනේ ජනවාරි පළවැනිදාට හොඳ ආහාර වේලක් තම පවුලේ සියළු දෙනා සමඟ එකතුව භුක්ති විඳ කවුරුත් සතුටු වෙන්න අවශ්‍ය නිසා. අපට මෙතන වෛද්‍ය දේශනය වෙනස් කරන්න පුළුවන්. තවත් ගන්න පුළුවන් තැනක් තියෙනවනම් අරගෙන ඔබතුමාලා යෝජනා කළා වගේ බඩු මල්ලට වැඩි වටිනාකමක් දෙන්න සූදානම් කරන්නම්. මේකෙදි නිලධාරී ටික දෙනයි මේ කම්කරු අය ටික තමයි සහභාගී වෙලා හිටියේ. මට මතකයි හිටපු සභාපතිතුමා ඉන්න කාලේ මඩවල උත්සව ශාලාවක මේ වගේ උත්සවයක් තිබ්බා. නමුත් මට වැඩි වෙලා ඉන්න ලැබුණෙ නෑ. මම ගියපාර උත්සවය අවසාන වෙනකම්ම වගේ හිටියා. මම සභාපති හැටියට සහභාගි වුණ නිසා. ඒ අය කැමති විදිහට ඒ අයගේ යෝජනා තමයි මේ එකතු කරලා තිබෙන්නේ. මොකද ඒ අයට සතුටු වෙන්න, විනෝද වෙන්න, තමා මේ විදියට මේක හදලා තිබෙන්නේ. ඒ වගේම ජූලි, අගෝස්තු වගේ කාලේ ඔබතුමාලා කියනවා වගේ සායන වැඩසටහනක් තිබ්බා MOH ඔෆිස් එකත් එක්ක එකතු වෙලා. ඒගොල්ලො ලේ බලලා කොලස්ටරෝල්, ප්‍රෙෂර් ඒ ඔක්කොම බලලා උස, බර අනුව නිරෝගී ද නැද්ද කියන එක පරික්ෂා කරල දුන්නා. එදත් කිව්වා සභාවේ සියලු දෙනාට ඒ අවස්ථාව සූදානම් කලොත් ඒ අය එම වැඩසටහන කරලා දෙන්න සූදානම් කියලා. මම යෝජනා කරනවා ඔබතුමාගේ යෝජනාව අනුව එම වැඩසටහන ප්‍රථම කර ක්‍රියාත්මක කරන්න අපි සූදානම් කියලා.

ඊළඟට රෝහල ගැන කතා කළා. ඔය රෝහල මූලික රෝහලක් බවට පත් කරන්න 70 ගණන් වල එවකට හිටිය මන්ත්‍රීවරයා මේක මූලික රෝහලක් කරන්න සෞඛ්‍ය ඇමතිට කතා කරනකොට ආරියදාස කියලා සෞඛ්‍ය ඇමති කෙනෙක් හිටියේ. එයා කිව්වා වාට්ටුවක් හදලා

පෙන්නුවොත් මූලික රෝහලක් කරලා දෙන්නම් කියලා. ඒ වෙලාවෙදි බලප්‍රදේශයේම හිටපු අය එකතුවෙලා විවිධාකාරයෙන් උදව් කරලා තමයි ඔය වාට්ටුව හැදුවේ. ඊට පස්සේ තමයි OPD එක හදන්න සල්ලි පාස් කරලා දීලා ලෙඩ්ඩුන්ට වාඩිවෙලා බෙහෙත් ගන්න පුලුවන් තත්වයකට ගෙන ආවේ. ඒ වගේ අපට සමහර අවස්ථාවලදී සිද්ධ වෙනවා සියළු දෙනාම එකතු කරගෙන මේ කටයුතු කරගෙන යන්න. එහෙම මහන්සි වෙලා හදපු අර පියදාස වික්‍රමනායක මැතිතුමා ගැන අපි හැමෝම දන්නවා.රෝහල හදලා ඉවර වෙනකම්ම රෝහලේ තමයි නැවතිලා හිටියේ. මේක හදලා ඉවර වෙලා තමයි රෝහලෙන් ගියේ. හදිසි ඒකකය හැදුවෙත් එතුමාගේ මූලිකත්වයෙන්. මේ වගේ රෝහලක හදිසි ඒකකයක් දෙන්න බෑ කිව්වා. එවකට හිටිය සෞඛ්‍ය අධ්‍යක්ෂ නාවින්න ඇමැතිතුමාගේ අක්කගේ දුවගේ ස්වාමිපුරුෂයා. මමත් එතන හිටියා. මම අධ්‍යක්ෂතුමාට කිව්වා හදිසි ඒකකයක් අවශ්‍යායි. අපි මෙහෙ ඉඳලා කුරුණෑගලට ගෙනියනකොට ලෙඩ්ඩුන්ගේ ජීවිතය ඉවර වෙලා තියෙයි කියලා. ඊට පස්සේ තමයි එයා ඒක අනුමත කලේ. ඒ වගේ ගෙනාපු රෝහල තමයි අද පල්ලෙහාට වැටිල තියෙන්නේ. ඔබතුමා ඉතා වටිනා යෝජනාවක් ගෙන ආවේ. අපි ඒකත් මහා සභාවේ සම්මත වුන විදියට ක්‍රියාත්මක කරගමු. අපේ කාර්යමණ්ඩලය වෙනුවෙන් ඒ සෞඛ්‍ය සායනය කරන්න MOH එකත් එක්ක කතා කරගෙන, යම් කිසි වියදමක් දරන්න තියෙනවා නම් එකත් දරාගෙන අපි කරමු. ඔබතුමා මතක් කරපු නිසා මම තව ඇගයීමක් කරන්න ඕන. මේක මේ යෝජනාවක් නොවේ, ඇගයීමක්. අපේ සියලුම නිලධාරීන් තමන්ගේ සහෝදර නිලධාරියා නැතිවුන අවස්ථාවේදී සුබසාධනයෙන් දෙන මුදලට එහා මුදලක් සියලුම නිලධාරීන් එකතුවෙලා ඒ දරුවන් හා බිරිඳ වෙනුවෙන් ලබා දුන්නා. ඒ වගේ හොඳ සංවිධානයක් මේ අය අතරේ කියනවා. ඒවට අපිටත් එකතු වෙන්න පුළුවන් නම් හොඳයි. අපි ඉදිරියේදී ඒ වගේ කටයුතුවලට සහයෝගය දෙමු. මේ සෞඛ්‍ය සේවකයින්ගේ වැඩසටහනත් එක්ක ඉදිරිපත් වූ යෝජනා දෙකම මහා සභාවේ අනුමත වූ යෝජනා හැටියට ඉදිරියට ගෙනියමු.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සේවකයින්ගේ සේවාව ඇගයීම හා ඒ සඳහා වැයවන රු.149,000.00 ක් වූ ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-09)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/56 - 09** දරණ යෝජනාව</u>

52-8668 දරණ වාහනයේ ස්ටාටර් මෝටරය අළුත්වැඩියා කිරීම සඳහා රියදුරු මහතා විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එම අළුත්වැඩියා කටයුතු ඉටුකිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 52-8668 දරණ වාහනයේ ස්ටාටර් මෝටරය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-10)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/56 - 10** දරණ යෝජනාව</u>

PC- 0366 දරණ වාහනයේ කි.මී. 5000 සේවා කටයුතු සිදුකිරීම හා පහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා රියදුරු මහතා විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එම අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

1. ටර්බෝ පද්ධතිය අළුත්වැඩියා කිරීම
2. වාහනයේ දිරා ඇති කොටස් අළුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම

3. ෆැන් ආවරණය අළුතින් දැමීම හා එන්ජින් මඩකවර දැමීම
4. වම්පස පැති කණ්කාඩිය අළුතින් දැමීම
5. තිරිංග පද්ධතිය අළුත්වැඩියා කිරීම
6. ටයිමින් බෙල්ට් මාරුකිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව PC- 0366 දරණ වාහනයේ කි.මී. 5000 සේවා කටයුතු සිදුකිරීම හා ඉහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-11)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක **06/56 - 11** දරණ යෝජනාව</u>

LL -7772 දරණ වාහනයේ පහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා රියදුරු මහතා විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එම අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

1. කිංපින් රේසර් ගැසීම
2. සීට් කවර දැමීම හා කුෂන් කිරීම
3. වාහනයේ ඉදිරිපස මුහුනේ දිරුම් සාදා තීන්ත ආලේප කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව LL -7772 දරණ වාහනයේ ඉහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-12)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක **06/56 - 12** දරණ යෝජනාව</u>

ZA -5067 දරණ වාහනයේ වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහාරියදුරු මහතා විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එම අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ZA -5067 දරණ වාහනයේ වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-13)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක **06/56 - 13** දරණ යෝජනාව</u>

RD -1601 දරණ වාහනයේ පහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා රියදුරු මහතා විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එම අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

1. සෙන්ටර් පින් ගැසීම
2. කිංපින් ගෙවී ඇතිදැයි පරික්ෂා කර අළුත්වැඩියා කිරීම
3. ටයර් රොඩ් ගෙවී ඇතිදැයි පරීක්ෂා කර අළුත්වැඩියා කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව RD -1601 දරණ වාහනයේ ඉහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-14)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/56 - 14 දරණ යෝජනාව**</u>
LL - 6946 දරණ වාහනයේ පහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා රියදුරු මහතා විසින් ඉල්ලීමක් සිදුකර ඇති අතර එම අළුත්වැඩියා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

1. ඉදිරිපසපාක් ලයිට් අළුත්වැඩියා කිරීම
2. පිටුපස පාක් ලයිට් සහ බ්‍රේක් ලයිට් අළුත්වැඩියාව
3. ඩෑෂ්බෝඩ් ලයිට් අළුත්වැඩියා කිරීම
4. පැති වැට අළුත්වැඩියා කිරීම
5. හුඩ් ලයිට් අළුත්වැඩියා කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව LL - 6946 දරණ වාහනයේ ඉහත සඳහන් අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අපේ සභාවේ වාහන වලට අයවැයෙනුත් ලොකු මුදලක් වෙන් කරලා තිබෙනවා රෙපෙයාර් වලට. මේ දවස් වල වාහනවල මිල ගණන් වැඩි නිසා මම යෝජනාවක් වශයෙන් ගේනවා පොඩි සර්විස් එකක් අපේ සභාවේ පටන් ගමු කියලා. සභාවේ වාහන ටිකයි, අපේ සභාවේ සේවක මණ්ඩලයේ වාහන තියෙනවා, ඒවා සර්විස් කරගන්න පුලුවන් ටිකට් එකක් කඩලා. ඒ වගේම ඔයිල් ටික මාරු කරගන්න පුළුවන්. මේ වාහන වල මේ කටයුතු ඇත්තටම කෙරෙනවද නැද්ද කියන එකත් ලොකු ප්‍රශ්නයක් අපට තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා අපේ ගරු මන්ත්‍රීවරුන් කීපදෙනෙක් ඒ සඳහා අධීක්ෂණයට දාන්න. එහෙම නැත්නම් නිලධාරී දෙන්නෙක් දාලා මේවා හරියට ඒ දේවල් කෙරෙනවද කියලා බලාගන්න තිබුණා නම් හොඳයි. අපට විශ්වාසයක් නෑ. පවතින මිලත් එක්ක රේසරයක් දාන්න ගියත් රුපියල් 4000 ක් 5000 ක් වෙනවා රේසරයක් ගහන්න. ඕක ගහනවද, නැත්නම් බුරුල් වෙලා තියෙන එකක් දානවද, පරණ එක ආපහු දෙනවද කියන එක අධීක්ෂණයට කිහිප දෙනෙක් දාන එක හොඳයි කියන යෝජනාවත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, මේ ආපදා කමිටුවේ මම ආවේ නෑ කියලා මගේ නම තියනවා. හැබැයි මට එන්න කියලා ලියුමක් වත් පණිවිඩයක් වත් ලැබුණේ නෑ. මම එදත් සභාවේදි කිව්වා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී ලේකම්තුමිය විසින් කමිටුවලට දැනුම් දීම පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

**06.** <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම - නැත</u>

**<u>07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔක්තෝබර් මාසයේ පැවති කාරක සභා රැස්වීම්වලට සහ අද දින මහා සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**2022/11/15 දින මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**2022/10/28 දින කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය

4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා

**2022/10/28 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා

**2022/10/18 දින පුස්තකාල උපදේශන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය

**2022/10/26 දින ටෙන්ඩර් මණ්ඩල කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**<u>(08.1) මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.10.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,2022.10.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.10.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.2)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.10.28 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,2022.10.28 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.10.28 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.3)පුස්තකාල උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.10.18 දින පැවති පුස්තකාල උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාවඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,2022.10.18 දින පැවති පුස්තකාල උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.10.18 දින පැවති පුස්තකාල උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.4)ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.10.26 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,2022.10.26 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.10.26 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.5) ආපදා කළමණාකරණ කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.11.08 දින පැවති ආපදා කළමණාකරණ කාරක සභා රැස්වීම් වාර්තාවඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,2022.11.08 දින පැවති ආපදා කළමණාකරණ කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.11.08 දින පැවති ආපදා කළමණාකරණ කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව, ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා ආදායම් පුරෝකථන වාර්තාව සහ ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**9.1 ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**9.2 ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**9.3 ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/10/01 දින සිට 2022/10/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

## 2022/10/01 දින සිට 2022/10/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබාගැනිම.

| අනු අං: | වවුචර්අංකය | ආදායකයා | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|
| 1 | 1210 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.10.05 සිට 07 දක්වා කොළඹ පදනම් ආයතනයේදී පැවති වැඩමුළුව සඳහා ගාස්තු | 1,500.00 |
| 2 | 1211 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.10.04 කසල කළමනාකරණ වැඩ මුළුව සඳහා අත්තිකාරම් | 3,000.00 |
| 3 | 1212 | විමල් ඇග්‍රෝ ට්‍රැක්ටර්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් | ආර්.වයි. 6578 ගලි බවුසරය අළුත්වැඩියාව | 177,500.00 |
| 4 | 1213 | අමිල අබේනායක කම්පණි ප්‍රයිවෙට් ලිමිටඩ් | පී.සී. 0366 කැබ් රථය සඳහා ඩන්ලොප් ටයර් 04ක් මිලදී ගැනීම | 208,000.00 |
| 5 | 1214 | ජී.බී. සේනානායක මයා | කුරුණෑගල දිසා අධිකරණයේ විභාග වන නඩු සඳහා නීතිඥ ගාස්තු ගෙවීම | 7,000.00 |
| 6 | 1215 | ජේ.එම්.ඩී.ආර්.ජයකොඩි මයා | සේවාව සැපයීමට නොහැකි වීම නිසා ගලි බවුසර් තැන්පත් ආපසු ගෙවීම | 9,200.00 |
| 7 | 1216 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 අගෝස්තු ශ්‍රී සුධම්ම පෙර පාසැලේ විදුලි බිල්පත් පියවීම | 644.70 |

| | | | | |
|---|---|---|---|---|
| 8 | 1217 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් ශ්‍රී සුධම්ම පෙර පාසැලේ විදුලි බිල්පත් පියවීම | 460.00 |
| 9 | 1218 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් මහරච්චිමුල්ල උප කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 1,460.00 |
| 10 | 1219 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව බස් නැවතුම්පල අසල ජල සැපයුමේ බිල්පත් පියවීම | 701.50 |
| 11 | 1220 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව බස් නැවතුම්පල පොදු වෙළඳ සංකීර්ණයේ ජල බිල්පත් පියවීම | 2,933.09 |
| 12 | 1221 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් කුරුණෑගල පාර ජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 1,314.10 |
| 13 | 1222 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව දුම්රියපොළ ගේට්ටුව අසල ජල සැපයුමේ ජල බිල්පත් පියවීම | 539.68 |
| 14 | 1223 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව තාවකාලික සතිපොළ ජල බිල්පත් පියවීම | 11,011.94 |
| 15 | 1224 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් සතිපොළ දීමනා ගෙවීම | 19,800.00 |
| 16 | 1225 | ලලිතා විජේසේකර මිය | බෝයවලාන පුස්තකාලයට විදුලි උපාංග මිලදී ගැනීම සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 700.00 |
| 17 | 1226 | කමල් රෝහණතිලක මයා | බර වාහන බලපත්‍ර අළුත් කිරීම සහ වෛද්‍ය වාර්තාව සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 3,200.00 |
| 18 | 1227 | සී.ජේ. වික්‍රමාරච්චි මිය | ටෙන්ඩර් පෙට්ටි අංක 02 සඳහා ඉබි යතුරු මිලදී ගැනීමට අතින් දැරූ වියදම් ලබා ගැනීම | 260.00 |
| 19 | 1228 | නිමාලි ප්‍රසංගිකා මිය | 2022.09.21 පැවති 2023 වර්ෂය සඳහා වත්කම් බදු දීම සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ සංග්‍රහ වියදම් සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 2,450.00 |
| 20 | 1229 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | පරිසර බලපත්‍ර පරීක්ෂණ තැන්පත් වලින් 50% ක් අදාල නිලධාරීන්ට ගෙවීම | 8,375.00 |
| 21 | 1230 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | පරිසර බලපත්‍ර පරීක්ෂණ තැන්පත් වලින් 50% ක් අදාල නිලධාරීන්ට ගෙවීම | 9,750.00 |
| 22 | 1233 | කේ.පී. සිරිසේන මයා | අයකරගත් සේවක ඇප තැන්පත් ආපසු ගෙවීම. | 7,136.12 |
| 23 | 1234 | එම්.එස්.දළුවත්ත මයා | අයකරගත් සේවක ඇප තැන්පත් ආපසු ගෙවීම. | 2,435.92 |
| 24 | 1235 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් දෛනික වැටුප් ගෙවීම | 549,140.42 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | 1236 | ඊ.එම්.එස්.කේ. ඒකනායක මයා | ගමන් වියදම් | 1,030.00 |
| 26 | 1237 | අනිල් ප්‍රියදර්ශන මයා | ගමන් වියදම් | 700.00 |
| 27 | 1238 | චතුරිකා පියසුමන මිය | පී.සී. 0366 කැබ් රථය අළුත්වැඩියාව සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 1,200.00 |
| 28 | 1239 | සී.ජේ. වික්‍රමාරච්චි මිය | ගමන් වියදම් | 700.00 |
| 29 | 1240 | කමල් රෝහණතිලක මයා | ගමන් වියදම් | 1,340.00 |
| 30 | 1241 | දිනූෂා හේවාරත්න මිය | ගමන් වියදම් | 800.00 |
| 31 | 1242 | එච්.බී. විනිතා ප්‍රියමානි මිය | 2022 සැප්තැම්බර් ගරු සභාපතිතුමියගේ පෞද්ගලික සහකාර දීමනා | 22,000.00 |
| 32 | 1243 | නිමාලි ප්‍රසංගිකා මිය | ගමන් වියදම් | 7,200.00 |
| 33 | 1244 | ජේ.එජ්.ඒ. ජයරත්න මිය | ගමන් වියදම් | 7,870.00 |
| 34 | 1245 | සී.ජේ. වික්‍රමාරච්චි මිය | අලව්ව ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ නිෂ්පාදිත කාබනික පොහොර ප්‍රමිතිකරණ පරීක්ෂාව සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 575.00 |
| 35 | 1246 | ඩබ්.එච්. කීර්තිසේන මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 10,833.00 |
| 36 | 1247 | ටී.කේ. සුමේධ බංඩා මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 6,499.00 |
| 37 | 1248 | එම්.ජී.රංජිත් මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 6,822.00 |
| 38 | 1249 | ආර්.පී.ඩී. අමරසිංහ මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 11,041.00 |
| 39 | 1250 | ජගත් පුෂ්පකුමාර මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 8,787.00 |
| 40 | 1251 | සුනිල් ප්‍රේමරත්න මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 6,889.00 |
| 41 | 1252 | උදය කුමාර සේනාරත්න මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 6,562.00 |
| 42 | 1253 | එච්.එම්.එච්. දිල්හානි හේරත් මිය | 2022 සැප්තැම්බර් පුහුණු දීමනා | 9,000.00 |
| 43 | 1254 | ජේ.ඒ. ලලිත් පත්මසිරි මයා | ගමන් වියදම් - 2022 සැප්තැම්බර් | 3,060.00 |
| 44 | 1255 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2022 තුන්වන කාර්තුවට අදාල මුද්දර බදු ගෙවීම | 16,650.00 |
| 45 | 1256 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.10.11 මහ සභා රැස්වීමේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් | 30,000.00 |
| 46 | 1257 | ජයන්ත එදිරිසිංහ මයා | ගමන් වියදම් -2022 සැප්තැම්බර් | 3,060.00 |
| 47 | 1258 | ජේ.ඒ.එස්.ජයසිංහ මිය | ගමන් වියදම් - පුහුණු | 3,500.00 |
| 48 | 1259 | ජේ.ඒ.එස්.ජයසිංහ මිය | ගමන් වියදම් - පුහුණු | 2,000.00 |
| 49 | 1260 | ජේ.ඒ.එස්.ජයසිංහ මිය | ගමන් වියදම් | 500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 50 | 1261 | උපාලි තිලකරත්න මයා | ගමන් වියදම් | 3,850.00 |
| 51 | 1262 | අයි.එම්.එස්.එච්.ඉලංකෝන් මිය | ගමන් වියදම් | 1,400.00 |
| 52 | 1263 | එස්.එම්. ධම්මිකා කුමුදුනී මිය | ගමන් වියදම් | 760.00 |
| 53 | 1264 | උපාලි තිලකරත්න මයා | අතිකාල දීමනා -2022 සැප්තැම්බර් | 10,937.00 |
| 54 | 1265 | කමිලරත්න පතිරණ මයා | අතිකාල දීමනා -2022 සැප්තැම්බර් | 2,383.00 |
| 55 | 1266 | ලලිත් පත්මසිරි මයා | අතිකාල දීමනා -2022 සැප්තැම්බර් | 3,588.00 |
| 56 | 1267 | ජේ.ඒ.ඩී.එස්.ප්‍රියදර්ශන මයා | 2022 අගෝස්තු , සැප්තැම්බර් පුහුණු දීමනා | 19,000.00 |
| 57 | 1268 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් සභික දීමනා | 605,500.00 |
| 58 | 1269 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- ආර්.ඩී.9440 , පී.සී. 0366, එස්.බී.8367 - 2022.09.14 | 43,705.00 |
| 59 | 1270 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- ආර්.ඩී.9440 , පී.සී. 0366, ආර්.ඩී.1601, 52-8668, Z.A.5067 - 2022.09.21 | 117,675.00 |
| 60 | 1271 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- ආර්.ඩී.9440 , පී.සී. 0366, ආර්.ඩී.1601, 52-8668, Z.A.5067, එල්.ඊ. 7413 - 2022.09.28 | 99,975.00 |
| 61 | 1272 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- Z.A.5067, එල්.එල්. 7772- 2022.09.29 | 68,010.00 |
| 62 | 1273 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම- 52-8668, Z.A.5067, එල්.එල්. 6946, එල්.එම්. 5623 - 2022.09.30 | 130,720.00 |
| 63 | 1274 | සමන් ඉංජිනියරින් සර්විසස් | එල්.එල්.6946 ටිපර් රථය සේවා කිරීම | 70,185.00 |
| 64 | 1275 | සමන් ඉංජිනියරින් සර්විසස් | එල්.ඊ. 7413 බොලැරෝ රථය සේවා කිරීම | 37,380.00 |
| 65 | 1276 | සමන් ඉංජිනියරින් සර්විසස් | ආර්.ඩී.9440 ට්‍රැක්ටරය සේවා කිරීම | 42,120.00 |
| 66 | 1277 | සමන් ඉංජිනියරින් සර්විසස් | එල්.එල්.7772 කෘ කැබ් රථය සේවා කිරීම | 61,255.00 |
| 67 | 1278 | සමන් ඉංජිනියරින් සර්විසස් | ආර්.ඩී.1601 ට්‍රැක්ටරය හා ආර්.ඩබ්.8868 ටේලරය සේවා කිරීම | 36,980.00 |
| 68 | 1279 | සමන් ඉංජිනියරින් සර්විසස් | ආර්.බී. 3571 ට්‍රැක්ටරය සේවා කිරීම | 40,676.00 |

| | | | | |
|---|---|---|---|---|
| 69 | 1280 | සීවලී මෝටර්ස් | පී.සී. 0366 කැබ් රථය අළුත් වැඩියාව | 1,300.00 |
| 70 | 1281 | දිනපාල ප්‍රයිවෙට් ලිමිටඩ් | ප්‍රධාන කාර්යාලය සඳහා පරිගණක මේසයක් මිලදී ගැනීම | 9,950.00 |
| 71 | 1282 | ධම්මික හාඩ්වෙයාර් | අලව්ව පුස්තකාලය සඳහා පිරිසිදු කිරීමේ උපකරණ මිලදී ගැනීම | 1,285.00 |
| 72 | 1283 | ඕ.ඒ. සිරිල් ගාමිණී මයා | අලව්ව පුස්තකාලය සඳහා ප්ලාස්ටික් බාල්දි 03ක් මිලදී ගැනීම | 2,720.00 |
| 73 | 1284 | Fresh line safty Products Pvt limited | සර්ජිකල් මාස්ක් පෙට්ටි 50ක් මිලදී ගැනීම | 20,000.00 |
| 74 | 1285 | කේ.පී. වසන්තා වයලට් මිය | කේ.පී. වසන්තා වයලට් මියගේ සැමියාගේ පිළිකා රෝගී තත්වයට ආධාර ලබා දීම | 20,000.00 |
| 75 | 1286 | පියසේන විජේසූරිය මයා | 2022 අගෝස්තු බෝයවලාන පුස්තකාලයේ පුවත්පත් බිල් පියවීම | 9,000.00 |
| 76 | 1287 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් ප්‍රධාන කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 21,404.00 |
| 77 | 1288 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව ප්‍රජා ශාලාව විදුලි බිල්පත් පියවීම | 2,360.00 |
| 78 | 1289 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව ප්‍රධාන කාර්යාලයේ ජල බිල්පත් පියවීම | 6,032.13 |
| 79 | 1290 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව මහජන ක්‍රීඩාංගනයේ ජල බිල්පත් පියවීම | 1,073.09 |
| 80 | 1291 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ජල බිල්පත් පියවීම | 3,168.89 |
| 81 | 1292 | පියසේන විජේසූරිය මයා | 2022 අගෝස්තු මහරච්චිමුල්ල පුස්තකාලයේ පුවත්පත් බිල් පියවීම | 6,360.00 |
| 82 | 1293 | ලේකම්, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | ගලි බවුසර් කුලී ගෙවීම | 21,740.00 |
| 83 | 1294 | ලංකා පොලිසැක් ප්‍රයි. ලිමිටඩ් | කොම්පෝස්ට් පොහොර ඇසිරීම සඳහා පොලිසැක් බෑග් 2000ක් මිලදී ගැනීම | 121,600.00 |
| 84 | 1295 | ඒ.ඩබ්.එම්. රාවුෆ් මයා | 2022 වර්ෂය සඳහා අලව්ව පොදු වෙළඳපොල එළ හරක් මස් කඩය හා එළු මස් කඩය සඳහා තැන්පත් කල ලංසු ඇප ආපසු ගෙවීම | 40,953.00 |
| 85 | 1296 | ඩබ්.පී. එන්ටර්ප්‍රයිසස් | එල්.ෆී. 7413 බොලැරෝ රථය අළුත් වැඩියාව | 2,000.00 |
| 86 | 1297 | සීවලී මෝටර්ස් | 52-8668 කැබ් රථයේ හැන්ඩ් බ්‍රේක් හැඩලය දැමීම | 3,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 87 | 1298 | සීවලී මෝටර්ස් | 52-8668 කැබ් රථයේ වීල් බැලන්ස් කිරීම | 1,400.00 |
| 88 | 1299 | සීවලී මෝටර්ස් | එල්.එල්. 7772 කෘ කැබ් රථය අළුත් වැඩියාව | 7,500.00 |
| 89 | 1300 | සම්පත් ලෙදර් & බොඩි කිට්ස් | පී.සී. 0366 කැබ් රථයේ රිවස් කැමරාව සහ ඩී.වී.ඩී. සෙට් එක සවි කිරීම | 35,700.00 |
| 90 | 1301 | ජී.ඩී. විජේවර්ධන මයා | අලව්ව ප්‍රාදේශීය සභා වාහන වල සවි කිරීම සඳහා නාම පුවරු 07ක් සැකසීම | 7,460.00 |
| 91 | 1302 | ශ්‍රී ලංකා දුම්රිය සේවය | නිළධාරීන් ලබා ගත් දුම්රිය බලපත්‍ර සඳහා බිල්පත් පියවීම | 1,280.00 |
| 92 | 1303 | එම්.එම්. තෝමස් ජයකඩු මයා | 2022 සැප්තැම්බර් අලව්ව තාවකාලික සතිපොළ බිම් කුලී ගෙවීම | 50,000.00 |
| 93 | 1305 | බටේපොල ටයර් හවුස් | මොටර් ග්‍රේඩරය සඳහා 1000ag exide බැටරි 02ක් ලබා ගැනීම | 123,000.00 |
| 94 | 1306 | ජේ.එස්.බී. ට්‍රේඩින් ප්‍රයි. ලිමිටඩ් | Z.A. 5298 මොටර් ග්‍රේඩරය සේවා කිරීම සහ අළුත් වැඩියා කිරීම | 218,850.00 |
| 95 | 1307 | ගුණසිරි කූල් හවුස් | 2022 සැප්තැම්බර් ප්‍රධාන කාර්යාලයේ පුවත්පත් බිල් පියවීම | 1,100.00 |
| 96 | 1308 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 සැප්තැම්බර් මහරව්විමුල්ල උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 1,282.05 |
| 97 | 1309 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව මහජන පුස්තකාලයේ ජල බිල්පත් පියවීම | 1,325.45 |
| 98 | 1310 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් කැප්පිටිවලාන උප කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම | 1,260.00 |
| 99 | 1311 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 2,785.00 |
| 100 | 1312 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් බුජ්ජොමුව සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම | 610.00 |
| 101 | 1313 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව පොදු වෙළඳපොල විවෘත ආලින්ද 01 විදුලි බිල්පත් පියවීම | 3,860.00 |
| 102 | 1314 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව පොදු වෙළඳපොල විවෘත ආලින්ද 02 විදුලි බිල්පත් පියවීම | 1,935.00 |
| 103 | 1315 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව පොදු වෙළඳපොල විවෘත ආලින්ද 01 විදුලි බිල්පත් පියවීම | 4,310.00 |

| | | | | |
|---|---|---|---|---|
| 104 | 1316 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව පොදු වෙළඳපොල විවෘත ආලින්ද 02 විදුලි බිල්පත් පියවීම | 2,235.00 |
| 105 | 1317 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් අලව්ව තාවකාලික සතිපොල විදුලි බිල්පත් පියවීම | 10,872.00 |
| 106 | 1318 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව තාවකාලික සතිපොල විදුලි බිල්පත් පියවීම | 12,252.00 |
| 107 | 1322 | චතුරිකා පියසුමන මිය | වාහන අළුත්වැඩියාව සඳහා අතින් දැරූ වියදම් (ආර්.ඩබ්. 886 ටේලරය) | 600.00 |
| 108 | 1323 | වසන්ත චන්ද්‍රසිරි මයා | නිවාඩු දින වැටුප් 2022 සැප්තැම්බර් | 6,237.00 |
| 109 | 1324 | පද්මා වැත්තැව මිය | ගමන් වියදම් | 1,250.00 |
| 110 | 1325 | එම්.බී. නවරත්න බංඩා මයා | 2022.10.04 දින තක්සේරු නිලධාරීන්ගේ සංග්‍රහ වියදම් සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 700.00 |
| 111 | 1326 | නයනි ගුණරත්න මිය | 2022.09.23 අයවැය සාකච්ඡාවේ සංග්‍රහ වියදම් සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 3,662.00 |
| 112 | 1327 | ඩී.ඒ. සෙනවිරත්න මයා | ගමන් වියදම් | 630.00 |
| 113 | 1328 | ගාමිණී වික්‍රමරත්න මයා | ගමන් වියදම් | 630.00 |
| 114 | 1329 | ලේකම් , අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.10.18 පුස්තකාල උපදේශන කමිටුවේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් | 4,000.00 |
| 115 | 1330 | ලේකම් , අලව්ව ප්‍රාදේශීය සභාව | කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා අවශ්‍ය යූරියා මිලදී ගැනීම සඳහා අත්තිකාරම් | 4,000.00 |
| 116 | 1331 | එස්.එම්. ධම්මිකා කුමුදුනී මිය | ගමන් වියදම් | 760.00 |
| 117 | 1332 | කේ.එම්. වසන්ත කුමාර මයා | ගමන් වියදම් | 4,600.00 |
| 118 | 1333 | එන්.බී. රත්නායක මයා | ගමන් වියදම් | 400.00 |
| 119 | 1334 | අනිල් ප්‍රියදර්ශන මයා | අතිකාල දීමනා - 2022 සැප්තැම්බර් | 3,414.00 |
| 120 | 1335 | ඩබ්.ඩී. කුමාර මයා | 2022 සැප්තැම්බර් රථගාල් ගාස්තු 25% දීමනා ගෙවීම | 6,125.00 |
| 121 | 1336 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 සැප්තැම්බර් කිරිවානාපොල සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් ගෙවීම | 410.00 |

| | | | | |
|---|---|---|---|---|
| 122 | 1337 | සී/ස ලංකා බෙල් සමාගම | 2022 සැප්තැම්බර් කැප්පිටිවලාන උප කාර්යාලයේ දූරකථන බිල්පත් පියවීම | 497.51 |
| 123 | 1338 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 සැප්තැම්බර් ප්‍රධාන කාර්යාලයේ අන්තර්ජාල පහසුකම් සහිත දූරකථනයේ බිල්පත් පියවීම | 5,344.77 |
| 124 | 1339 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 සැප්තැම්බර් ප්‍රධාන කාර්යාලීය දූරකථනයේ බිල්පත් පියවීම | 2,815.04 |
| 125 | 1340 | දීපාංජලී කුමාරසිරි මෙනවිය | ගමන් වියදම් - පුහුණු | 2,920.00 |
| 126 | 1341 | එම්.එම්.කේ. ඥානරත්න මිය | ගමන් වියදම්- පුහුණු | 2,980.00 |
| 127 | 1342 | එම්.එස්. සුදුසිංහ මිය | ගමන් වියදම්- පුහුණු | 2,920.00 |
| 128 | 1343 | චන්දික පුෂ්පකුමාර මයා | ගමන් වියදම්- පුහුණු | 1,490.00 |
| 129 | 1344 | ආර්.එම්.ජේ. රණසිංහ මිය | 2022.10.13 දින දේපල තහනම් කිරීමේ වැඩ සටහනේ සංග්‍රහ වියදම් සඳහා අතින් දැරූ වියදම් | 1,700.00 |
| 130 | 1345 | සමන් ප්‍රේමතිලක මයා | අතිකාල දීමනා 2022 සැප්තැම්බර් | 4,306.00 |
| 131 | 1346 | සමන් ප්‍රේමතිලක මයා | අතිකාල දීමනා 2022 අගෝස්තු | 1,955.00 |
| 132 | 1347 | රවිදු ස්ටේෂනරීස් & හාඩ්වේයාර් | සෞඛ්‍ය අංශය සඳහා රබර් අත්මේස් සහ පීනෝල් මිලදී ගැනීම | 253,800.00 |
| 133 | 1348 | මෙට්රෝ පොලිටන් ටෙක්නොලොජීස් ප්‍රයි. ලිමිටඩ් | ආර්.ඩී. 3608 අනු පිටපත් යන්ත්‍රය සඳහා තීන්ත හා මාස්ටර් රෝල් මිලදී ගැනීම | 195,960.00 |
| 134 | 1349 | Base HP pvt ltd | ups එකක් මිලදී ගැනීම | 16,500.00 |
| 135 | 1350 | පෝස්ට් මාස්ටර් ජෙනරාල් | නිදහස් තැපැල් පහසුකම් සඳහා ගෙවීම | 51,690.00 |
| 136 | 1352 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් ස්ථිර වැටුප් ගෙවීම | 5,739,913.03 |
| 137 | 1353 | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් | එම්.කේ. 1794 යතුරු පැදියේ වාර්ෂික රක්ෂණ බලපත්‍රය යාවත්කාලීන කිරීම | 2,627.09 |
| 138 | 1354 | සීවලී මෝටර්ස් | 52-8668 කැබ් රථය අළුත්වැඩියාව | 9,500.00 |
| 139 | 1355 | සීවලී මෝටර්ස් | ආර්.ඩී. 1601 ට්‍රැක්ටරය අළුත්වැඩියාව | 6,300.00 |

| | | | | |
|---|---|---|---|---|
| 140 | 1356 | ආර්.කේ.යූ. රූපසිංහ මයා | සේවක ඇප තැන්පත් ආපසු ගෙවීම | 7,146.31 |
| 141 | 1357 | බී.එම්.එස්.කේ. බාලසූරිය මිය | සේවක ඇප තැන්පත් ආපසු ගෙවීම | 5,980.35 |
| 142 | 1358 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් කිරිවානාපොල සායන මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් ගෙවීම | 485.00 |
| 143 | 1359 | ඩබ්.පී.එස්.ඩබ්.ගුණසේකර මිය | ගලි බවුසර් තැන්පත් වලින් කොටසක් ආදායමට ගෙන ඉතිරිය ගෙවීම | 5,000.00 |
| 144 | 1360 | ඔරෙල් කෝපරේෂන් ප්‍රයි.ලිමිටඩ් | ඔරේන්ජ් CFL බල්බ් 1000ක් මිලදී ගැනීම | 1,246,502.25 |
| 145 | 1361 | ඔරියන්ට් මෝටර් සෙන්ටර් | ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ පොහොර හලනය සඳහා බෙල්ට් 02ක් මිලදී ගැනීම | 6,750.00 |
| 146 | 1362 | සිරිමෙවන් බණ්ඩාර මයා | ගමන් වියදම් | 1,400.00 |
| 147 | 1363 | ඩී.ඒ. සෙනවිරත්න මයා | ගමන් වියදම් | 1,400.00 |
| 148 | 1364 | අයි.ඩී. ප්‍රියශාන්ති මිය | ගමන් වියදම් - පුහුණු | 4,722.00 |
| 149 | 1365 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.10.28 මුදල් කමිටුවේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් | 3,000.00 |
| 150 | 1366 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.10.28 කාර්මික සේවා කාරක සභාවේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් | 4,000.00 |
| 151 | 1367 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ජල නල අලුත්වැඩියාව සඳහා අත්තිකාරම් | 1,000.00 |
| 152 | 1368 | සතොස මෝටර්ස් | එල්.එම්.5623 කම්පැක්ටරය සේවා කිරීම | 107,374.35 |
| 153 | 1369 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | 46- 0524 කසල ටේලරයේ වාර්ෂික රක්ෂණ බලපත්‍රය යාවත්කාලීන කිරීම | 2,598.17 |
| 154 | 1370 | මෙට්රෝ පොලිටන් ටෙක්නොලොජීස් ප්‍රයි. ලිමිටඩ් | ෆැක්ස් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම | 36,960.00 |
| 155 | 1371 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් බෝයවලාන පුස්තකාලයේ විදුලි බිල්පත් පියවීම | 4,460.00 |
| 156 | 1372 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව පුස්තකාලයේ විදුලි බිල්පත් පියවීම | 2,485.00 |
| 157 | 1373 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව බස් නැවතුම අසල ජල සැපයුමේ බිල්පත් පියවීම | 690.00 |

| | | | | |
|---|---|---|---|---|
| 158 | 1374 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව බස් නැවතුම්පල සහ පොදු වෙළඳ සංකීර්ණයේ ජල බිල්පත් පියවීම | 2,212.60 |
| 159 | 1375 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022 ඔක්තෝම්බර් අලව්ව තාවකාලික සතිපොළ ජල බිල්පත් පියවීම | 8,406.87 |
| 160 | 1377 | පියසේන විජේසූරිය මයා | 2022 සැප්තැම්බර් බෝයවලාන පුස්තකාලයේ පුවත්පත් බිල්පත් පියවීම | 9,230.00 |
| 161 | 1378 | ද ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් | 2023 අයවැය සැකසීම පිළිබඳ පුවත්පත් දැන්වීම ත්‍රෛ භාෂාවෙන් එල කිරීමේ ගාස්තු | 32,369.80 |
| 162 | 1379 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.10.03 RD -9440, RD-1601, SB-8367, PC-0366, 52-8668, L.L. 7772, L.L.-6946 | 208,320.00 |
| 163 | 1380 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම - 2022.10.03 RD -9440, RD-1601, PC-0366, RB-3571, 52-8668, L.M.5623, L.E 7413, | 204,610.00 |
| 164 | 1381 | ඩබ්.ඒ.සී.ජේ. වික්‍රමාරච්චි මිය | ගමන් වියදම් | 750.00 |
| 165 | 1382 | එච්.එම්.එස්.එස්. හේරත් මිය | ගමන් වියදම් - පුහුණු | 1,360.00 |
| 166 | 1383 | එම්.එන්.පී. රාජකරුණා මිය | ගමන් වියදම් - පුහුණු | 1,554.00 |
| 167 | 1384 | එච්.ඒ.පී.පී. හෙට්ටිආරච්චි මිය | ගමන් වියදම් - පුහුණු | 2,400.00 |
| 168 | 1376 | එන්.එස්. ධර්මසේන මිය | ගමන් වියදම් - පුහුණු | 1,480.00 |
| 169 | 1377 | එන්.ඩී. දිසානායක මිය | ගමන් වියදම් - පුහුණු | 2,920.00 |
| 170 | 1387 | බුද්ධික දිසානායක මයා | ගමන් වියදම් | 1,750.00 |
| 171 | 1388 | සී.පී. පියසුමන මිය | ආර්.ඩී. 1601 ට්‍රැක්ටරයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 450.00 |
| 172 | 1389 | ආර්.එම්.ඒ. රණසිංහ මිය | 2022.10.20 ආදායම් රැස්වීමේ සංග්‍රහ වියදම් සඳහා අතින් දැරූ වියදම් ලබා ගැනීම | 440.00 |
| **කර්මාන්ත ගිණුම** | | | | |
| 173 | 109 | ශ්‍රී සෝනුත්තර වැඩිහිටි සංවිධානය , නුගවෙල පුරාණ විහාරය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ නුගවෙල සායන මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම 10% රැඳවුම් ගෙවීම | 19079.27 |

| | | | | |
|---|---|---|---|---|
| 174 | 110 | සී/ස විසිතුරු බෑග් නිෂ්පාදකයින්ගේ ග්‍රාම ශක්ති ජනතා සමිතිය - හෙණ්ඩුවාවත්ත | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අලව්ව හෙණ්ඩුවාවත්ත ප්‍රජා ශාලා ඉඩමේ බෝධි ප්‍රාකාරය පිළිසකර කිරීම 10% රැඳවුම් ගෙවීම | 14847.85 |
| 175 | 111 | සී/ස විසිතුරු බෑග් නිෂ්පාදකයින්ගේ ග්‍රාම ශක්ති ජනතා සමිතිය - හෙණ්ඩුවාවත්ත | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අලව්ව හෙණ්ඩුවාවත්ත සිට පංගොල්ල දක්වා කොටස සහ හෙණ්ඩුවාත්ත එස්.එම්. සේනාරත්න මයාගේ නිවස අසල සිට 25 නිවස දක්වා කොටස බොරළු දැමීම.10% රැඳවුම් ගෙවීම | 24974.44 |
| 176 | 112 | මඩවල ග්‍රාම සංවර්ධන සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මඩවල ශ්‍රී සුමේධ අවමංගලායාධාර හා සුබ සාධක සමිති ශාලාව ඉදි කිරීම (2 ව්‍යාපෘතිය) 10% රැඳවුම් ගෙවීම | 18720.46 |
| 177 | 113 | මඩවල ග්‍රාම සංවර්ධන සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මඩවල ශ්‍රී සුමේධ අවමංගලායාධාර හා සුබ සාධක සමිති ශාලාව ඉදි කිරීම (1 ව්‍යාපෘතිය) 10% රැඳවුම් ගෙවීම | 9939.28 |
| 178 | 114 | සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය- කැන්දහේන | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ දළුකුඹුර මාර්ගයේ රාජු මයාගේ නිවස අසල කන්ද පාමුල සිට එච්.පොඩි මැණිකේ මියගේ නිවස දෙසට මාර්ගය බොරළු ඇතිරීම.10% රැඳවුම් ගෙවීම | 9,974.29 |
| 179 | 115 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ හෙණ්ඩුවාව කුඹුරු යායේ හෙණ්ඩුවාවත්ත ආරම්භයේ කරුණාසේන මයාගේ නිවස ආසන්නයේ ඇල නියරේ පැති බැම්ම ඉදි කිරීම 10% රැඳවුම් ගෙවීම | 14,965.87 |
| 180 | 116 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉහළ කලල්පිටිය සරත් මයාගේ නිවස අසලින් කිරිමැටිය කන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම.10% රැඳවුම් ගෙවීම | 14,937.39 |
| 181 | 117 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉහළ කලල්පිටිය කන්දපාර බොරළු ඇතිරීම.10% රැඳවුම් ගෙවීම | 19,971.70 |

| | | | | |
|---|---|---|---|---|
| 182 | 118 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2022 සභා අරමුදල් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පහළ නුගවෙල සුනිල් මයාගේ නිවස අසල සිට අරංගල්ල මයාගේ නිවස අසල දක්වා පැති බැම්ම ඉදි කිරීම.10% රුඳවුම් ගෙවීම | 14,924.51 |
| 183 | 119 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2020 සභා අරමුදල් යටතේ බුජ්ජොමුව සායන මධ්‍යස්ථානයට පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම.10% රුඳවුම් ගෙවීම | 4,801.62 |
| 184 | 120 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් යටතේ පංගොල්ල වැලිකරේ මාර්ගය සංවර්ධනය කිරීම 10% රුඳවුම් ගෙවීම | 27,397.71 |
| 185 | 121 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් යටතේ කන්දෙගෙදර ආණ්ඩුවවත්ත මාර්ගය සංවර්ධනය කිරීම 10% රුඳවුම් ගෙවීම | 14,999.40 |
| 186 | 122 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | 2021 සභා අරමුදල් යටතේ කොස්ගහමඩු ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම 10% රුඳවුම් ගෙවීම | 29,925.90 |
| **සේවක ණය** | | | | |
| **187** | 33 | අආර්.එම්.එන්.බී. රත්නායක මයා | ආපදා ණය ගෙවීම | 48,915.00 |
| | | පළාත් අධ්‍යක්ෂ , පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වයඹ | අආර්.එම්.එන්.බී. රත්නායක මයාගේ ආපදා ණය මුදලින් අදාල කොටස ගෙවීම | 201,085.00 |
| 188 | 34 | පළාත් අධ්‍යක්ෂ , පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වයඹ | ආර්.එම්.එන්.බී. රත්නායක මයාගේ උත්සව අත්තිකාරම් මුදල ගෙවීම | 2,500.00 |
| **189** | 35 | පළාත් කෘෂි කර්ම අධ්‍යක්ෂක වයඹ | එම්.අයි. දසනායක මියගේ සහ එම්.එස්. මාරසිංහ මියගේ ආපදා ණය මුදලින් අදාල කොටස ගෙවීම | 333,069.00 |
| **190** | 36 | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කුරුණෑගල | එච්.පී.ජ්.සී. හේරත් මියගේ ආපදා ණය මුදලින් අදාල කොටස ගෙවීම | 73,250.00 |
| **මුළු එකතුව** | | | | 12,535,313.91 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/10/01 දින සිට 2022/10/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/10/01 දින සිට 2022/10/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. මටත් පිටපතක් එක්ක ඩබ්ලිව්.ඒ. රංජිත් ආරිය කුමාර කියලා ගහක් පිළිබඳව ගහක අත්තක් කඩා වැටීම පිළිබඳව ඒ ලබා දුන් තීරණය පිළිබඳව සඳහන් කරලා කොමසාරිස්තුමාට පිටපත් යොමු කරලා තිබෙනවා. මගේ ගෙවල් ළඟ පුද්ගලයෙක්. මේ ඊලග කමිටුවේ විශේෂ අවධානයක් යොමු කරලා මේ තීරණය නැවත සමාලෝචනය කරලා කටයුතු කරන්න අවස්ථාව දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ආඩියාදෙණිය පාසල සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය මොකක්ද උනේ.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
පාසල පිළිබඳව අපට තීන්දු ගන්න බෑ. අධ්‍යාපන අමාත්‍යාංශයයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි එකතුවෙලා තීරණ ගත යුත්තේ අපි ඒ අයව දැනුවත් කරලා තිබෙනවා. අපට පිළිතුරක් ලැබුන ගමන් අපි දැනුවත් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**
ගරු සභාපතිතුමියනි, මට දුරකථන ඇමතුමක් ආවා වැවලට යන පාරෙන් නිවාස කිහිපයකට යන්න දෙන්නේ නැහැ කියලා. ඒ පිළිබඳ මම ලොකු විස්තරයක් දන්නෙ නෑ. සභාව දැනුවත් කරලා කිව්වා. සභාපතිතුමියට ලිපියක් ඉදිරිපත් කලා කිව්වා. වැවල තියෙනවා ළඟින් යන පාරේ ගෙවල් වලට යන්න දෙන්නේ නැතුව පාර හරස් කරලා කියලයි කිව්වේ.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
වල්දොළුවත්තෙ වැවට යන පාර එක් පුද්ගලයෙක් විසින් අවහිර කරලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා බැලුවම අඩි හතරක පාරක්. අද කාලේ හැටියට අඩි හතරක පාරක් ප්‍රමාණවත් නැහැ. මීට කලින් දවසක් මන්ත්‍රීවරුන්ගේ මේසෙ ලඟින් මේ ලිපි කියලා තිබුණා. මට ලැබුණේ නෑ .ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් ලකුණු කරලා දීපු නිසා අපි නැවත ඒ අයත් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය ප්‍රමාණය ලබලා දෙන්න සාකච්ඡාවක් තියන්න දිනයක් තීරණය කරන්නයි තිබෙන්නේ. මේ පාර ගැසට් වෙලා නෑ කියන එක තමයි දැනගන්න ලැබිලා තියෙන්නෙ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**
ගරු සභාපතිතුමියනි, මම ඒ මහත්තයාට දැන්නම් සභාවෙන් ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මම ඔබතුමිය එක්ක තරහ උනත් කියන්න ඕනෑ, මොනවා උනත් ඔබතුමිය හොරකම් කරන්නෙ නෑ. ඒක අපි අගය කරන්න ඕන කාරණාවක්. මම බනිනවා, කෑගහනවා තමයි. කොච්චර තරහ උනත් මෙතුමියගේ හොඳ ප්‍රතිපත්තියක් තියෙනවා. මෙතුමිය කවදාවත් හොරකම් කරන්නෑ. මෙතුමියගේ පියත් එහෙම කෙනෙක්. ඒ වගේම අපේ ලේකම්තුමිය මට ගොඩක් උදව් කරලා තිබෙනවා. මම කවදාවත් බනින්නෑ. ගිය පාර නම් බැන්නා ඒකට සමාවෙන්න ඕනේ. එතුමා බොහොම හොඳ බුද්ධියක් තියෙන නිලධාරීතුමියක්. වැදගත් පවුලක හැමෝම උගත් පුද්ගලයෝ. ලේකම්තුමියත් හොඳයි. සභාපතිතුමියත් අපි බැන්නට හොරකම් කරන්නේ නෑ කියලා අපි කියන්න ඕනෑ. මම පුද්ගලිකව කියන්නේ මෙතුමිය හොරෙක් නොවෙයි. අඩුපාඩු දැක්කත් අපි කොපමණ බැන්නත් මම අවංකව කියනවා එතුමිය හොරෙක් නෙවෙයි. මම කියනවා මේක නිවැරදි මාර්ගයට ගන්න. ලේකම්තුමියටත් කියනවා ඔබතුමිය හරි දක්ෂ කෙනෙක්. අපි කොපමණ කිව්වත් එතුමිය හරි උගත් කෙනෙක්. අපි හැම සභාවකම දැකලා තියනවා එයා එයාගෙ ගමන යනවා. හරි දේ කරන්න එතකොට අපිට මේ ගමන යන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මාළු කඩ සම්බන්ධව මම හිතන්නේ ඔබතුමියටත් ලිපියක් එවන්න ඇති. මටත් ලිපියක් ලැබුණා. හැබැයි අද වෙනකොටත් තීන්දු අරගෙන අලව්ව නගරයේ මාළු කඩ 04 ම යම් පුද්ගලයෙකු විසින් අරගෙන මේ වෙනකොට පවත්වාගෙන යනවා.රේල් පාර අසළ යම් ප්‍රශ්නයක් වුණ ස්ථානයේ අද වෙනකොට යම් පුද්ගලයෙක් පුද්ගලික ස්ථානයක් බදු පදනමට අරගෙන ඒ ව්‍යාපාරය පවත්වාගෙන යනවා. මස් කඩයක් වශයෙන්. සභාවක් විදිහට නතර කරන්න පුලුවන්.ඒකේ අපි දකින්නේ අපි එදා මහා සභාවෙම කතා කළා මාළු ලෑල්ලක් රේල්පාර ළඟ තිබිය යුතුයි. මොකද නැත්නම් එහා පැත්තට මාළු වෙළඳාම යනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම එතැන මාළු ලෑල්ලක් තිබිය යුතුයි. හැබැයි මිනිස්සුන්ට කරදරයක් නොවන ආකාරයට. හැබැයි මෙයා දැන් මාළු ලෑල්ලක් පවත්වාගෙන යනවා ෆ්‍රීසර් දාලා වතුර බිංදුවක්වත් බිමට වැටෙන්නේ නැතුව. යම් පුද්ගලයෙක්ගේ කඩයක් බද්දට අරගෙන ඒකේ මාළු ලෑල්ලක් පවත්වනවා. මේ පුද්ගලයා තමයි අද වෙනකොට මාළු කැලි 04 ම ටෙන්ඩර් එක අරගෙන තියෙන්නේ මේ වන විට ඒ කඩේ මාළු විකිණීම සභාව විසින් තහනම් කරලා තිබෙනවා. මේ පුද්ගලයා මිනිස්සුන්ට කරදරයක් නොවන ආකාරයකට වතුර බිඳක්වත් බිමට වැටෙන්නේනැති ආකාරයට ඒ කටයුතු කරගෙන යනවා. මම ඉල්ලනවා රේල් පාර අසළ මාළු කඩය ඔහුට කරගෙන යාමට අවස්ථාව ලබලා දෙන්න කියලා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
මේ අවුරුද්දේ මේවා අවුරුද්ද මුලදී ටෙන්ඩර් කරලා ක්‍රමවේදයකට අනුව ඇවිල්ලා තිබුණා. එතකොට හතරක් නොවේ ඔක්කොම අරන් තිබුණත් වෙනත් තැනකට ගිහින් දාන්න බෑ. එහෙම ගෙනියනවා නම් සභාවේ අවසරයක් ගන්න ඕනේ. සභාවට කිසිම අනුදැනුමක් නැතිව තමයි එතන මාළු වෙළඳාම කරන්න පටන් ගත්තෙ. මාළු වෙළඳාම විතරක් නෙවෙයි. මේකේ සේවකයෙකුත් ගෙනිහිල්ලා එතන වාඩි කර ගත්තා. එයාට අනුකම්පා කරලා එයාගේ අවස්ථාව අපි නැවත දුන්නා.නැත්නම් අපිට එයාවත් අයින් කරන්න පුළුවන්. සභා බල ප්‍රදේශයේ ටෙන්ඩර් ක්‍රියාවලියක් එක්ක වැඩක් කරනකොට සභාව දැනුවත් කළ යුතුයි. අනිත් කෙනාට කිසිම තැනක් නැතිව ගියා. අපි කීප සැරයක් ඕක සභාවේ කතා කරලා රෙදි සාප්පු ලඟ එහෙම මාළු විකුණන්න ගත්තම අපි මේ අයට දෙන්න තැනක් නැති නිසා තමයි රේල් ගේට්ටුව එහා පැත්තේ එයාට දුන්නේ. එතන එයා අතින් යම් වැරැද්දක් වෙනකොට ඒක දැනුවත් කරලා නිවැරදි කරනවා. අපි අවවාද කරනවා. අපේ බල ප්‍රදේශයේ අය ගැනත් අපිට පොඩ්ඩක් හිතන්න වෙනවා. සල්ලි එනවා

නම් ඒවා එන්න ඕනෑ සභාවට. සභාවට ආදායමක් එන හැටියක් හැදෙන්නත් ඕනෑ. ඔය වගේ වෙළඳාම් තරඟයක් තිබුනොත් තමයි ඕවා දියුණු වෙන්නේ. සභාවේ ආදායම වැඩි වෙන්නේ. මේ සියලුම දේ ගැන කල්පනා කරලා තමයි අපි කටයුතු කරගෙන යන්නේ. එයා ලබන අවුරුද්දටත් මාළු ලැලි 04 ම එක එක නම් වලින් ටෙන්ඩර් දාලා අරන් තිබුනා. ටෙන්ඩර් එක විවෘත කරලා ඉවර උනාට පස්සේ තමයි මාළු ලැලි 04 ම එක් අයෙකු ඉදිරිපත් කර තිබූ බවට තොරතුරු ලැබුනේ. කොහොමත් බස් නැවතුම්පොලේ ස්ථානයට යන්න පුළුවන් වෙන විදියට හදලා මාළු පිරිසිදුව තියාගන්න පුළුවන් විදියට හදලා අපි ඒ කටයුතු කරගෙන යනවා. එතකොට ටෙන්ඩර් දෙන ස්ථානයේම ඒ වෙළඳාම කරන්න ඕන. එතන අපහසුතාවයක් තිබුනොත් තමයි ඊළඟ පියවර ගන්නේ. ටෙන්ඩර් මාරු ලබාදීම පිළිබඳව අපි 2022.10.28 දින මුදල් කමිටුවේ 3.9 තීන්දුව අනුව අංක 380, අලුත්වත්ත, අඹබෝව, අලව්ව ලිපිනයේ පදිංචි ලක්ෂිකා දිල්කි මහත්මිය විසින් අලව්ව බස් නැවතුම්පළ අසල පොදු වෙළඳ සංකීර්ණය අසල එළවලු, එළු මස්, ඌරු මස්, කුකුල් මස්, කඩ අතරින් එක් මාළු කඩයක් ලබාදෙන ලෙස ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත. එම ලිපිය සලකා බැලූ කමිටුව මෙම ස්ථානයේ පවතින මාළු කඩ වෙළඳාමට සුදුසු පරිදි සකස් කර ටෙන්ඩර් ලබාගත් අයට ලබාදීම සුදුසු බවත් දීර්ඝ කාලයක සිට මාළු වෙළඳාම පවත්වාගෙන යන ඔහු බලප්‍රදේශයේ ජීවත් වන අයෙකු බැවින් අලව්ව නගර සීමාව සහ සභා ටෙන්ඩර් ලබාගත් මාලු කඩ පවතින සීමා හැර අනිකුත් ස්ථාන වල වෙළඳාම් කටයුතු වල නිරත වීමට අදාල කොන්දේසි ප්‍රකාරව ජංගම වෙළඳාම් සිදු කිරීමට අවසර ලබා දීම සුදුසු බවට කමිටුව තීරණය කරන ලදී. කමිටු තීරණ අපි මහා සභාවට ඉදිරිපත් කරලා තිබුණේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අපි පසුගිය සභාපතිතුමා ඉන්න කාලෙ අයවැය පිළිබඳ ප්‍රශ්නයක් මතු උනු වෙලාවේ යම් යම් අවස්ථාවල අපි ලේකම්තුමියට දොස් කිව්වා. කිසිම අවස්ථාවක අපි එතුමියට හිත් රිදෙන වචන කතා කරලා නැහැ. පසුගිය සභා වාරයේදී අවාසනාවන්ත සිදුවීමක් වුණා. සමහර අයට කියන්න පුළුවන් සභාපතිතුමිය එක්ක මොකක් හරි ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්.ඒ ප්‍රශ්න මතු වුණා කියලා සභාපතිතුමිය එක්ක තියෙන තරහා ලේකම්තුමිය හෝ වෙනත් නිලධාරියෙකු පිටින් යවලා එතුමියලා අපහසුතාවයට පත්වන විදියට වැඩ කටයුතු කරනවා නම් ඇත්තටම ඒක අශෝභන සිදුවීමක්. කතා කරන්න නුසුදුසු ආකාරයෙන් යම් පුද්ගලයෝ කතා කළා.ලේකම්තුමිය එදා ඉතාමත්ම අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. මම අපේ මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා සභාපතිතුමිය හෝ වෙනත් මන්ත්‍රීවරු අතර ප්‍රශ්න මත ගැටුම් තියෙන්න පුළුවන්.මින් ඉදිරියට ලේකම්තුමිය හෝ නිලධාරින් අපහසුතාවයට පත් වන ආකාරයෙන් වචන ප්‍රකාශ කරලා රාජකාරි වලට බාධා වන ආකාරයෙන් කටයුතු නොකරන ලෙස මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මේ සභාවේ ආරම්භක සභාව හැටියට ගාමිණී ගුණදාස මැතිතුමාගේ කාලයේ ඉඳල මම සභාපතිවරු 07 දෙනෙක් එක්ක වැඩ කළා. ඊට කලින් ඔබතුමිය සභාපති, රත්නායක මැතිතුමා සභාපති, ගාමිනී ගුණදාස මැතිතුමා සභාපති. සභාපතිවරු 10 දෙනෙක් එක්ක වෙළෙඳ සංගමයේ සභාපති ලෙස කටයුතු කරලා විපක්ෂ නායක පුටුව දක්වා වැඩ කළා. අපිට ඒ කාලේ හිටපු සභාපතිවරු උපදෙස් දීලා තිබෙනවා සභාවේ ආදායම් මාර්ග වලට කිසිම වෙලාවක අවහිරයක් ඇති කරන්න එපා. සභාවේ ආදායම් මාර්ග වැඩි දියුණු කරගන්න මාර්ග හොයන්න අපි සභාවක වැඩ කරනවා නම් සභාවේ ක්‍රමවේදයන් සුරක්ෂිත කර ගන්න කියලා. ඒ අනුව තමයි අලව්ව නගරය සම්බන්ධව එදා වෙළෙඳ සංගමයේ සභාපති ලෙස මම තීන්දු තීරණ ගන්න කාලේ යම්කිසි නගරෙයේ ඉදි කිරීමක් සම්බන්ධව ප්‍රශ්නයක් ඇති වූ වෙලාවක මම සභාපතිවරයාට පෞද්ගලිකව කිව්වා කඩේ නගරයට වැටුනොත් තමයි තව වෙලදාමක් වැඩි වෙන්නේ කියලා. එතකොට තමයි පිට ප්‍රදේශවල ජනතාව තරගකාරී වෙළෙඳ පොළෙන් බඩු මිලදී ගැනීමට පැමිණෙන්නේ කියලා. ඒ වගේ අවස්ථාවල ගාමිණී ගුණදාස මැතිතුමා නිලධාරීන් යොදවලා ඉක්මනින්ම ඒවාට තීන්දු තීරණ ලබා දුන්නා. මම මේ සභාවට 2006 එනකොට එවකට ප්‍රධාන කළමණාකරන සහකාර ලෙස කටයුතු කළේ මල්දෙණියේ කරුණා නෝනා. මම එතුමියගෙන් ඇහුවම කිව්වා නගරයේ තරඟකාරි බවක් ඇති වෙන්න නම් මාලු කඩ හතරක්

හදන්න යෝජනාවක් ගේන්න කියලා. ඊට පස්සේ මාකට් එකට මේ අය ගොනු කරලා පුළුවන්කම ලැබුණා කාලයක් තිස්සේ බොහොම අපහසුතාවයෙන් යන ගමන නිවැරදි තැනට ගේන්න. ඒ අතරේ තමයි මගේ මිත්‍ර නලින් මන්ත්‍රීතුමාගේ ගමේ ඔය පදිංචි පුද්ගලයා කාලයක් මාළු වෙලදාම කර ගෙන ගියේ. නලින් මන්ත්‍රීතුමා එළවළු වෙළදාම් කරන කොට අපි තොග කඩේ කරපු කට්ටිය. එදා පොලේ හිටපු වෙළෙන්දන්ගෙන් කොටසක් අද ඇත්තෙන්ම නෑ.විශාල කීර්තිමත් පොළක්අද අපිට අඩුපාඩුවක් වෙලා තිබෙනවා. එහෙම ව්‍යාපාර කටයුතු මෙහෙයවන කාලයේ අපි බැලුවේ තව වෙළෙන්දෙක් වැඩි කරගත්ත හැකිද. ඒ හරහා අපට එන පාරිභෝගිකයෝ ප්‍රමාණය වැඩි කරගත හැකිද කියලා. අපිට ඕන තරගයක්. මීරිගම මාළු ලැල්ල වේවා ගිරිඋල්ල මාළු ලැල්ල වේවා වෙයන්ගොඩ මාලු ලැල්ල වේවා පොල්ගහවෙල මාළු ලැල්ල වේවා තරගයකුයි අපිට ඕනෑ.මාළු ලැලි ටෙන්ඩර් ගත්තට පස්සේ ටෙන්ඩර් ක්‍රියාවලියත් එක්ක මේක යන්න ඕන. අපි යෝජනා කලා06 කණුවේ මම නිදහස් කරපු ඉඩමේ මාළු ලැල්ල ඉදිකරන්න ඕනෑ කියලා මේ සභාවේ. අපේ සභාවේ ඉඩම් නෑ. 06 කණුවේ අපේ සභාවේ තියෙන ඉඩමේ මාළු ලැලි ඉදි කරන්න. මතක තියාගන්න කවුරු මේකේ තනතුරු වලට ආවත් මහජන නියෝජිතයෝ හැටියට ඔබ ඉදියි. මේකෙන් එනවනේ තිරසාර ආදායමක්. ඒකෙන් අඩුම තරමේ එනවනේ රුපියල් 100 ක් හරි. ගණන් හදන්න දවස් 365ට. පෝය දවස් ටික හැරුනම රු. 30,000 ක් වත් එන්න එපැයි. මාළු ලැලි අපිට ගෙවන්නේ රු. 5000 යි. 6000 යි.මේ ආදායම් මාර්ග වැඩි කරන්න ඕනෑ. ඒ වගේම බස් නැවතුම්පළ පිටුපස්සේ තියෙන හරක් මස් කඩය දෛනිකව එයාලා ඒ ව්‍යාපාරය කරනවා. එළු මස්, කුකුල් මස්, ඌරු මස් ඒ ව්‍යාපාරය කරනවා. මේකට අනුගත කරන්න වෙනවා. නැත්නම් අපිට ගිරිඋල්ල වේවා, නාරම්මල වේවා, මීරිගම වේවා වෙළෙන්දා එනවා මහජන නියෝජිතයින්ව පාලනය කරන්න.එතෙන්ට එන්න තියන්න එපා. අපි වෙළෙන්දන්ට පූර්ණ සහයෝගය දෙනවා. මම වෙළෙඳ සංගමයේ සභාපති හැටියට අවුරුදු 10 ක් වෙළෙඳ සංගමයේ හිටියා. මම ඒ කාලෙ පුළුවන් තරම් අපේ සිංහල වෙලෙන්දන් වැඩි කරගන්න ක්‍රමවේදයක් හැදුවා. පෙලක් මුස්ලිම් ව්‍යාපාරිකයෝ ප්‍රමාණය අඩු වෙන්න ඇති මම වෙළෙඳ සංගමයේ සභාපතිවරයා කාලයේ. මගේ සහෝදර මහජන නියෝජිතවරුන්ගෙන් මම ඉල්ලීමක් කරනවා කවුරුහරි පිටින් ව්‍යාපාරිකයෙක් ඇවිල්ලා කොතනක හෝ ලොරියක් නවත්වලා බඩු විකුනන්න අරගෙන සභාවට අභියෝග කරනවා නම් ඒ අභියෝග කරන්නේ සභාපතිට නොවෙයි, ඔබට කියලා මතක තියාගන්න. මහජන නියෝජිතයො වෙච්ච අපි 28 දෙනාට තමා මේ අභියෝග කරන්නේ. මූලාසනයට නෙවෙයි. ඒක වෙන්න ඉඩ තියන්න එපා. සභාවේ ගෞරවයට අපි ඔක්කොම ඉඩ දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, අපේ සභාවේ ලේකම්තුමිය ඉවත්වෙලා යන්න අදහසක් තියෙනවා කියලා ආරංචියක් ලැබිලා තියෙනවා. එතුමියගෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මම ආදරය කරන ගෞරවය කරන නිලධාරීතුමියක්. අවංකව වැඩ කරන නිළධාරිතුමියක්. එතුමියට මේ සභාවෙන් යන්න එපා කියලා ඉල්ලීමක් කරනවා. මමත් මේ සභාවේ ඉන්න අන්තිම කාලේ මේ මන්ත්‍රී ධුරයේ. ආයෙ මම ඡන්දෙ ඉල්ලන්නෙ නෑ. ආයේ මන්ත්‍රීකමක් ලබාගන්න අදහස් කරන්නෙත් නෑ. මම අපි ලේකම්තුමියගෙන් ඉල්ලනවා කාරුණිකව මේ සභාවේ රැඳී සිටින්න කියලා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ජා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, මාධ්‍යවේදී සහෝදරයිනුත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා. අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 4.30ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/11/15
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.